# වාර්ෂික කාර්යසාධන වාර්තාව 2016

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය

## වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවුඩය

2016 වර්ෂය සඳහා දිවයිනේ ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය සඳහා රු. බිලියන 30.28 ආයෝජනයක් වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය විසින් සිදු කරන ලදි.

ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ ඉදිරි සැලසුම් වලට අනුව අමාත්‍යාංශය දියත් කරණ ලද විශාලතම මහා පරිමාණ ව්‍යාපෘතියයි. ඒ සඳහා 2016 වර්ෂයේදී රු. බිලියන 4 ක ආයෝජනයක් අයවැය ඇස්තමේන්තු යටතේ වෙන් වුවද විවිධ හේතූන් නිසා මුළු වසර පුරාම එම ව්‍යාපෘතියෙ හි කටයුතු තාවකාලිකව අත්හිටුවා පැවති බව සඳහන් කල යුතුය. කෙසේ වුවත් වසර අවසාන භාගය වන විට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ගිවිසුම් අත්සන් කරන ලද චීනයේ CAMC ඉංජිනියරින් සමාගම සමඟ සාකච්ඡා කර ව්‍යාපෘතියෙහි පළමු අදියර යටතේ පාරිසරික බලපෑම් අධ්‍යයනය හා භූ විද්‍යාත්මක සමීක්ෂණ ඉටු කර ගැනීම සඳහා ලබා දීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම දක්වා වර්ධනයක් අත්කර ගැනීමට හැකි විය.

තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය සඳහා පාරිසරික බලපෑම් අධ්‍යයනය සඳහා අනුමැතිය ලබා ගැනීමට හැකි වූ අතර වසර අවසානය වන විට ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා අරමුදල් සපයා ගැනීමට විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මඟින් චීනයේ එක්සිම් බැංකුව (EXIM Bank) සමඟ සාකච්ඡා කිරීමට අපේක්ෂිතව පැවතිනි. පහළ මල්වතු ඔය ජලාශ ව්‍යාපෘතිය ද අමාත්‍යාංශය යටතේ ප්‍රතිපාදන වෙන්ව පැවති ඉතා වැදගත් ව්‍යාපෘතියක් වන අතර 2016 වර්ෂය අවසානය වන විට එහි පාරිසරික බලපෑම් අධ්‍යයනය නිම කර චිනයේ CAMC ඉංජිනියරින් ලිමිටඩ් වෙත ව්‍යාපෘතිය ඉංජිනේරු ප්‍රසම්පාදන හා ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලද අතර CAMC වෙතින් මූල්‍ය හා තාක්ෂණ වාර්තා කැඳවන ලදි. එමෙන්ම ගිං නිල්වලා හැරවුම්, තල්පිටිගල හා පහළ මල්වතු ඔය ජලාශ ව්‍යාපෘති සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට අදාළ කටයුතු පසුගිය වර්ෂය අවසාන වන විටත් ආරම්භ ව පැවතිනි.

දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය 2016 වර්ෂය අවසාන වන විට 32% ක සමුච්චිත භෞතික හා මූල්‍ය ප්‍රගතියක් කරා ප්‍රවේශ ව පැවතිනි. එමෙන්ම 2016 වසර තුල ව්‍යාපෘතිය සඳහා ලෝක බැංකුව මඟින් අතිරේක ප්‍රතිපාදනයක් ද අනුමත විය.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් මූලස්ථායී ඉදිකිරීම් අවසන් කරන ලද දැදුරු ඔය, රඹුකක්කන් ඔය ජලාශ වල යටිගං සංවර්ධන වැඩ බොහෝ ලෙස අවසන් කිරීමට 2016 වසරේදී හැකි විය. තවද, මොරාන, කළුගල් ඔය ආදී ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම යටතේ වන ජලාශ ව්‍යාපෘති ද ගුරුගල් ඔය, ගෝනගලතැන්න ආදී මධ්‍යම පරිමාණයේ වාරිමාර්ග යෝජනා ක්‍රම යටතේ වන ජලාශ ව්‍යාපෘති ද සැලකියයුතු ප්‍රගතියක් අත්කර ගැනීමට 2016 වසර තුල හැකියාව ලැබිණි. යාන්ඔය ජලාශ ව්‍යාපෘතිය අනුරාධපුර හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්ක වල ඉඩම් හෙක්ටයාර 5696 කට වාරි ජලය සැපයීම සඳහා මහා පරිමාණ වාරි ව්‍යාපාර යටතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කෙරෙන ප්‍රධානතම ව්‍යාපෘතියකි. චීනයේ CAMC ඉංජිනියරින් සමාගම විසින් 2016 වසරෙහි එම ව්‍යාපෘතියෙහි අපේක්ෂිත ඉලක්ක අභිභවා යමින් මූලස්ථායී ඉදිකිරීම් සිදු කරන ලද බව මෙහිදී විශේෂයෙන් සඳහන් කල යුතුය.

තවද, වාරිමාර්ග ව්‍යාපාර කළමනාකරණයේදී දැනට පවතින ගැටළු රාශියකට පිළියම් සෙවීමේ අරමුණින්, යල් පැන ගිය වාරිමාර්ග ආඥා පනත යාවත්කාලීන කිරීමට අමාත්‍යාංශය 2016 වසරේදී ආරම්භ කර බොහෝ දුරට අවසන් කිරීමට හැකිවීම විශේෂිත කරුණකි. ජල සම්පත් සංවර්ධන හා වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී සිදුවන පාරසරික බලපෑම් අධ්‍යයන පහසු කරවීම සඳහා උපායමාර්ගික පාරිසරික අධ්‍යයනය, කැළණි ගං වතුර පාලනය, ගංගාධාර කළමනාකරණය හා සංරක්ෂණය යන විශේෂ අධ්‍යයනයන් රාශියක් ආරම්භ කිරීමත් ඒවායේ සාර්ථක ප්‍රගතියක් අත්කර ගැනීමටත් 2016 වර්ෂයේදී අමාත්‍යාංශයට හැකි විය. එමෙන්ම 2016 වර්ෂය තුලදී 2017 අයවැය ඇස්තමේන්තුව සඳහා ජල සම්පත් සංවර්ධන නව ව්‍යාපෘති රැසක්ම ඇතුලත් කර ගැනීමට අදාල ශක්‍යතා අධ්‍යයන ව්‍යාපෘති වාර්තා සකස් කිරීම්, අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමට හැකි වීම ද 2016 වසරේ දී අප ලද ජයග්‍රහණයකි.

ජල සම්පත් මණ්ඩලය මඟින් ද භූගත ජල සම්පත් සංවර්ධනය හා මෙහෙයුම් වැඩසටහන් හා අදාල අධ්‍යයන 09 ක් එම ආයතනය සඳහා 2016 වසරේදී වෙන් වූ රු.මිලියන 35 ක ප්‍රතිපාදන යටතේ සිදු කරන ලද අතර 100% කට ආසන්න මූල්‍ය ප්‍රගතියක් අත් කර ගැනීම පැසසිය යුතුය.

වාරිමාර්ග කළමනාකරණ අංශය මඟින් ක්‍රියාවට නැංවූ මහා වාරිමාර්ග ව්‍යාපාර වල ඒකාබද්ධ වාරිමාර්ග කළමනාකරණ වැඩසටහන යටතේ ගොවි සංවිධාන ශක්තිමත් කිරීම, ප්‍රජාව සවිබල ගැන්වීම හා ජල කළමනාකරණ වැඩිදියුණු කිරීම යටතේ ගොවීන් දැනුවත් කිරීම, පුහුණු වැඩසටහන් නිෂ්පාදනය හා නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදි.

2016 වර්ෂයේ දී අමාත්‍යාංශය විසින් සැළසුම් කල පරිදි සමහර විශාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම හා වසර අවසන් මාසයයන් හි දී අක්මුදල් නොලැබීම් ආදී ගැටළු නිසා සමස්ථයක් වශයෙන් ගත් කල අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රගතියෙහි යම් අඩුවීමක් ඇති බව පෙනී යයි. එසේ වුවද අමාත්‍යාංශය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ජල සම්පත් මණ්ඩලය හා වාරිමාර්ග කළමනාකරණ අංශය සිය කාර්ය මණ්ඩල හිඟතාවයන් යටතේ වුවද එම හිඟයන් සපුරා ගැනීමට ඉදිරි කටයුතු කරමින් සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ගන්නා ලද ප්‍රයත්නය මා අගය කරන අතර, ඒ සඳහා ඇපකැප වී ක්‍රියාකල සියළු නිලධාරීන්ට මාගේ ස්තූතිය පිරිනමමි.

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍ය ගරු විජිත් විජයමුණි සොයිසා මැතිතුමා විසින් නව ව්‍යාපෘතීන් සඳහා මෙන්ම ක්‍රියාත්මක ව්‍යාපෘතින් හි ඉඩම් ගැටළු විසඳා ගැනීමට අදාළව ද අමාත්‍ය මණ්ඩල සංදේශ අනුමැතිය ලබා ගැනීමේ දී නායකත්වය දෙමින් සිදුකරන ලද මහපෙන්වීම පිළිබඳ මාගේ ගෞරවනීය ස්තූතිය පිරිනමන අතර පොළොන්නනරුව දිස්ත්‍රික්කයේ වාරිමාර්ග ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙහිලා වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ රාජ්‍ය අමාත්‍ය ගරු වසන්ත සේනානායක මැතිතුමා දක්වන ලද මහපෙන්වීම හා අදාල නොයෙකුත් ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා දක්වන ලද දායකත්වය ද වෙසෙසින් සිහිපත් කරමි.

**ඉංජි. ආර්.එම්.ඩබ්. රත්නායක**

ලේකම්, වාරිමාර්ග හා ජල සම්පත් කලමනාකරණ අමාත්‍යාංශය

# පටුන


| | | පිටුව |
|---|---|---|
| 1. | දැක්ම | 01 |
| 2. | මෙහෙවර | 01 |
| 3. | අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් | 01 |
| 4. | අමාත්‍යාංශය ශීර්ෂ 198 හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ශීර්ෂ 282 යටතේ වියදම් සම්බන්ධ පුරෝකථන අගයට එරෙහි සත්‍ය අගය | 01 |
| 5. | විශේෂ ව්‍යාපෘති හා වැඩසටහන් කාර්යසාධනය | |
| අ. | දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (CRIP) | 19 |
| ආ. | ගිං - නිල්වලා ජලාශ හැරවුම් ව්‍යාපෘතිය | 29 |
| ඉ. | පහළ මල්වතුඔය ජලාශ ව්‍යාපෘතිය | 29 |
| ඊ. | තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය | 30 |
| 6. | ක්‍රියාත්මක කරනු ලබන ආයතන යටතේ ව්‍යාපෘති/වැඩසටහන් වල කාර්යසාධනය | |
| අ. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 31 |
| ආ. | වාරිමාර්ග කළමනාකරණ අංශය | 63 |
| ඉ. | ජල සම්පත් මණ්ඩලය | 85 |

# වාර්ෂික කාර්යසාධන වාර්තාව 2016

## වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය

### 1. දැක්ම

තිරසාර ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය තුලින් සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීම

### 2. මෙහෙවර

ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය තුලින් බහුවිධ අවශ්‍යතා ඉටු කරමින් ප්‍රජාවගේ හා පරිසරයේ යහපැවත්ම සැලසීම

### 3. අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන්

1. අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්හි විෂයන්ට අදාල ප්‍රතිපත්ති සම්පාදනය, ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරිම ,සමාලෝචනය හා ඇගයිම.
2. ජල සම්පත් හා වාරි පද්ධති සංවර්ධනය
3. මෙහෙයුම හා නඩත්තුව ද ඇතුලු ව වාරිමාර්ග පද්ධති හා ගංගා ද්‍රෝණි කළමනාකරණය
4. ජල මූලාශ්‍ර හා වාරිමාර්ග පද්ධති සංරක්ෂණය හා ආරක්ෂා කිරිම.
5. බහුවිධ අවශ්‍යතා සඳහා අවශ්‍ය ජල ප්‍රමාණයන් වෙන් කිරිම සඳහා තාක්ෂණික මගපෙන්වීම හා නිර්ණායක සකස් කිරිම.
6. ජල මූලාශ්‍ර හා ආශ්‍රිත පරිසර දූෂණය වැලැක්විමට හා ජලයේ ගුණාත්මක බව තහවුරු කිරිම සඳහා උපායමාර්ගික වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම.
7. ගොඩබිමට කරදිය ගලා ඒම වැලැක්විමේ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම.
8. අපවහනය සහ ගංවතුර ආරක්ෂණය.
9. ඉංජිනේරුමය උපදේශන සේවා ලබා දීම.
10. වාරිමාර්ග පද්ධති වල ආයතනික සංවර්ධනය හා ඵලදායීතාවය ප්‍රවර්ධනය කිරීම.
11. භූගත ජලය සංවර්ධනය අධීක්ෂණය හා කළමනාකරණය.
12. වැසි ජල සංරක්ෂණය, වැසි ජලය රැස්කිරීම ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.

### 4. අමාත්‍යාංශය ශීර්ෂ 198 හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ශීර්ෂ 282 යටතේ වියදම් සම්බන්ධ පුරෝකථන අගයට එරෙහි සත්‍ය අගය

| | | | |
|---|---|---|---|
| ආකෘතිය | A | විසර්ජන ගිණුම | ශීර්ෂ 198 |
| ආකෘතිය | B | ආදායම් ගිණුම | ශීර්ෂ 282 |
| ආකෘතිය | C | අත්තිකාරම් ගිණුම | |

| CATEGORY : APROPRIATION ACCOUNT | Head 198 | | | | | | | | Form - A | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Financial Performance (Rs.In '000) | | | | | Physical Performance | | | | | | |
| Description | Current Year 2016 | | Previous Year Actual 2015 | Variation Over | | Output (Service/Goods) | | Current Year's Output | | Previous Years output | Variation Over | |
| | Budgeted | Actual | | Budget | Previous Year Actual | Type/ Class | Measure | Targeted | Actual | | Targeted | Previous Years Actual |
| **Programme Title and No.** | | | | | | | | | | | | |
| Operational Activities 01 | | | | | | | | | | | | |
| **Project Title and No:** | | | | | | | | | | | | |
| Minister office 01 | | | | | | | | | | | | |
| Expenditure | | | | | | | | | | | | |
| Recurrent Expenditure | | | | | | | | | | | | |
| Personnel Emoluments | 11,190 | 10,917.18 | 8,264.47 | 97% | 100% | | | | | | | |
| Other Recurrent | 14,835.29 | 12,882.13 | 3,914.25 | 86% | 67% | | | | | | | |
| **Project Title and No:** | | | | | | | | | | | | |
| Administration & Establishment Services 02 | | | | | | | | | | | | |
| Expenditure | | | | | | | | | | | | |
| Recurrent Expenditure | | | | | | | | | | | | |
| Personnel Emoluments | 6,050.75 | 45,386.27 | 23,782.10 | 98% | 99% | | | | | | | |
| Other Recurrent | 42,608.46 | 30,904.49 | 20,404.88 | 72% | 84% | | | | | | | |
| **Project Title and No:** | | | | | | | | | | | | |
| State Minister's Office 11 | | | | | | | | | | | | |
| Expenditure | | | | | | | | | | | | |
| Recurrent Expenditure | | | | | | | | | | | | |
| Personnel Emoluments | 13,532 | 12,750.16 | 930.99 | 95% | 26% | | | | | | | |
| Other Recurrent | 16,193.50 | 13,570.46 | 1,278.34 | 83% | 30% | | | | | | | |
| | | | | | | | | | | | | |
| **Total** | **144,410** | **126,410.69** | **58,575.05** | | | | | | | | | |

**CATEGORY : APROPRIATION ACCOUNT  Head 198  Form - A**

| | Financial Performance (Rs.In '000) | | | | | Physical Performance | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **Description** | **Current Year 2015** | | **Previous Year Actual 2014** | **Variation Over** | | **Output (Service/Goods)** | | **Current Year's Output** | | **Previous Years output** | **Variation Over** | |
| | **Budgeted** | **Actual** | | **Budget** | **Previous Year Actual** | **Type/ Class** | **Measure** | **Targeted** | **Actual** | | **Targeted** | **Previous Years Actual** |
| **Programme Title and No.** | | | | | | | | | | | | |
| Development Activities 02 | | | | | | | | | | | | |
| **Project Title and No:** | | | | | | | | | | | | |
| Inter provincial irrigation Development Programes 03 | | | | | | | | | | | | |
| Expenditure | | | | | | | | | | | | |
| Recurrent Expenditure | | | | | | | | | | | | |
| Personnel Emoluments | 115,900 | 111,218.55 | 103,137.53 | 96% | 98% | | | | | | | |
| Other Recurrent | 19,275 | 15,738.09 | 12,741.32 | 82% | 73% | | | | | | | |
| **Project Title and No:** | | | | | | | | | | | | |
| Irrigation Institutions & Development Programmes 04 | | | | | | | | | | | | |
| Expenditure | | | | | | | | | | | | |
| Recurrent Expenditure | | | | | | | | | | | | |
| Personnel Emoluments | | | | | | | | | | | | |
| Other Recurrent | 155,000 | 155,000 | 141,000 | 100% | 100% | | | | | | | |
| | **290,175** | **281,956.64** | **256,878.86** | | | | | | | | | |

| CATEGORY : APROPRIATION ACCOUNT 198 | | | | | | | | | | | | | Form - A |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Financial Performance (Rs.In '000) | | | | | Physical Performance | | | | | | | |
| Description | Current Year 2016 | | Previous Year Actual 2015 | Variation Over | | Output (Service/Goods) | | Current Year's Output | | Previous Years output | Variation Over | | |
| | Budgeted | Actual | | Budget | Previous Year Actual | Type/ Class | Measure | Targeted | Actual | | Targeted | Previous Years Actual | |
| **Capital Expenditure** | | | | | | | | | | | | | |
| Operational Activities 01 | | | | | | | | | | | | | |
| Minister office 01 | 46,350 | 3,040.78 | 950 | 6.5% | 100% | | | | | | | | |
| Administration &Establishment Services 02 | 108,500 | 81,751.59 | 89,976.94 | 75% | 91% | | | | | | | | |
| State Ministers Office 11 | 46,500 | 3,349.03 | 909.14 | 7.2% | 95.6% | | | | | | | | |
| Development Activities 02 | | | | | | | | | | | | | |
| Inter provincial irrigation Development Programes 03 | 13,032,275 | 5,062,473.99 | 8,704,045.02 | 38% | 129% | | | | | | | | |
| Development programme of irrigation institutions 04 | 35,000 | 34,002.68 | 28,600 | 97% | 73% | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| **Total Expenditure** | **13,268,625** | **5,184,618.07** | **8,824,481.10** | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |

**CATEGORY : APPROPRIATION ACCOUNT** — **FORM : A**

| DESCRIPTION | Financial Performance ( Rs, in'000') | | | | | Physical Performance | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Current Year | | Previous Year Actual 2015 | Variations Over | | Output Service/Goods | | Current Years Output | | Previous Year Output | Variations over | |
| | Budgeted | Actual | | Budgeted | Previous Year Actual | Type/ Class | Measure | Targeted | Actual | | Targeted | Previous Year Actual |
| **Programme 01- Operational Activities** | | | | | | | | | | | | |
| **Project 01 – Minister's Office** | | | | | | | | | | | | |
| Expenditure | | | | | | | | | | | | |
| Recurrent Expenditure | | | | | | | | | | | | |
| Personal Emoluments | 11,190 | 10,917.18 | 8,264.47 | - | - | | | | | | | |
| Other Recurrent | 14,835.29 | 12,882.13 | 3,914.25 | - | - | | | | | | | |
| **Total** | 26,025.29 | 23,799.31 | 12,178.72 | - | - | | | | | | | |
| Capital Expenditure | | | | | | | | | | | | |
| 2001 | 500 | 253.51 | 100 | | | (a) | | | | | | |
| 2002 | 200 | 156.75 | 50 | | | (b) | | | | | | |
| 2003 | 1,150 | 1,150 | 400 | | | (c) | | | | | | |
| 2101 | 43,000 | 0 | 0 | | | (d) | | | | | | |
| 2102 | 1,000 | 980.52 | 200 | | | (e) | | | | | | |
| 2103 | 500 | 500 | 200 | | | (f) | | | | | | |
| **Total** | 46,350 | 3,040.78 | 950 | | | | | | | | | |

(a)Rehabilitation & Improvements of Building & structures
(b)Rehabilitation & Improvements of Plant Machinery & Equipment
(d)Acquisition of Furniture & office equipment
(e)Acquisition of Building & structures

| CATEGORY : APPROPRIATION ACCOUNT | | | | | | FORM : A | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| DESCRIPTION | Financial Performance ( Rs, in'000') | | | | | Physical Performance | | | | | | |
| | Current Year | | Previous Year Actual 2015 | Variations Over | | Output Service/Goods | | Current Year Output | | Previous Year Output | Variations over | |
| | Budgeted | Actual | | Budgeted | Previous Year Actual | Type/ Class | Measure | Targeted | Actual | | Targeted | Previous Year's Actual |
| **Programme 02- Development Activities** **Project 02 - Administration & Institutional Service** | | | | | | | | | | | | |
| Expenditure | | | | | | | | | | | | |
| Recurrent Expenditure | | | | | | | | | | | | |
| Personal Emoluments | 46,050.75 | 45,386.27 | 23,782.10 | | | | | | | | | |
| Other Recurrent | 42,608.46 | 30,904.50 | 20,404.88 | | | | | | | | | |
| **Total** | 88,659.21 | 76,290.77 | 44,186.98 | | | | | | | | | |
| Capital Expenditure | | | | | | | | | | | | |
| 2001 | 5,000 | 1,000.06 | 1,755.33 | | | (a) | | | | | | |
| 2002 | 250 | 250 | 74.92 | | | (b) | | | | | | |
| 2003 | 1,000 | 440.03 | 1,439.45 | | | (c) | | | | | | |
| | | | | | | (d) | | | | | | |
| 2102 | 3,900 | 1,911.09 | 1,180.37 | | | (e) | | | | | | |
| 2103 | 350 | 350 | 320 | | | (f) | | | | | | |
| 2401 | 3,000 | 3,000 | 165 | | | (g) | | | | | | |
| 2401-1 | 95,000 | 74,800.70 | 85,041.79 | | | | | | | | | |
| **Total Expenditure** | 108,500 | 81,751.58 | 89,976.94 | | | | | | | | | |

(a) Rehabilitation & Improvements of Building & Structures
(b) Rep. to plant machinery & equipment
(c) Repairs to vehicles
(e) Acquisition of Furniture & office equipment
(f) Acquisition of plant machinery & equipment
g) Staff Training

**CATEGORY : APPROPRIATION ACCOUNT** **FORM : A**

| DESCRIPTION | Financial Performance ( Rs, in'000') | | | | | Physical Performance | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Current Year | | Previous Year Actual 2015 | Variations Over | | Output Service/Goods | | Current Years Output | | Previous Year Output | Variations over | |
| | Budgeted | Actual | | Budgeted | Previous Year Actual | Type/ Class | Measure | Targeted | Actual | | Targeted | Previous Year's Actual |
| **Programme 02- Deveopment Activities** | | | | | | | | | | | | |
| **Project 03 – Inter-provincial Irrigation development Programme** | | | | | | | | | | | | |
| Expenditure | | | | | | | | | | | | |
| Recurrent Expenditure | | | | | | | | | | | | |
| Personel Emoluments | 115,900 | 111,218.55 | 103,137.53 | | | | | | | | | |
| Other Recurrent | 19,275 | 15,738.09 | 12,741.32 | | | | | | | | | |
| **Total** | 135,175 | 126,956.64 | 115,878.86 | | | | | | | | | |
| Capital Expenditure | | | | | | | | | | | | |
| 2001 | | | | | | | | | | | | |
| 2002 | | | | | | | | | | | | |
| 2003 | | | | | | | | | | | | |
| 2102 | | | | | | | | | | | | |
| 2104 | | | | | | | | | | | | |
| 2105 | | | | | | | | | | | | |
| 2401 | | | | | | | | | | | | |
| 2502-14-(11) | | | | | | | | | | | | |
| 2502-16-(12) | | | | | | | | | | | | |
| 2502-16-(17) | | | | | | | | | | | | |
| 2502-18-(11) | | | | | | | | | | | | |
| 2105-8-(11) | | | | | | | | | | | | |
| 2502-11-(11) | | | | | | | | | | | | |
| 2502-8-(11) | | | | | | | | | | | | |
| 2502-9-(11) | | | | | | | | | | | | |
| **Total Expenditure** | 13,032,275 | 5,062,474 | 8,704,045 | | | | | | | | | |

| **CATEGORY : APPROPRIATION ACCOUNT** | | | | | | | | **FORM : A** | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **DESCRIPTION** | **Financial Performance ( Rs, in'000')** | | | | | **Physical Performance** | | | | | | |
| | **Current Year** | | **Previous Year Actual 2015** | **Variations Over** | | **Output Service/Goods** | | **Current Years Output** | | **Previous Year Output** | **Variations over** | |
| | **Budgeted** | **Actual** | | **Budgeted** | **Previous Year Actual** | **Type/ Class** | **Measure** | **Targeted** | **Actual** | | **Targeted** | **Previous Year's Actual** |
| **Programme 02- Deveopment Activities** | | | | | | | | | | | | |
| **Project 04 – state *Institutions*** | | | | | | | | | | | | |
| Expenditure | | | | | | | | | | | | |
| Recurrent Expenditure | | | | | | | | | | | | |
| Personel Emoluments | 155,000 | 155,000 | 141,000 | | | | | | | | | |
| Other Recurrent | | | | | | | | | | | | |
| **Total** | 155,000 | 155,000 | 141,000 | | | | | | | | | |
| Capital Expenditure | | | | | | | | | | | | |
| 2105 | 35,000 | 34,002.68 | 28,600 | | | | | | | | | |
| **Total Expenditure** | 35,000 | 34,002.68 | 28,600 | | | | | | | | | |

| CATEGORY : APPROPRIATION ACCOUNT | | | | | | FORM : A | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| DESCRIPTION | Financial Performance ( Rs, in'000') | | | | | Physical Performance | | | | | | |
| | Current Year | | Previous Year Actual 2015 | Variations Over | | Output Service/Goods | | Current Years Output | | Previous Year Output | Variations over | |
| | Budgeted | Actual | | Budgeted | Previous Year Actual | Type/ Class | Measure | Targeted | Actual | | Targeted | Previous Year's Actual |
| **Programme 02- Deveopment Activities** | | | | | | | | | | | | |
| **Project 04 – state *Institutions*** | | | | | | | | | | | | |
| Expenditure | | | | | | | | | | | | |
| Recurrent Expenditure | | | | | | | | | | | | |
| Personel Emoluments | 155,000 | 155,000 | 141,000 | | | | | | | | | |
| Other Recurrent | | | | | | | | | | | | |
| **Total** | 155,000 | 155,000 | 141,000 | | | | | | | | | |
| Capital Expenditure | | | | | | | | | | | | |
| 2105 | 35,000 | 34,002.68 | 28,600 | | | | | | | | | |
| **Total Expenditure** | 35,000 | 34,002.68 | 28,600 | | | | | | | | | |

| CATEGORY : APPROPRIATION ACCOUNT | | | | | | | | | | | | | FORM : A |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| DESCRIPTION | Financial Performance ( Rs, in'000') | | | | | Physical Performance | | | | | | | |
| | Current Year | | Previous Year Actual 2015 | Variations Over | | Output Service/Goods | | Current Years Output | | Previous Year Output | Variations over | | |
| | Budgeted | Actual | | Budgeted | Previous Year Actual | Type/ Class | Measure | Targeted | Actual | | Targeted | Previous Year's Actual | |
| **Programme 01- Operation Activities** **Project 11 – State Minister's Office** | | | | | | | | | | | | | |
| Expenditure | | | | | | | | | | | | | |
| Recurrent Expenditure | | | | | | | | | | | | | |
| Personel Emoluments | 13,532 | 12,750.16 | 930.99 | | | | | | | | | | |
| Other Recurrent | 16,193.50 | 13,570.46 | 1,278.34 | | | | | | | | | | |
| **Total** | 29,725.50 | 26,320.62 | 2,209.33 | | | | | | | | | | |
| Capital Expenditure | | | | | | | | | | | | | |
| 2001 | 500 | 500 | 100 | | | | | | | | | | |
| 2002 | 200 | 200 | 9,347 | | | | | | | | | | |
| 2003 | 1,300 | 1,149.03 | 400 | | | | | | | | | | |
| 2101 | 43,000 | 43,000 | 0 | | | | | | | | | | |
| 2102 | 1,000 | 1,000 | 199.8 | | | | | | | | | | |
| 2103 | 500 | 500 | 200 | | | | | | | | | | |
| **Total Expenditure** | 46,500 | 46,349.03 | 909.147 | | | | | | | | | | |

**CATEGORY : REVENUE ACCOUNTS HEAD 198 Form - B**

| Description | Financial Performance (Rs.In '000) | | | | | | | Physical Performance | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Arears of Revenue As At 01.01.2014 | Current Year | | Previous Year Actual 2015 | Variation Over | | Arears of Revenue As At 01.01.200* | Output (Service /Goods) | | Current Year's Output | | Previous Years output | Variation Over | |
| | | Budgeted | Actual | | Budget | Previous Year Actual | | Type/ Class | Measure | Targeted | Actual | | Targeted | Previous Years Actual |
| Revenue Codes | | | | | | | No | | | | | | | |
| 20.02.01.01 | | - | 1,824,808.40 | 43,656.63 | | | | | | | | | | |
| 20.02.02.99 | | - | 1,023,464.44 | 73,384.70 | | | | | | | | | | |
| 20.03.99.00 | | - | 8,959,425.14 | 15,247 | | | | | | | | | | |
| 2003.04.00 | | - | - | - | | | | | | | | | | |
| 2004.01.00 | | - | 4,405,655.06 | 314,829.87 | | | | | | | | | | |
| Total Revenue | | - | **16,213,353.04** | **417,118.20** | | | | | | | | | | |

| CATEGORY : ADVANCE ACCOUNTS HEAD 198 | | | | | | | | | | Form - C | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Description | Financial Performance (Rs.In '000) | | | | | Physical Performance | | | | | | |
| | Current Year 2015 | | Previous Year Actual 2015 | Variation Over | | Output (Service/Goods) | | Current Year's Output | | Previous Years output | Variation Over | |
| | Prescribed | Actual | | Prescribed | Previous Year Actual | Type/Class | Measure | Targeted | Actual | | Targeted | Previous Years Actual |
| Type: | | | | | | | | | | | | |
| **Account Title & No:** | | | | | | | | | | | | |
| Advances to Public Officers | | | | | | | | | | | | |
| 198011 | | | | | | | | | | | | |
| Maximum Expenditure Limit | 8,500,000 | 8,474,678.35 | Not Relevant | | | | | | | | | |
| Minimum Receipt Limit | 6,000,000 | 6,964,587.19 | | | | | | | | | | |
| Maximum Debit Limit | 31,000,000 | 24,746,115.74 | | | | | | | | | | |
| Maximum Liability | | | | | | | | | | | | |
| Financial Results | | | | | | | | | | | | |

**CATEGORY : APPROPRIATION ACCOUNT Head 282 FORM : A**

| DESCRIPTION | Financial Performance ( Rs, in'000') | | | | | Physical Performance | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Current Year | | Previous Year Actual | Variations Over | | Output Service/Goods | | Current Years Output | | Previous Year Output | Variations over | |
| | Budgeted | Actual | | Budgeted | Previous Year Actual | Type/ Class | Measure | Targeted | Actual | | Targeted | Previous Year Actual |
| **Programme 01- Operational Activities** | | | | | | | | | | | | |
| **Project 01 - Administration & Establishment Services** | | | | | | | | | | | | |
| Expenditure | | | | | | | | | | | | |
| Recurrent Expenditure | | | | | | | | | | | | |
| Personal Emoluments | 575,454 | 528,437 | 522,173 | 39,354 | 6,264 | | % | 100 | 91.83 | 97.40 | -8.17 | -5.57 |
| Other Recurrent | 97,505 | 94,029 | 83,544 | 12,535 | 10,485 | | % | 100 | 96.44 | 98.32 | -3.56 | -1.89 |
| **Total** | 672,959 | 622,466 | 605,717 | 51,889 | 16,749 | | | | | | | |
| Capital Expenditure | | | | | | | | | | | | |
| 2001 | 35,717 | 29,314 | 30,799 | 4,217 | -1,486 | (a) | % | 100 | 82.07 | 97.77 | -17.93 | -15.70 |
| 2002 | 817 | 817 | 256 | 167 | 561 | (b) | % | 100 | 100.00 | 39.38 | 0.00 | 60.62 |
| 2003 | 4,900 | 4,857 | 4,690 | 200 | 167 | (c) | % | 100 | 99.12 | 99.79 | -0.88 | -0.66 |
| 2102 | 4,886 | 4,886 | 4,342 | 386 | 544 | (d) | % | 100 | 100.00 | 96.49 | 0.00 | 3.51 |
| 2104 | 0 | 0 | 0 | 0 | 0 | (e) | % | 0 | 0 | 0 | 0 | 0 |
| 2401 | 2,497 | 2,410 | 2,338 | -3 | 72 | (f) | % | 100 | 96.52 | 93.52 | -3.48 | 3.00 |
| **Total** | 48,817 | 42,284 | 42,425 | 4,967 | -142 | | | | | | | |

a)Rehabilitation & Improvements of Building & structures

(b)Rehabilitation & Improvements of Plant Machinery & Equipment

(c)Rehabilitation & Improvements of Vehicles

(d)Acquisition of Furniture & office equipment

(e)Acquisition of Building & structures

(f)Training & capacity Building

| CATEGORY : APPROPRIATION ACCOUNT | Head 282 | | | | | | | | | | | FORM : A | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| DESCRIPTION | Financial Performance ( Rs, in'000') | | | | | Physical Performance | | | | | | | |
| | Current Year | | Previous Year Actual | Variations Over | | Output Service/Goods | | Current Year Output | | Previous Year Output | Variations over | |
| | Budgeted | Actual | | Budgeted | Previous Year Actual | Type/ Class | Measure | Targeted | Actual | | Targeted | Previous Year's Actual |
| **Programme 02- Development Activities** | | | | | | | | | | | | |
| Project 02 - **Administration & Maintenance of Irrigation Schemes** | | | | | | | | | | | | |
| Expenditure | | | | | | | | | | | | |
| Recurrent Expenditure | | | | | | | | | | | | |
| Personal Emoluments | 2,249,021 | 2,160,885 | 2,124,164 | 114,047 | 36,721 | | | 100 | 96.08 | 99.49 | -3.92 | -3.41 |
| Other Recurrent | 90,370 | 85,766 | 91,231 | -2,460 | -5,465 | | | 100 | 94.90 | 98.28 | -5.10 | -3.37 |
| **Total** | 2,339,391 | 2,246,651 | 2,215,395 | 111,588 | 31,255 | | | | | | | |
| Capital Expenditure | | | | | | | | | | | | |
| 2001 | 1,690,000 | 1,590,756 | 1,239,954 | 415,000 | 350,802 | (a) | % | 100 | 94.13 | 97.25 | -5.87 | -3.12 |
| 2002 | 80,000 | 75,537 | 58,595 | 20,000 | 16,943 | (b) | % | 100 | 94.42 | 97.66 | -5.58 | -3.24 |
| 2003 | 42,000 | 39,153 | 35,512 | 6,488 | 3,641 | (c) | % | 100 | 93.22 | 100.00 | -6.78 | -6.78 |
| 2101 | 0 | 0 | 0 | 0 | 0 | (d) | % | 0 | 0 | 0 | 0.00 | 0 |
| 2102 | 18,004 | 18,004 | 15,694 | 4 | 2,309 | (e) | % | 100 | 100.00 | 87.19 | 0.00 | 12.81 |
| 2103 | 240,000 | 109,348 | 179,565 | 10,000 | -70,217 | (f) | % | 100 | 45.56 | 78.07 | -54.44 | -32.51 |
| 2104 | 50,000 | 38,841 | 31,558 | 18,000 | 7,284 | (g) | % | 100 | 77.68 | 98.62 | -22.32 | -20.94 |
| 2502 | 185,496 | 158,415 | 115,722 | 61,996 | 42,693 | (h) | % | 100 | 85.40 | 93.70 | -14.60 | -8.30 |
| **Total Expenditure** | 2,305,500 | 2,030,055 | 1,676,600 | 531,488 | 353,455 | | | | | | | |

(a) Rehabilitation & Improvements of Building & Structures
(b) Rep. to plant machinery & equipment
(c) Repairs to vehicles
(d) Acquisition of vehicles
(e) Acquisition of Furniture & office equipment
(f) Acquisition of plant machinery & equipment
(g) Acquisition of Building & structure
(h) Other capital expenditure

| CATEGORY : APPROPRIATION ACCOUNT | Head 282 | | | | | | | | | | FORM : A | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| DESCRIPTION | Financial Performance ( Rs, in'000') | | | | | Physical Performance | | | | | | |
| | Current Year | | Previous Year Actual | Variations Over | | Output Service/Goods | | Current Years Output | | Previous Year Output | Variations over | |
| | Budgeted | Actual | | Budgeted | Previous Year Actual | Type/ Class | Measure | Targeted | Actual | | Targeted | Previous Year's Actual |
| **Programme 02- Deveopment Activities** | | | | | | | | | | | | |
| **Project 03 - Major Irrigation schemes** | | | | | | | | | | | | |
| Expenditure | | | | | | | | | | | | |
| Recurrent Expenditure | | | | | | | | | | | | |
| Personel Emoluments | | | | | | | | | | | | |
| Other Recurrent | | | | | | | | | | | | |
| **Total** | | | | | | | | | | | | |
| Capital Expenditure | | | | | | | | | | | | |
| 2105 | 10,833,770 | 8,020,417 | 8,448,770 | 2,314,289 | -428,353 | (a) | % | 100 | 74.03 | 99.17 | -25.97 | -25.14 |
| **Total Expenditure** | 10,833,770 | 8,020,417 | 8,448,770 | 2,314,289 | -428,353 | | | | | | | |

**(a) Major Irrigation Scheme**

| CATEGORY : APPROPRIATION ACCOUNT | Head 282 | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | FORM : A | | |
| DESCRIPTION | Financial Performance ( Rs, in'000') | | | | | Physical Performance | | | | | | | |
| | Current Year | | Previous Year Actual | Variations Over | | Output Service/Goods | | Current Years Output | | Previous Year Output | Variations over | |
| | Budgeted | Actual | | Budgeted | Previous Year Actual | Type/ Class | Measure | Targeted | Actual | | Targeted | Previous Year's Actual |
| **Programme 02- Deveopment Activities** | | | | | | | | | | | | |
| **Project 04 - Medium Irrigation schemes** | | | | | | | | | | | | |
| Expenditure | | | | | | | | | | | | |
| Recurrent Expenditure | | | | | | | | | | | | |
| Personel Emoluments | - | - | - | - | - | | | | | | | |
| Other Recurrent | - | - | - | - | - | | | | | | | |
| **Total** | - | - | - | - | - | | | | | | | |
| Capital Expenditure | | | | | | | | | | | | |
| 2105 | 389,060 | 260,973 | 209,258 | 178,053 | 51,715 | (a) | % | 100 | 67.08 | 99.17 | -32.92 | -32.09 |
| **Total Expenditure** | 389,060 | 260,973 | 209,258 | 178,053 | 51,715 | | | | | | | |

**(a) Medium Irrigation Scheme**

| CATEGORY : ADVANCE ACCOUNT | Head 282 | | | | | FORM : C | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| DESCRIPTION : Public Officer's Advance Account | Financial Performance ( Rs, in'000') | | | | | Physical Performance | | | | | | |
| | Current Year | | Previous Year Actual | Variations Over | | Output Service/Goods | | Current Years Output | | Previous Year Out put Actual | Variations over | |
| | Prescrible | Actual | | Prescrible | Previous Year Actual | Type/ Class | Measure | Targeted | Actual | | Targeted | Previous Year Actual |
| **Type** | | | | | | | | | | | | |
| **Account Tile & No. 282011** | | | | | | | | | | | | |
| Maximum expenditure Limit | 148,000 | 147,804 | 137,367 | 196 | 10,437 | | % | 100 | 99.87 | 95.54 | -0.13 | 4 |
| Minimum Receipt Limit | 105,000 | 138,388 | 136,841 | -33,388 | 1,547 | | % | 100 | 131.80 | 118.99 | 31.80 | 12.81 |
| Maximum Debit Limit | 500,000 | 366,275 | 359,650 | 133,725 | 6,625 | | % | 100 | 73.26 | 71.93 | -26.75 | 1.33 |
| Maximum Liability | - | - | - | - | - | | | - | - | - | - | - |
| Financial results | - | - | - | - | - | | | - | - | - | - | - |

**CATEGORY : REVENUE ACCOUNT** **Head 282** **FORM : B**

| DESCRIPTION : Public Officer's Advance Account | Financial Performance ( Rs, in'000') | | | | | | | Physical Performance | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Arrears of Revenue as at 01-01-2014 | Current Year | | Previous Year Actual | Variations Over | | Arrears of Revenue as at 31-12-2014 | Output Service/Goods | | Current Years Output | | Previous Year Out put Actual | Variations over | |
| | | Budgeted | Actual | | Budgeted | Previous Year Actual | | Type/ Class | Measure | Targeted | Actual | | Targeted | Previous Year Actual |
| **Revenue codes** | | | | | | | | | | | | | | |
| **20.02.01.01** Rent on Government Buildings | | 10,680 | 12,678 | 12,082 | -1,820 | 596 | | | % | 100 | 118.71 | 96.66 | 18.71 | 22 |
| **20.02.02.99** Interrest - Other | | 15,000 | 14,403 | 14,090 | 1,000 | 313 | | | % | 100 | 96.02 | 100.64 | -3.98 | -5 |
| **20.03.02.99** | | 0 | 0 | 749 | -20,000 | -749 | | | % | 0 | 0 | 0 | 0 | 0 |
| **20.03.04.00** | | 0 | 0 | 20 | 0 | -20 | | | % | 0 | 0 | 0 | 0 | 0 |
| **20.03.99.00** Other Recipts | | 20,000 | 687,521 | 85,319 | 0 | 602,202 | | | % | 100 | 3,437.61 | 426.60 | 3,337.61 | 3,011 |
| **20.04.01.00** | | 0 | 81,813 | 69,329 | 0 | 12,484 | | | % | 0 | N/A | 0 | 0 | 0 |
| **20.06.02.00** Sales of capital assets | | 10,000 | 21,440 | 461 | -15,000 | 20,980 | | | % | 100 | 214.40 | 1.84 | 114.40 | 213 |
| **Total** | | **55,680** | **817,856** | **182,051** | **-35,820** | **635,805** | | | | | | | | |

NA - Not Applicable

## 5. විශේෂ ව්‍යාපෘති හා වැඩසටහන් කාර්යසාධනය

### අ. දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (CRIP)

**ව්‍යාපෘතියේ පසුබිම**

වර්තමානයේ ශ්‍රී ලංකාව දේශගුණික අවදානම් වලට බහුලව භාජනය වන රටවල් අතරින් ප්‍රධාන තැනක් ගනී. ඉදිරියේ දී ඇතිවෙන දේශගුණික විපර්යාස නිසා මෙම තත්වය තවදුරටත් තීව්‍ර වනු ඇත. කාලගුණික විපර්යාස නිසා ඇති අවදානම විශාල වශයෙන් රටේ මුහුදුබඩ ප්‍රදේශ, වියළිකලාපය සහ අන්තර් කලාපයට විශාල වශයෙන් පසුගිය ශතක කිහිපයක සිට බලපා ඇත.දේශගුණික අහිතකර තත්වයන් නිසා මිනිස් ජීවිත වලට සහ දේපල වලට සිදුවන බලපෑම් වලට මුලිකම හේතුව වී ඇත්තේ වර්ෂාපතනයේ සිදුවන අධික විචලනයයි. මෙම තත්වය නිසා ඉදිරියේදී බහුල වශයෙන් ගංවතුර, සුළිසුලං සහ නියං තත්වයන් ඇති වීමේ අවදානමක් පවතී. එය ලංකාවේ ආර්ථික සහ සමාජීය සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී විශාල බාධාවක්ව පවති. මෙම තත්වයට ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීමේ අරමුණින් ලෝක බැංකුව සහ ශ්‍රී ලංකා රජය විසින් දේශගුණික බලපෑම් වලට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය සකස්කර වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ වාරිමාර්ග දෙපාර්තුමේන්තුව, මහවැලි අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය මගින් දිවයිනේ තෝරාගත් ප්‍රදේශවල ක්‍රියාත්මක වේ. මේ සඳහා පූර්ණ මූල්‍ය දායකත්වය ලෝකබැංකුව සපයනු ලබයි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැපයීම, මෙහෙයවීම හා ඇගයීම ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් සිදුකරනු ලබයි.

ව්‍යාපෘතිය මගින් දේශගුණික විපර්යාස නිසා ඇතිවන අහිතකර බලපෑම් අවමකිරීමට සහ එම කම්පන තත්වයන්ට ඔරොත්තු දීම සඳහා ගංවතුර අවදානම් තත්වයන් විශ්ලේෂණය, පුරෝකථනය කිරීම හා ඒ ආශ්‍රිත මොඩලයන් සකස්කර ආයෝජන සැලසුම් වලට එම අවදානම් තත්වයන් අන්තර්ගතකර දිගුකාලීන විසඳුමක් ලබාදීම සඳහා අවශ්‍ය සහභාගී වන ආයතනවල තාක්ෂණික හැකියාව සහ යටිතල පද්ධතීන් වැඩිදියුණු කිරීමට මූල්‍ය දායකත්වය ලබා දෙයි. මෙලෙස සිදුකරනු ලබන භෞතික ආයෝජනයන් තුලින් එම පද්ධතිවල කෙටිකාලීන අඩුපාඩු සකස් කිරීමටත් සිදුවිය හැකි විපත් තත්වයන්ට ක්ෂණිකව මැදිහත්වීමටත් හැකියාව ලැබෙනු ඇත.

#### 1. ව්‍යාපෘතියේ සංවර්ධන අරමුණු

දේශගුණික විපර්යාස නිසා අනතුරට ලක් වී ඇති මිනිස් ජීවිත හා දේපල වල අවදානම අවම කිරීම සහ ව්‍යසනයන්ට සාර්ථකව මුහුණ දීමට රජයේ හැකියාව ශක්තිමත් කිරීම.

#### 2. ව්‍යාපෘතියේ සංරචකයන්

වර්තමානයේ දී දේශගුණික විපර්යාස වල බහුවිධ බලපෑම හා ගංවතුර සහ නියං සම්බන්ධ ආදර්ශ සහ මොඩලයන් සැකසීමට අනුකල්පිත සිදුවීම් ඇතුලත් කර සැලසුම් සකස් කිරීම පිළිබඳව දැනුම අල්පවීම නිසා එම තත්වයන් මගහරවා කාලගුණික විපර්යාස වලට ඔරොත්තු දෙන ආර්ථිකයක් ගොඩනැගීමට අවශ්‍ය ක්‍රියාදාම ස්ථාපනය කිරීම සඳහා

ව්‍යාපෘතිය ආයෝජනය කරනු ලබයි. එයට අමතරව කෙටිකාලීන ගංවතුර සහ නියං තත්වයන් පාලනය කිරීමේ වැඩසටහන්වල ඒකාබද්ධතාවය සහ අවදානමට ලක් වී ඇති වාරිපද්ධති වල, මාර්ග පද්ධතිවල සහ පාසල් සේවා අඛන්ඩව පවත්වාගෙන යාමට අපහසු ස්ථානවල ක්ෂණික සහ කෙටිකාලීන දේශගුණික බලපෑම් අවම කිරීමට අවශ්‍ය ක්‍රියාකාරකම් සඳහා ද ආයෝජනය කරනු ලබයි.

මේ අනුව, ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත්කර ගැනීම සඳහා පහත සඳහන් ව්‍යාපෘති සංරචකය 4ක් යටතේ මූල්‍ය ආයෝජනය කරනු ලබයි.

1. ජල ද්‍රෝණි ආයෝජන සැලසුම් 10 ක් සකස් කිරීම.
2. දේශගුණික විපර්යාසවලට ඔරොත්තුදීමට හැකි වන පරිදි ජල ආශ්‍රිත යටිතල පද්ධති වැඩිදියුණු කිරීම.
3. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, මෙහෙයුම් හා ඇගයීම්.
4. හදිසි අවිනිශ්චිතතාවයන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා අවශ්‍ය මූල්‍ය දායකත්වය.

### ව්‍යාපෘති සංරචක 01 - ජල ද්‍රෝණි ආයෝජන සැලසුම් සකස් කිරීම

මෙම සංරචකය යටතේ ව්‍යාපෘතිය තෝරාගත් ජලද්‍රෝණි 10 ක පරිපූර්ණ ආයෝජන සැලසුම් සකස් කිරීම සඳහා ගංවතුර හා නියං තත්වයන්ගේ අවදානම් විශ්ලේෂණය කොට සවිස්තරාත්මක අනුකල්පිත සිදුවීම් වලට අනුකූලව ආදර්ශ මොඩලයන් සකස්කර ආයෝජන සැලසුම් සකස් කිරීමට ප්‍රමුඛත්වය ලබාදෙනු ලැබේ.



පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරුවන් සඳහා ගංවතුර දත්ත විශ්ලේෂණය සහ මොඩලයන් පිළිබඳව පුහුණුවීමේ වැඩසටහනක්

මේ යටතේ සිදුකරනු ලබන විශ්ලේෂණ ක්‍රියාවලිය තුලින් අනාගතයේ දේශගුණික බලපෑම්වලට ඔරොත්තු දීමට හැකි ආයෝජන සැලසුම් සකස් කිරීමට අවශ්‍ය මූලික පදනම සකස්වෙනු ඇත. ඒ අනුව, ගංවතුර හා නියං තත්වයන්වල අවදානම අවමකරගැනීමටත්, ඒවා මැඩ පැවැත්වීමටත් අවශ්‍ය තාක්‍ෂණික හැකියාව වැඩිදියුණු කරගැනීමටත් රජයට හැකිවේ.

තවද ව්‍යාපෘතියේ මැදිහත්වීම්වල දීර්ඝකාලීන තිරස්ථායිතාව ඇති කිරීම සඳහා අමාත්‍යාංශය යටතේ දේශගුණික බලපෑම්වලට ඔරොත්තු දීමේ සැලසුම් සකස් කිරීමේ ඒකකයක් පිහිටුවීමටත්,ඒ තුලින් රජයට අවශ්‍ය ආයෝජන වර්තමාන සහ අනාගත ගංවතුර හා නියං තත්වයන්වල අවදානම සැලකිල්ලට ගෙන සාඵල්‍ය ප්‍රවේශයකට අනුව ජල සම්පත් සම්බන්ධව ක්‍රියාකරන සියලුම ආයතනවල එකගතාවය අනුව සිදුකිරීමට හැකියාව ලැබෙනු ඇත.

### ව්‍යාපෘති සංරචක 02 - දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දෙන ජල ආශ්‍රිත යටිතල පද්ධති ඇති කිරීම

මෙම සංරචකය යටතේ ක්ෂණිකව වැඩිදියුණු කලයුතු දේශගුණික බලපෑම නිසා තර්ජනයට ලක් වූ ප්‍රමුඛතාවයෙන් ඉහල;

1. වාරි පද්ධතිවල ඇලවල්, ඉවුරු, ජල පාලක මෙවලම්, ගංවතුර පාලනය කරන වේලි සහ ජලය බෙදාහරින අනෙකුත් උපාංග පිළිසකර කිරීම සහ වැඩිදියුණු කිරීම.

2. ජල ගැලීම් නිසා සිදුවිය හැකි අනතුරුදායක මාර්ග පද්ධතීන් වල පාලම්, බෝක්කු වැඩිදියුණු කිරීම සහ බෑවුම් ස්ථායීකරණය කිරීම.
3. නායයෑම්වලට තර්ජනය වී ඇති පාසල්වල බෑවුම් ස්ථායිකරණය කිරීම සහ NBRO හි තාක්ෂණික හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා මූල්‍ය දායකත්වය දීම සිදු කෙරේ.

මෙසේ තර්ජනයට ලක් වූ යටිතල පද්ධති හඳුනාගැනීම සහ ප්‍රමුඛතාගත කිරීම සිදුකරනු ලබන්නේ අදාල පද්ධතිය ආවරණය වන පරිදි ගංවතුර හා නියං තත්වයන්ට අදාල දත්ත ප්‍රාදේශිය මට්ටමින් සිදුකරනු ලබන විශ්ලේෂණයන් සහ ආදර්ශීය මොඩලයන් සකස්කිරීමෙන් අනතුරුව වේ. ඒ අනුව, ඒ ඒ කාලාන්තර වල දී ලැබිය හැකි උපරිම වර්ෂාපතනයට ඔරොත්තු දෙන ආකාරයට පිළිසකර කිරිමේ කටයුතු කරනු ලැබේ. මෙයට අමතරව, 2014 වර්ෂයේ ඇති වූ අධික වර්ෂාපතනය නිසා සිදු වූ ජල ගැලීම් හා නායයාම් නිසා ව්‍යාපෘතිය යටතේ පිළිසකර කිරීම් සඳහා තෝරාගෙන තිබූ සමහර නිර්මිතයන් තව දුරටත් බාදනයට ලක්විය. තව ද, ඌව පළාත් සභාව යටතේ ඇති පාරවල් වල සමහර ස්ථාන නායයාමේ තර්ජනයට ලක්විය. එම නිසා ශ්‍රී ලංකා රජය හා ලෝක බැංකුව එක්ව සාකච්ජා කර පිළිසකර කිරීමේ අවශ්‍යතාවය පුළුල් කර ඒ සඳහා අවශ්‍ය මූල්‍ය දායක බව ලබා දීමට ලෝක බැංකුව එකඟ විය. ඒ අනුව ඌව පළාත් සභාව යටතේ නායයාම් වලට තර්ජනය වී ඇති බෑවුම් සහ වාරිමාර්ග දෙපාර්තුමේන්තුව සහ මහවැලි අධිකාරිය යටතේ අවශ්‍යතා පුළුල් වූ පිළිසකර කිරීම් සඳහා ඇ.ඩො මිලියන 42ක් ව්‍යාපෘතියට ලබා දෙන ලදී. ඒ අනුව ව්‍යාපෘතියේ මුළු ආයෝජනය රු. මිලියන 152 කි.

**ව්‍යාපෘති සංරචක 03 - ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, මෙහෙයුම් හා ඇගයීම්**

මෙම සංරචකය යටතේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මඟින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ වී ඇති ආයතන අතර සම්බන්ධීකරණය, පහසුකම් සැපයීම, තාක්ෂණික සේවය සැපයීම, ප්‍රසම්පාදන කටයුතු සඳහා උපදෙස් දීම, මූල්‍ය කළමනාකරණය කිරීමට උපකාර කිරීම හා මෙහෙයවීම හා ඇගයීම සිදුකරනු ලබයි.

**ව්‍යාපෘති සංරචක 04 - හදිසි අවිනිශ්චිතතාවයන්ට ප්‍රතිචාර දැක්වීම**

මෙම සංරචකය යටතේ ව්‍යාපෘති කාලසීමාව තුලදී සිදුවන හදිසි ආපදා තත්වයන්ට මුහුණ දීම සඳහා රජයට අවශ්‍ය සහයෝගය ලබාදීම සඳහා හදිසි ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සපයනු ලබයි.

## 3. ව්‍යාපෘති මූල්‍ය ආයෝජනය

ව්‍යාපෘතිය සඳහා පූර්ණ මූල්‍ය දායකත්වය ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සහයෝගීතාවය විසින් දරනු ලබන අතර, එම මුලික ව්‍යාපෘතිය සඳහා ආයෝජන මුදල රුපියල් මිලියන 14,382 ක් වන අතර, අමතර ආයෝජනය සඳහා වූ මුදල රු මිලියන 5,880කි. ශ්‍රී ලංකා රජය විසින් රු. මිලියන 235ක මුදලක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සහභාගීවන ආයතනවල නිලධාරීන්ගේ දිරි දීමනා ගෙවීම සඳහා වෙන්කර ඇත. ව්‍යාපෘතියේ මුළු ආයොජනය ඇමරිකානු ඩොලර් මිලියන 152කි.

## 4. ව්‍යාපෘතියේ මූල්‍ය සහ භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය ක්‍රියාත්මකවීම ආරම්භ කරන ලද්දේ 2014 අගෝස්තු මස 05 වන දින වන අතර එතැන් සිට 2016 දෙසැම්බර් මස 31 වන දින දක්වා ව්‍යාපෘතිය රු. මිලියන 4688ක්, මුළු ආයෝජනය රු.මිලියන 14 382ක මුදලින් ආයෝජනයක් කර ඇත.

ඒ අනුව මූල්‍ය ප්‍රගතිය, ව්‍යාපෘතියේ මුලු ආයෝජනයට සාපේක්ෂව 32%ක් වන අතර භෞතික ප්‍රගතිය 36%කි. මෙම මූල්‍ය ආයෝජනය බහුලව වැයකර ඇත්තේ පිලිසකර කිරීමේ කොන්ත්‍රාත්කරුවන් නිමකල පිළිසකර කිරීම් සඳහා ගෙවීමට සහ ක්‍රියාත්මක කරන ආයතනවල හැකියාව වර්ධනය කිරීමට අවශ්‍ය යන්ත්‍ර, වාහන, පරිගණක යන්ත්‍ර සහ කාර්යාල උපකරණ මිලදී ගැනීමට වේ. මේ වනවිට ක්‍රියාත්මක කිරීමට යෝජිත කොන්ත්‍රාත්තු 445 න් පිලිසකර කිරීමේ කොන්ත්‍රාත්තු 326ක් ප්‍රදානය කර ඇති අතර, ඒවායේ වටිනාකම රු.මිලියන 5,945 කි. එම කොන්ත්‍රාත්තු සඳහා රු.මිලියන 3028ක් Mobilization Advance සහ කොටස් වශයෙන් නිමකල වැඩ සඳහා කොන්ත්‍රාත්කරුවන් සඳහා නිදහස් කර ඇත. මෙම කොන්ත්‍රාත්තු අතරින් විශාල සංඛ්‍යාවක් ගොවි සංවිධාන මගින් ක්‍රියාත්මක කරන CP කොන්ත්‍රාත්තු වන අතර, ඉතිරිය ජාතික තරගකාරී ක්‍රමය (NCB) අනුව ප්‍රදානය කල කොන්ත්‍රාත්තු සහ ජාතික මිලදී ගැනීමේ ක්‍රමය යටතේ (NS) ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තු වේ. NCB කොන්ත්‍රාත්තු ප්‍රදානයේ දී මහවැලි අධිකාරිය විශාල ප්‍රගතියක් දැක්වූවත් ID, RDA සහ NBRO ආයතනවල ප්‍රගතිය සැලකිය යුතු මට්ටමක නොමැත .එයට හේතුව වී ඇත්තේ එම ආයතන වලට අදාල කොන්ත්‍රාත් තුල පවතින සංකීර්ණ ස්වභාවය නිසා සැලසුම් සකස් කිරීම සහ ඇස්තමේන්තු පිළියෙල කිරීමට සැලකිය යුතු කාලයක් ගතවීමයි. තවද මෙම ආයතන දෙකෙහි ව්‍යාපෘති සම්බන්ධව වැඩ කිරීමට හැකි තාක්ෂණික නිලධාරීන්ගේ අඩුවක් පැවතීම නිසාද ප්‍රගතිය අඩුවීමට හේතුවී ඇත. මේ වන විට ව්‍යාපෘතිය විසින් රුපියල් මිලියන 5620ක් වටිනා NCB කොන්ත්‍රාත්තු 135ක්ද, රුපියල් මිලියන 231ක් වටිනා CP කොන්ත්‍රත්තු 166ක් සහ රුපියල් මිලියන 94ක් වටිනා NS කොන්ත්‍රාත්තු 25ක් ප්‍රදානය කර ඇත.තවත් පැකේජ 119ක් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විවිධ අවස්ථාවල පවතින අතර, ඒවායින් බොහොමයක් 2017 මාර්තු 31 වන විට ප්‍රදානය කිරීමට අපේක්ෂා කෙරේ. මේ වනවිට ව්‍යාපෘති සංරචක -1 යටතේ අන්තර් ජාතික තරඟකාරී ටෙන්ඩර් ක්‍රමය (ICB) යටතේ LIDAR සහ Aerial Photographic මිනුම් කොන්ත්‍රාත්තු දෙකක් ප්‍රධානය කර ඒවායේ වැඩකටයුතු අවසන් කර ඇත. තවද ගංවතුර හා නියං තත්වයන් විශ්ලේෂණය කිරීම සඳහා වූ ජාත්‍යන්තර විශේෂඥ ආයතනයක් ලෙස බ්‍රිතාන්‍යයේ ඇට්කින්ස් ආයතනය (Ms Atkins consultant) තෝරාගෙන ක්‍රියාත්මක වෙමින් පවතී. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ආයතනවල හැකියාව සහ ධාරිතාවය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය උපකරණ, යන්ත්‍රෝපකරණ, පරිගණක යන්ත්‍ර ,කාර්යාල උපකරණ, දේශීය හා විදේශීය පුහුණුවීම් ලබා දී ඇත. ඒ අනුව ඩෙක්ස්ටොප් පරිගණක 189ක්ද, Note Book Computers 63ක්ද, ඩබල් කැබ් වාහන 44ක්, ජීප් 7ක් ඩිජිටල් කැමරා 59ක්, බැකෝ යන්ත්‍ර 20ක් මැනුම් කටයුතු සඳහා අවශ්‍ය උපකරණ කට්ටල 58ක් පර්යේෂණාගාර සඳහා උපකරණ මිලදී ගෙන බෙදා හැර ඇත. රු.මිලියන 4.3ක් වැයකරමින් නිලධාරීන් 495ක් පුහුණු වැඩසටහන් 21ක් යටතේ දේශීය පුහුණුව ද සහ නිලධාරීන් 39ක් විදේශීය පුහුණු වැඩසටහන් 7ක් යටතේ රු.මිලියන 11.7ක් වැයකරමින් විදේශීය පුහුණුවීම්ද ලබා දී ඇත.

## 5. ව්‍යාපෘති ප්‍රගතිය

### 5.1 ජල ද්‍රෝණි ආයෝජන සැලසුම් සකස් කිරීම

තෝරාගත් ජලද්‍රෝණි 10 සඳහා ආයෝජන සැලසුම් සකස් කිරීම සහ ගංවතුර සහ නියං තත්වයන් සඳහා සැලසුම් ඒකකයක් අමාත්‍යාංශය යටතේ පිහිටුවා එය ක්‍රමිකව කාලගුණික බලපෑම් වලට ඔරොත්තු දීමේ සැලසුම් ඒකකයක් බවට පත් කිරීම සහ එම ඒකකයට අනුයුක්තව විදේශ විශේෂඥ කණ්ඩායමක් සමග දේශිය කාර්යමණ්ඩල එක්ව සැලසුම් සකස් කිරීම සිදුකරනු ලබයි. මේ සඳහා අන්තර් ජාතික ගංවතුර හා නියං තත්වයන් පිළිබඳ විශේෂඥ ආයතනයක් ලෙස බ්‍රිතාන්‍යයේ ඇට්කින්ස් ආයතනය තෝරාගෙන ගිවිසුම් අත්සන් කිරීම 2016 මැයි මස 10 වන දින සිදු කරන ලදී.

මෙම විශේෂඥ කණ්ඩායම සමග කටයුතු කිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තුමේන්තුව සහ මහවැලි අධිකාරියේ තෝරාගත් නිලධාරීන් අනුයුක්ත කර ඇත. ඔවුන්ට අවශ්‍ය දැනුම, පුහුණුව හා තාක්ෂණික පහසුකම් සැපයීම සඳහා ඇට්කින්ස් ආයතනය විසින් නිලධාරීන් 24 දෙනෙකුට පුහුණු වැඩසටහනක් බ්‍රිතාන්‍යයේදී පවත්වන ලදී.

විදේශීය විශේෂඥ කණ්ඩායම විසින් ජලද්‍රෝණි 6 ක් සඳහා ආයෝජන සැලසුම් සකස් කිරීම සහ මූලික යෝග්‍යතා වාර්තා (Pre- Feasibility) සකස් කිරීම, ඒ ඒ ආයතන වලින් නිදහස් කළ නිලධාරීන් සමග කොන්ත්‍රාත්තුවේ පලමු අදියර (මාස 18) යටතේ සිදුකරනු ලබයි. ඉතිරි ජලද්‍රෝණි 4 සඳහා ආයෝජන සැලසුම් දේශිය නිලධාරීන් විසින් විදේශීය විශේෂඥ කණ්ඩායමේ අධීක්ෂණය යටතේ පිළියෙල කරනු ලබන අතර ද්‍රෝණි 10 සඳහාම අවසාන යෝග්‍යතා වාර්තා (Final Feasibility Report) සකස් කිරීම, කොන්ත්‍රාත්තුවේ දෙවන අදියර (මාස 18) යටතේ සිදු කරනු ලබයි.

මෙයට අමතරව LIDAR මැනීම සහ ගුවන් ඡායාරූප පිටපත් කර ගැනීම සඳහා කොන්ත්‍රාත්තු 2ක් ප්‍රංශයේ Fugro Geoid SAS සමාගමට සහ බෙල්ජියමේ Aerodata International සමාගමට ප්‍රදානය කරන ලදී. ඔවුන් විසින් කොන්ත්‍රාත්තුවලට අදාල කාර්යයන් මේ වනවිට අවසන් කර ඇත.තවද ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් වාරිමාර්ග දෙපාර්තුමේන්තුවට හා මහවැලි අධිකාරියේ නිලධාරීන්ගේ භාවිතය සඳහා රු.මිලියන 30 ක් වැයකරමින් භූගෝලීය තොරතුරු පද්ධති (GIS) මෘදුකාංග මිලදී ගෙන බෙදා හැර ඇත. මෙයට අමතරව ගංවතුර දත්ත පදනම් කරගෙන විශ්ලේෂණය කිරීම, මොඩලයන් සකස් කිරීම හා පුරෝකථනය කිරීම සඳහා TUTLOW-2, Flood Modler-2, WEAP-1 යනාදී මෘදුකාංග මිලදී ගන්නා ලදී. එම මෘදුකාංග උපදේශන සමාගම සමග කටයුතු කිරීමට නිදහස් කල නිලධාරීන් විසින් භාවිතා කරනු ලබයි.


## 5.2 යටිතල පද්ධති කාලගුණික බලපෑම්වලට ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම


වර්ෂ 2010 - 2011 දක්වා සිදු වූ ගංවතුර හා නියං තත්වයන් නිසා හානියට ලක් වූ වාරි පද්ධතිවල ක්ෂණික හා කෙටිකාලීන භෞතික වැඩිදියුණු කිරීම් එම පද්ධතීන්ට අදාලව සිදුකරනු ලබන ගංවතුර හා නියං දත්ත විශ්ලේෂණය කිරීම තුළින් සකස් කරන ලද මොඩලයන් පදනම්ව සිදු කරනු ලබයි. මෙම ආදර්ශ මොඩලයන් තුලින් ගංවතුර හා නියං ඇතිවන කාලාන්තරයන්, ඒවායේ ගතික ස්වභාවය, පරිමාව හා තීව්‍රතාවය හඳුනාගෙන එයට සාපේක්ෂව සැලසුම් සකස් කිරීම සිදුකරනු ලබයි. මේ අනුව මූලිකව පිළිසකර කිරීමේ කොන්ත්‍රාත්තු පැකේජ 394ක් හඳුනා ගන්නා ලදී. මෙයට අමතරව 2014 වර්ෂයේ පැවති ගංවතුර හා නායයාම් නිසා පුළුල් වූ අවශ්‍යතා අනුව වාරිමාර්ග දෙපාර්තුමේන්තුව අමතර පැකේජ 83ක් සහ මහවැලි අධිකාරිය අමතර පැකේජ 21ක්, අමතර මුල්‍ය ආයතන යටතේ හඳුනා ගන්නා ලදී. තව ද ඌව පළාත් සභාව ද නායයාම් තර්ජනයට ලක්ව ඇති බැවුම් ස්ථායිකරණය සඳහා අලුත් පැකේජ 18ක් හඳුනා ගෙන ඇත.

### 5.2.1 වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වාරිපද්ධති වල භෞතික වැඩිදියුණු කිරීම

වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ හානියට ලක් වූ වාරිපද්ධති වල ගංවතුර හා නියං තර්ජන අවම කිරීම සඳහා භෞතික වැඩි දියුණු කිරීමට අදාල ප්‍රසම්පාදන සැලැස්මට අනුව ව්‍යාපෘතිය ආරම්භයේදී 2010 - 2011 අතර සිදු වූ ගංවතුර හා නියං තත්වයන් නිසා හානි වූ වාරි පද්ධතිවල පිළිසකර කිරීම් සඳහා පැකේජ 394 ක් හඳුනා ගන්නා ලදී.

නමුත් 2014 දී සිදු වූ ගංවතුර හානිය නිසා පෙර හඳුනාගත් පැකේජයන්ට අදාල පිළිසකර අවශ්‍යතා පුළුල් වූ අතර, රුපියල් මිලියන 2,305 වටිනා අමතර පැකේජ 83ක් සඳහා ආයෝජනය ලෝක බැංකු අමතර මූල්‍යාධායක බව යටතේ ලබාදෙනු ලබයි. ඒ අනුව වාරිමාර්ග දෙපාර්තුමේන්තුව මූලික ව්‍යාපෘතිය සහ අතිරේක ආයෝජනය යටතේ පැකේජ 437ක් රු මිලියන7050ක් වැය කර පිළිසකර කිරීමට යෝජිතය. මෙම පැකේජයන් අතුරින් ගොවි සංවිධාන හරහා ක්‍රියාත්මක පැකේජ (CP) යටතේ රු.මිලියන 195.6ක් වටිනා කොන්ත්‍රාත්තු 136 ක් මේ වනවිට ප්‍රධානය කර ඇත. ඒවා අතරින් රු. මිලියන 121 ක් වටිනා පැකේජ 88ක පිළිසකර කිරීම අවසන්කර ඇත.




මෙයට අමතරව ජාතික මිලදීගැනීම් (NS) යටතේ රු. මිලියන 91ක් වටිනා පැකේජ 24ක් ප්‍රදානය කර ඇත. මෙයින් රු.මිලියන 52.6ක් වටිනා පැකේජ 14 ක පිළිසකර කිරීම් අවසන් කර ඇත. ජාතික තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රමය (NCB) යටතේ රු. මිලියන 2,376ක් වටිනා පැකේජයන් 93ක් ප්‍රදානය කර ඇති අතර මේ වනවිට රු.මිලියන 909ක් කොටස් වශයෙන් කොන්ත්‍රාත්කරුවන් සඳහා ගෙවීම් සිදුකර ඇත. මේ අනුව සමස්ථයක් ලෙස රු. මිලියන 2,663ක් වටිනා කොන්ත්‍රාත්තු 253ක් ප්‍රදානය කර ඇත. මේ වනවිට මෙම පැකේජ සඳහා රු.මිලියන 1,070ක් Mobilization Advance හා නිමකළ කොටස් සඳහා ඉදිරිපත් කල බිල් සඳහා ගෙවීම් කර ඇත. දැනට ප්‍රදානය කර ඇති කොන්ත්‍රාත්තු බෙහොමයක් යටතේ ඇළවල් වල ඉවුරු පිළිසකර කිරීම, බස්නාවන් පවිත්‍ර කර පුළුල් කිරීම, ඇලවල් පුළුල් කිරීම, ජල පාලන ගේට්ටු පිළිසකර කිරීම සහ අනෙකුත් මෙවලම් අලුත්වැඩියා කිරීම යනාදී කාර්යන් සිදුකරනු ලබයි.



පොලොන්නරුව දිස්ත්‍රික්කයේ මුස්ලිම් කොලනියේ D2 ප්‍රධාන ඇලෙහි නිර්මිතයන් පිළිසකර කිරීම.



පොලොන්නරුව දිස්ත්‍රික්කයේ මුස්ලිම් කොලනියේ D2 ප්‍රධාන ඇල යටතේ FE-02 ඇලෙහි සිදුකරනු ලැබූ පිළිසකර කිරීම




අක්කරපත්තු ඒකකයේ ඇළවල්වල පිළිසකර කිරීම්




මොණරාගල මුතුකණ්ඩිය ව්‍යාපාරයේ ජලය බෙදා හරින නිර්මිතයන් පිළිසකර කිරීම

### 5.2.2 මහවැලි අධිකාරියේ වාරි පද්ධතිවල භෞතික වැඩිදියුණු කිරීම්


මහවැලි අධිකාරිය යටතේ ඉදිරියේ ඇති වන ගංවතුර හා නියං තත්වයන්ට ඔරොත්තුදීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘතිය ආරම්භයේදී පැකේජයන් 60 ක් හදුනා ගන්නා ලදී. මෙම පැකේජ 60හි මුළු ඇස්තමේන්තු මුදල රු.මිලියන 1,308 කි. නමුත් 2014 දී සිදුවූ ගංවතුර තත්වය නිසා මෙසේ හදූනාගත් සමහර පිළිසකර කිරීම්වල අවශ්‍යතා පුළුල් වූ අතර, එයට අදාලව රු.මිලියන 715.8 ක් වටිනා පැකේජයන් 21ක් අමතර මුල්‍ය දායකත්වය යටතේ හඳුනා ගන්නා ලදි. ඒ අනුව මුළු පැකේජ සංඛ්‍යාව 81ක් වන අතර ආයෝජන මුදල රු.මිලියන 2,035 කි. එයින් රු මිලියන 998ක් වටිනා පැකේජ 21ක් අවසන් කර ඇත. නිමකළ කාර්යන් වෙනුවෙන් රු මිලියන 851.9ක් ගෙවා ඇත. මේ වන විට NCB පැකේජ 28 ක් රු මිලියන 1,315කට ප්‍රදානය කර ඇත. තව ද රු මිලියන 34.9 ක් වටිනා ප්‍රජා සහභාගීත්ව පැකේජ 30 ක් ප්‍රදානය කර ඇති අතර, සියලුම ප්‍රජා සහභාගිත්ව පැකේජවල පිළිසකර කිරීම් අවසන් කර ඇත. එම පැකේජවලට අදලාව ඉදිරිපත්කල බිල්පත් සදහා ගොවි සංවිධාන සඳහා රු.මිලියන 29.86 ක් ගෙවා අවසන් කර ඇත.




මෙයට අමතරව රු.මිලියන 2.6 ක් වටිනා කොන්ත්‍රාත්තුවක් CEB ආයතනයට ප්‍රදානය කර ඇති අතර එය අවසන් කර ඇත.ඒ අනුව මහවැලි අධිකාරිය යටතේ රු.මිලියන 1,288ක වටිනාකමින් යුත් පැකේජ 58ක් ප්‍රදානය කර ඇත.

### 5.2.3 තර්ජනයට ලක් වූ මාර්ගවල බෑවුම් සහ පාලම් වැඩිදියුණු කිරීම තුලින් ප්‍රවාහන පද්ධතියේ අඛණ්ඩ සේවාව තහවුරු කිරීම




ගංවතුර සහ නාය යාම් නිසා සිදු විය හැකි ප්‍රවාහන අපහසුතා මගහරවා ගමනාගමන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය (ම.ස.අ) විසින් තර්ජනයට ලක් වූ බෑවුම් ස්ථායීකරණය සහ ගංවතුර තත්වයන්ට හේතුවන පාලම් බෝක්කු 12 ක් වැඩිදියුණු කිරීම සඳහා පැකේජ 18 ක් හඳුනාගෙන ඇත. මෙම පැකේජ 18හි ඇස්තමේන්තු මුදල රු මිලියන 3,672කි. මේ වනවිට රු මිලියන 1,511 ක් වටිනා පාලම් වැඩි දියුණු කිරීම සඳහා NCB පැකේජ 9 ක් ප්‍රදානය කර ඇති අතර, පැකේජ 02 ක වැඩ අවසන් කර ඇත. මෙම පැකේජ 9 යටතේ නැදිමාල-බොරලැස්ගමුව මාර්ගයේ පාලම, පොලොන්නරුව-සෝමාවතිය මාර්ගයේ පාලම් 4ක්, ත්‍රිකුණාමලය-මඩකලපුව මාර්ගයේ පාලම, මාකඳුර-බඩල්ගම මාර්ගයේ පාලම, කතරගම-සෙල්ලකතරගම මාර්ගයේ පාලම, ගංගොඩවිල - බොරලැස්ගමුව මාර්ගයේ කටු ඇල පාලම පිළිසකර කරනු ලබයි .පොලොන්නරුව - සෝමාවතිය මාර්ගයේ පාලම් 4 හිම වැඩ අවසන් කර ඇත. නැදිමාල-බොරලැස්ගමුව බෙල්ලන්විල පාලමේ ඉදිකිරීම් කටයුතු මේ වන විට 69% කින් අවසන් කර ඇත. ත්‍රිකුණාමලය-මඩකලපුව මාර්ගයේ පාලමේ ඉදිකිරීමේ ප්‍රගතිය 35% කි. මෙහි ඉදිකිරීම් ඉතා දුර්වල තත්ත්වයක පවතී. එය SDPCC ආයතනය විසින් සිදු කරනු ලබයි. බෝගහවත්ත-පුල්මුඩෙයි මාර්ගයේ සපත්තු පාලම වෙනුවට සම්පූර්ණ පාලමක් ඉදිකිරිමේ කටයුතු මේ වන විට 66% ක් අවසන් කර ඇත.ගංගොඩවිල-බොරලැස්ගමුව මාර්ගයේ කටු ඇල පාලම නැවත ප්‍රතිසස්කරණය කිරීම මේ වන විට 34% කින් අවසන් කර ඇත.

ප්‍රදානය කල පැකේජ 9න්, පැකේජ 6ක් (රු.මිලියන 862) පාලම් වැඩිදියුණු කිරීමටත් ඉතිරි පැකේජ 3 (රු.මිලියන 648.6) නායයාම් අවදානම් වලට ලක්වූ බෑවුම් ස්ථායීකරණය කිරීම සඳහා ප්‍රදානය කර ඇත. මෙම කොන්ත්‍රාත්තු 9 සඳහා කොටස් වශයෙන් මේ වන විට රු.මිලියන 740ක් ගෙවා අවසන් කර ඇත.





**පොලොන්නරුව - සෝමාවතිය මාර්ගයේ වැඩිදියුණු කල පාලම්**





**මහනුවර - මහියංගන මාර්ගයේ අනාරක්ෂිත බෑවුම් ස්ථායිකරණය කිරීම්**

තවද මහනුවර මහියංගන මාර්ගයේ අස්ථායි බෑවුම් 16ක් ස්ථායිකරණය සඳහා පිළිසකර කිරීමේ පැකේජ 3ක් ප්‍රදානය කර ඇති අතර, ඉන් 2ක වැඩ අවසන් වී ඇත.ඉතිරි පැකේජයේ ඉදිකිරීම් කටයුතු 85%කින් පමණ අවසන් කර ඇත.එම පැකේජ 3හි වටිනාකම රු මිලියන 648.6 කි.




**මහනුවර - මහියංගන මාර්ගයේ, මාර්ගයට කඩාවැටීමට හැකි අවධානම් ගල් ඉවත් කිරීම**

### 5.2.4 පාසල් භූමි වල ආරක්ෂාව සඳහා නාය යාම් තර්ජන අවම කිරීම




ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය (ජා.ගො.ප.අ) විසින් මහනුවර දිස්ත්‍රික්කයේ නායයාම් තර්ජනයට ලක් වූ පාසල් 18 ක බෑවුම් ස්ථායිකරණය කිරීම සඳහා පැකේජ 12ක් තෝරාගෙන ඇත. මේ වන විට පැකේජ 05ක් ප්‍රදානය කර ඇත. ඉන් එක් පැකේජයක් මහනුවර ධර්මරාජ විදුහලේ තර්ජනයට ලක් වූ බෑවුම් සථායීකරණය සඳහා ප්‍රදානය කර ඇත. එහි වටිනාකම රු.මිලියන 105කි. මෙහි කටයුතු මේ වනවිට අවසන් කර ඇත. තවත් එක් පැකේජයක් නුවර මහාමායා, හිල්වුඩ් හා ගෝතමී යන පාසල් තුනෙහි බෑවුම් ස්ථායීකරණය සඳහා

රු.මිලියන 130.5 ක් වටිනා කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇත. මෙම පාසැල් 3හි බැවුම් ස්ථායිකරණ කටයුතු 98ක් පමණ අවසන්කර ඇත. ගල්කන්ද කනිෂ්ඨ විද්‍යාලයේ බැවුම් ස්ථායිකරණය සඳහා රු මිලියන 28ක් වටිනා කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කරන ලදී. එහි 95%ක වැඩ අවසන් කර ඇත. මෙයට අමතරව ආනන්ද විද්‍යාලයට, ගල්ලොලුව නවෝදා විද්‍යාලයට සහ බෝතොට මහා විද්‍යාලයේ බැවුම් ස්ථායිකරණය සඳහා රු.මිලියන 68ක් වටිනා කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර ඇත. එහි ඉදිකිරීම් කටයුතු මේ වනවිට සිදු වෙමින් පවති. සිරිමල්වත්ත මහා විද්‍යාලයේ බැවුම් ස්ථායිකරණය සඳහා රු මිලියන 43.6ක් වටිනා කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර එහි ඉදි කිරීම් කටයුතු කරමින් පවතී. ඉතිරි පැකේජ සඳහා ටෙන්ඩර් ක්‍රමවේදය ක්‍රියාත්මක වෙමින් පවතී.

බැවුම් ස්ථායීකරණය සඳහා සුදුසුකම් හා තාක්ෂණික හැකියාව සම්පූර්ණවූ කොන්ත්‍රාත්කරුවන්ගේ හිගතාවය නිසා විශාල ප්‍රමාණයේ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට බාධාවක් වී ඇත. මේ සඳහා ඉදිරිපත් වන්නේ එකම කොන්ත්‍රාත්කරුවකු බැවින් හා ඔහුට මේ වන විට කොන්ත්‍රාත්තු 03 ක් ම ප්‍රදානය කර ඇති බැවින්, තව දුරටත් එම කොන්ත්‍රාත්කරුවාට තවත් එවැනිම කොන්ත්‍රාත්තුවක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ධාරිතාවය අඩු නිසා ඉතිරි පැකේජ වල මූල්‍ය වටිනාකම අඩු පැකේජ කිහිපයකට වෙන්කර සකස් කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය තීරණය කරන ලදි. ඒ අනුව ඉදිරියේදී සුදුසුකම්ලත්වෙනත් මධ්‍යම ප්‍රමාණයේ කොන්ත්‍රාත්කරුවන් සඳහාද ඉදිරිපත් වීමට අවස්ථාව සැලසේ.



ගල්කන්ද කණිෂ්ඨ විද්‍යාලයේ රැදවුම් **(Retaining Wall)** තාප්පයක් ඉදිකිරිම



ගල්කන්ද කණිෂ්ඨ විද්‍යාලයේ පාදන්ත කාණුවක් **(Toe Drain)** ඉදිකිරිම

### ආ. ගිං - නිල්වලා ජලාශ හැරවුම් ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය බහුකාර්යය සංවර්ධන ව්‍යාපෘතියක් වන අතර එමඟින් හම්බන්තොට නගරාශ්‍රිත ප්‍රදේශයෙහි කාර්මික ජල අවශ්‍යතා සඳහා ඝන මීටර් මිලියන 154ක් සපයන අතර ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කයන්හි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 25ක් සඳහා පානීය ජල අවශ්‍යතා සඳහා ඝන මීටර් මිලියන 124 ක් ද සපයයි. එමෙන්ම දැනට පවතින කෘෂිකාර්මික ඉඩම් හා වාණිජ කෘෂිකර්මය සංවර්ධනය ද ඇතුළුව නව ඉඩම් සඳහා ඝන මීටර් මිලියන 111ක් ද සපයයි.

ඊට අමතරව මාර්ග පද්ධතිය සංවර්ධනය හා වාර්ෂිකව ගිගාවොට් පැය 6.5 ක විදුලි උත්පාදනයක් ද ව්‍යාපෘතිය මඟින් අපේක්ෂිතය.

ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇස්තමේන්තුව US$ 690 මිලියන වන අතර චීනයේ CAMCE ඉංජිනියරින් සමාගම සමඟ ඉංජිනේරු, ප්‍රසම්පදාන හා ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක් සඳහා ගිවිසුම් ගත වී ඇත.

මෙම ව්‍යපෘතියේ වැඩ ආරම්භ කිරිම සඳහා ආර්ථික කලමනාකරණ සඳහා වූ නිලධාරි කමිටුව (OCEM) මගින් තව දුරටත් සාකච්ඡා කරන ලද අතර, ව්‍යාපෘතිය අදියර දෙකක් යටතේ ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලෙස අමාත්‍යාංශයට උපදෙස් ලබා දෙන ලදි. ඒ අනුව ව්‍යාපෘතිය පහත ලෙස අදියර දෙකකින් ක්‍රියාත්මක කිරීම සඳහා සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත.

01) චීන CAMCE සමාගම මගින් දැනට ඇති ව්‍යාපෘති යෝජනාව ගැඹුරින් අධ්‍යනය කර අදාල ආයතන සමග එකගතාවයන්ට එලඹීම හා පාරිසරික අධයනය සඳහා අවශ්‍ය දත්ත හා තොරතුරු ලබාදීම.

02) විස්තරාත්මක නිර්මාණාත්මක හා සැලසුම් කටයුතු ඇතුළු ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරිම

ඒ අනුව ව්‍යාපෘතියේ භූජල විද්‍යාත්මක අධ්‍යයනය චීනයේ ඉංජිනියරින් සමාගම මඟින් ඉටු කරවා ගැනීම සඳහා එකඟතා ගිවිසුමක් අත්සන් කර ඇත. පාරිසරික බලපෑම් අධ්‍යයනය සඳහා මහවැලි උපදේශක කාර්යාංශය මඟින් ඉදිරිපත් කර ඇති යෝජනා 2016 වර්ෂය අවසානය වන විට ඇගයීම් කටයුතු ආරම්භ කර පැවතිණි.

### ඉ. පහළ මල්වතුඔය ජලාශ ව්‍යාපෘතිය

අනුරාධපුර හා වවුනියා දිස්ත්‍රික් මායිම හරහා ගලායන මල්වතුඔය කප්පච්චි නැමැති ස්ථානයේ දී හරස් කර පහල මල්වතුඔය ජලාශය ඉදිකිරීමට යෝජිතය. මෙම ව්‍යාපෘතිය යටතේ මීටර 3590 ක දිගින් යුත් වේල්ලක්, අරීය ගේට්ටු සහිත පිටවානක්, දකුණු ඉවුර, වම් ඉවුර හා මධ්‍යම වශයෙන් සොරව් තුනක් ඉදි කිරීම මඟින් ඝන මීටර මිලියන 209 ක ධාරිතාවයකින් යුත් ජලාශයක් ඉදිකිරීමට යෝජිතය. සොරොව්වේ සිට යෝජිත නව වගාබිම් දක්වා ජලය ගෙන යන ඇල පද්ධතියක් ඉදි කිරීමට ද ව්‍යාපෘතියට ඇතුළත්ය.

මධ්‍යම සොරොව්වෙන් මල්වතු ඔයට මුදාහරින ජලය නැවත දැනට පවතින තෙක්කම අමුණ (මල්වතුඔය යෝජිත ජලාශය සිට කි.මී. 24 ක් පහළින් පිහිටි) මඟින් හරවා තත්පරයට ඝන අඩි 500 ක් හා 250 ක් බැගින් වූ ඇල මාර්ගය මඟින් යෝධ වැව හා අගතිමුරිප්පු වැව දක්වා හරවා යවනු ලැබේ. මේ යටතේ දැනටම එක් කන්නයක් පමණක් සාර්ථකව වගා කරනු ලබන යෝධ වැව ව්‍යාපාරයේ අක්කර 24450 කට හා අකතිමුරිප්පු ව්‍යාපාරයේ අක්කර 6230 කට අතිරේක ජලය සැපයමට ද අක්කර 2000 ක නව වගා බිම් සඳහා ජලය සැපයීමට ද යෝජනා කර තිබේ. මින් අක්කර 675 ක වාණිජ භෝග වගාකිරීමට ද අපේක්ෂිතය. මීට අතිරේකව ජලාශය අවට ගම්මාන වලට හා අළුතින් පදිංචි කරන ජනතාවට අවශ්‍ය ගෘහස්ථ ජල සම්පාදනය සඳහා වාර්ෂිකව ඝන මීටර මිලියන 2.0 ක් සැපයීම ද සොරොව්වෙන් මුදා හරින ජලය මඟින් උත්පාදනය කිරීමට යෝජිත ගිගා වොට් පැය 4.28 ජල විදුලි බලය ජාතික පද්ධතියට සැපයීම ද ප්‍රදේශයේ පශු සම්පත් හා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට ද බලාපොරොත්තු වේ. ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇස්තමේන්තුව රු. මිලියන 12,000 කි.

2016 වර්ෂය අවසානය වන විට ශක්‍යතා අධ්‍යයනය නිමකරන ලද අතර පාරිසරික බලපෑම් අධ්‍යයනය ද බොහෝදුරට නිම කර ඇත. චීනයේ CAMCE ඉංජිනේරු සමාගම මඟින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලබාගන්නා ලදී. ඒ අනුව ඉංජිනේරු, ප්‍රසම්පාදන හා ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා CAMCE ඉංජිනියරින් සමාගම මඟින් තාක්ෂණික හා මූල්‍ය වාර්තා කැඳවා ඇත.

### ඊ. තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය

තල්පිටිගල ජලාශය උමාඔය හරහා දැනට පවතින බත්මැඩිල්ල අමුණ පිහිටි ස්ථානයට කි.මී. 3 ක් පමණ ඉහළින් හුණුකැටිය (දෙමටපැලැස්ස) ග්‍රාමය ප්‍රදේශයේ ඉදිකිරීමට යෝජිතය. උමා ඔය ජලය පාලනය කර බත්මැඩිල්ල අමුණ යටතේ ඇති වගාබිම් වල ජල අවශ්‍යතාව සැපිරීමත්, පාරිසරික අවශ්‍යතා හා මිනිපේ අමුණ සඳහා අවශ්‍ය විට ජලය මුදා හැරීමත් මෙම ජලාශය ඉදිකිරීමේ අරමුණ වේ. මෙම ස්ථානයේ මීටර 46ක් උස වේල්ලක් ඉදිකිරීම මඟින් ඝන මීටර් මිලියන 15.8 ක ධාරිතාවකින් යුතු ජලාශය ඉදිකරනු ලබන අතර බත්මැඩිල්ල ව්‍යාපාරය යටතේ වගාකරනු ලබන හෙක්ටයාර් 668 ක වගාබිම් වලට ජලය සැපයීමත්, ගිගාවොට් පැය 51.3 ක විදුලි බල උත්පාදනයක් කිරීමට ද අපේක්ෂා කෙරේ.

ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇස්තමේන්තුව ඇමෙරිකානු ඩොලර් මිලියන 174 කි.

ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයන නිම කර ඇති අතර, පාරිසරික බලපෑම් අධ්‍යයනය වාර්තාව සඳහා අනුමැතිය ලැබී ඇත.

## 6. ක්‍රියාත්මක කරනු ලබන ආයතන යටතේ ව්‍යාපෘති/වැඩසටහන් වල කාර්යසාධනය

### අ. වාරිමාර්ග දෙපාර්තමේන්තුව

#### 1.0 හැඳින්වීම

වසර 110 කට පෙර ආරම්භ කරන ලද අධි ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වන වාරිමාර්ග දෙපාර්තමේන්තුව වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගේ මග පෙන්වීම යටතේ එහි කාර්යයන් මෙහෙයවන අතර, මෙම දෙපාර්තමේන්තුව වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ රජයේ ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර දිවයින තුල ඇති ජලය යාමකව පාලනය කරන ප්‍රධානතම රාජ්‍ය ආයතනය වේ.

#### 1.1 දැක්ම

"අහසින් වැටෙන එක දිය බිඳුවකුදු ලෝකෝපකාරයෙන් තොරව මුහුදට ගලා යා නොදෙනු" යන මහා පරාක්‍රමබාහු රජතුමාගේ පාඨය ගුරුතැන්හිලා, පරිසරයද සුරකමින්, තිරසාර ආර්ථික හා සමාජ සංවර්ධනය සහතික කරනු සඳහා රටේ ජල සම්පත් වලින් ලබාගත හැකි ප්‍රයෝජන ප්‍රශස්ත මට්ටමට ගෙන ඒම.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ දැක්ම වනුයේ සෑම වැසි ජල බිඳුවක්ම පරිසර හිතකාමී ලෙස තිරසාර අයුරින් මිනිසාගේ යහපත සඳහා යොදා ගැනීමයි.

#### 1.2 මෙහෙවර

කෘෂිකර්මයට සෘජුවමත්, පාරසරික, ගෘහස්ත, කාර්මික හා විදුලිජනක අවශ්‍යතා සඳහා වක්‍රවත් අවශ්‍ය ජලය සැපයීම සඳහා සමාන්තර ආයතන සමඟ සහයෝගයෙන් රටේ සම්පත් භාවිතයට ගැනීම, සංවර්ධනය, සංරක්ෂණය, පාලනය, බෙදාහැරීම හා කළමනාකරණය මඟින් එම සම්පත් වලින් රටට උපරිම ප්‍රතිලාභය ලබාදීම.

#### 1.3 අරමුණු

(අ) වාරි කෘෂිකර්මය, ජල විදුලි නිෂ්පාදනය, ගංවතුර ආරක්ෂනය, ගෘහස්ත ප්‍රයෝජනය, කාර්මික ප්‍රයෝජනය, ජල ජීවී වගාව ආදිය සඳහා පරිසරයට හිතකාමී ලෙස ජල සම්පත් සහ ඉඩම් සංවර්ධනය.

(අ) වාරි හා ජල අපවහන ව්‍යාපෘතිවල ඇති වගා කළ හැකි ඉඩම් සඳහා වාරි ජල අපවහන පද්ධතීන් සැපයීම හා මුහුදු ජලය ගලා ඒම වැලැක්වීම.

(ආ) ගංවතුර අවධානම ඇති ඉඩම්වලට ගංවතුර ආරක්ෂන හා ජල අපවහනය පද්ධතීන් සැපයීම.

(ඇ) ග්‍රාමීය ජනයාගේ ගොවි ආදායම් වැඩි කිරීම තුලින් ඔවුන්ගේ ජීවන තත්වය නගා සිටුවීම සහ ග්‍රාමීය ප්‍රදේශවල දිළිඳුකම තුරන් කිරීම.

(ඈ) තිරසාර කෘෂිකර්මය සඳහා ජල කළමනාකරණය.

(ඉ) විශාල සහ මධ්‍යම ප්‍රමාණයේ වාරිමාර්ග ව්‍යාපෘතීන් සඳහා ජලය සහ ඉඩම් සඳහා වූ ඵලදායීතා වර්ධනය.

(ඊ) විශාල සහ මධ්‍යම ප්‍රමාණයේ වාරිමාර්ග පද්ධති සඳහා ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණය සහ සහාභාගීත්ව කළමනාකරණය.

## 1.4 කාර්යයන්

(අ.) ජලය හා ඉඩම් වලින් උපරිම එල ප්‍රයෝජන ලැබෙන පරිදි පාරිසරික සාධක වලට ප්‍රමුඛත්වය දෙමින් ගංභාද්‍රෝණි සංවර්ධනය සම්බන්ධයෙන් ප්‍රධාන සැලසුම් සකස් කිරීම.

(ආ.) වාරිමාර්ග ජල විදුලිය, ගංවතුර පාලනය සඳහා නව ව්‍යාපෘති සඳහා සවිස්තර සැලසුම් සකස් කිරීම.

(ඇ.) නව හා පවතින ගොවිතැන් කල හැකි ඉඩම් වල අස්වැන්න වැඩි කිරීම සඳහා ගුරුත්ව හා උස්සාන වාරිමාර්ග ක්‍රම යටතේ ජල සංරක්ෂණය හැරවීම හා බෙදා හැරීම සිදු කිරීම සඳහා නව ව්‍යාපෘති ඉදිකිරීම සහ ගොවීන් පදිංචි කිරීමේ ව්‍යාපෘති සැකසීම.

(ඈ.) ජලාපවහන ගංවතුර පාලන සහ ලවණ දිය බැහැර කිරීම ව්‍යාපෘති ඉදි කිරීම මගින් එම බලපෑම් ඇති ඉඩම් වල ගොවිතැන් කිරීමේ කටයුතු අවදානමකින් තොරව කරගෙන යාමට ඉඩ සැලසීම.

(ඉ.) විශාල සහ මධ්‍යම ප්‍රමාණයේ ගුරුත්ව, අපවහන සහ උස්සාන වාරි ව්‍යාපෘතීන් හි මෙහෙයුම්, නඩත්තු කිරීම්, වැඩිදියුණු කිරීම්, පුනරුත්ථාපනය කිරීම සහ ජල කළමනාකරණය කිරීම.

(ඊ.) ජල ශක්ති, ජල විද්‍යා, ඉංජිනේරු ද්‍රව්‍ය, ඉංජිනේරු භූවිද්‍යා, භූවිද්‍යාත්මක තොරතුරු, ඉඩම් පරිහරණයන්හි පර්යේෂණ ජල සම්පත් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති සඳහා යොදවා ගැනීම.

(උ.) මානව සම්පත් උපරිම ලෙස භාවිතා කිරීම සඳහා මානව සම්පත් සංවර්ධනය.

(ඌ.) රජයේ මූල්‍ය රෙගුලාසි වලට අනුකූලව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ විගණන පද්ධතිය, ගිණුම් වාර්තා කිරීම, මූල්‍ය කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම.

(එ.) ජල සම්පත් වැඩි දියුණු කිරීම, අත්තිවාරම්, පස් වැඩ වල සහ කොන්ක්‍රීට් වැඩ වල තත්ව පාලනය, ජල ශක්ති ආකෘති පරීක්ෂාවට ලක් කිරීම, ඉඩම් පරිහරණ සැලසුම් සෑදීම සම්බන්ධව රාජ්‍ය දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සංස්ථා පොදු හා පෞද්ගලික ආයතන සඳහා උපදේශන සේවා සැපයීම.

## 2.0 වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වගා කාර්ය සාධනය

**2.1.** දිස්ත්‍රික්ක අනුව 2015/ 2016 මහ කන්නයේදී සහ 2016 යල කන්නයේදී වගා කළ බිම් ප්‍රමාණය පහත දැක්වේ.

**1 වගුව:- 2015/2016** මහා පරිමාණ වාරි ව්‍යාපාරවල මහ කන්නයෙහි වගා කළ බිම් ප්‍රමාණය

| නො. | දිස්ත්‍රික්කය | බිම් ප්‍රමාණය දළ වශයෙන් (හෙක්.) | වගා කළ බිම් ප්‍රමාණය (හෙක්.) | | | දිස්ත්‍රික්ක ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | | | වී වගාව | අතිරේක භෝග | එකතුව | |
| 1. | අම්පාර | 153,260 | 134,881 | 10,745 | 145,626 | 95% |
| 2. | අනුරාධපුර | 66,087 | 61,845 | 710 | 62,555 | 95% |
| 3. | බදුල්ල | 19,701 | 16,729 | 2,916 | 19,645 | 100% |
| 4. | මඩකලපුව | 50,772 | 48,224 | 0 | 48,224 | 95% |
| 5. | කොළඹ | 1,700 | 1,300 | 0 | 1,300 | 76% |
| 6. | ගම්පහ | 6,062 | 6,062 | 0 | 6,062 | 100% |
| 7. | රත්නපුර | 4,387 | 4,287 | 100 | 4,387 | 100% |
| 8. | ගාල්ල | 2,265 | 0 | 0 | 0 | 0% |
| 9. | මාතර | 24,366 | 10,888 | 0 | 10,888 | 45% |
| 10. | හම්බන්තොට | 58,866 | 54,811 | 2,000 | 56,811 | 97% |
| 11. | නුවර | 17,812 | 17,452 | 360 | 17,812 | 100% |
| 12. | නුවරඑළිය | 1,616 | 1,293 | 323 | 1,616 | 100% |
| 13. | මාතලේ | 5,000 | 5,000 | 0 | 5,000 | 100% |
| 14. | කුරුණෑගල | 38,155 | 38,155 | 0 | 38,155 | 100% |
| 15. | මොණරාගල | 10,257 | 7,106 | 0 | 7,106 | 69% |
| 16. | පොළොන්නරුව | 85,313 | 74,123 | 1,340 | 75,463 | 88% |
| 17. | පුත්තලම | 13,202 | 11,384 | 950 | 12,334 | 93% |
| 18. | ත්‍රිකුණාමලය | 55,816 | 53,816 | 0 | 53,816 | 96% |
| 19. | වව්නියාව | 4,135 | 4,135 | 0 | 4,135 | 100% |
| 20. | මන්නාරම | 31,892 | 31,892 | 0 | 31,892 | 100% |
| | එකතුව | **650,664** | **583,384** | **19,444** | **602,828** | **93%** |

**2 වගුව:- 2015/ 2016** මධ්‍යම පරිමාණ වාරි ව්‍යාපාරවල මහ කන්නයෙහි වගා කළ බිම් ප්‍රමාණය

| නො. | දිස්ත්‍රික්කය | බිම් ප්‍රමාණය දළ වශයෙන් (හෙක්.) | වගා කළ බිම් ප්‍රමාණය (හෙක්.) | | | දිස්ත්‍රික්ක ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | | | වී වගාව | අතිරේක භෝග | එකතුව | |
| 1. | අම්පාර | 3,783 | 3,781 | 0 | 3,781 | 100% |
| 2. | අනුරාධපුර | 30,930 | 26,243 | 0 | 26,243 | 85% |
| 3. | බදුල්ල | 3,300 | 2,175 | 925 | 3,100 | 94% |
| 4. | මඩකලපුව | 4,587 | 4,574 | 0 | 4,574 | 100% |
| 5. | කොළඹ | 438 | 300 | 0 | 300 | 68% |
| 6. | ගම්පහ | 5,492 | 4,100 | 0 | 4,100 | 75% |
| 7. | කළුතර | 350 | 0 | 0 | 0 | 0% |
| 8. | රත්නපුර | 2,269 | 1,519 | 80 | 1,599 | 70% |
| 9. | ගාල්ල | 734 | 0 | 0 | 0 | 0% |
| 10. | මාතර | 4,170 | 3,770 | 0 | 3,770 | 90% |
| 11. | හම්බන්තොට | 2,505 | 2,505 | 0 | 2,505 | 100% |
| 12. | නුවර | 2,743 | 2,031 | 389 | 2,420 | 88% |
| 13. | නුවරඑළිය | 1,929 | 1,311 | 117 | 1,428 | 74% |
| 14. | මාතලේ | 5,275 | 3,421 | 218 | 3,639 | 69% |
| 15. | කුරුණෑගල | 7,435 | 6,856 | 80 | 6,936 | 93% |
| 16. | මොණරාගල | 8,995 | 6,644 | 146 | 6,790 | 75% |
| 17 | පොළොන්නරුව | 2,907 | 2,634 | 82 | 2,716 | 93% |
| 18. | පුත්තලම | 3,969 | 3,400 | 0 | 3,400 | 86% |
| 19. | ත්‍රිකුණාමලය | 600 | 600 | 0 | 600 | 100% |
| 20. | වව්නියාව | 2,681 | 2,309 | 0 | 2,309 | 86% |
| | එකතුව | **95,091** | **78,172** | **2,037** | **80,209** | **84%** |

**3 වගුව:- 2016 මහා පරිමාණ වාරි ව්‍යාපාරවල යල කන්නයෙහි වගා කළ බිම් ප්‍රමාණය**

| නො. | දිස්ත්‍රික්කය | බිම් ප්‍රමාණය දළ වශයෙන් (හෙක්.) | වගා කළ බිම් ප්‍රමාණය (හෙක්.) | | | දිස්ත්‍රික්ක ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | | | වී වගාව | අතිරේක භෝග | එකතුව | |
| 1. | අම්පාර | 153,260 | 136,197 | 11,489 | 147,686 | 96% |
| 2. | අනුරාධපුර | 66,087 | 37,471 | 10,299 | 47,770 | 72% |
| 3. | බදුල්ල | 19,701 | 5,929 | 6,750 | 12,679 | 64% |
| 4. | මඩකලපුව | 50,772 | 31,845 | 0 | 31,845 | 63% |
| 5. | කොළඹ | 1,700 | 700 | 0 | 700 | 41% |
| 6. | ගම්පහ | 6,062 | 32,645 | 0 | 32,645 | 539% |
| 7. | රත්නපුර | 4,387 | 3,573 | 630 | 4,203 | 96% |
| 8. | ගාල්ල | 2,265 | 2,090 | 0 | 2,090 | 92% |
| 9. | මාතර | 24,366 | 7,457 | 0 | 7,457 | 31% |
| 10. | හම්බන්තොට | 58,866 | 50,820 | 2,237 | 53,057 | 90% |
| 11. | නුවර | 17,812 | 15,489 | 760 | 16,249 | 91% |
| 12. | නුවරඑළිය | 1,616 | 1,293 | 323 | 1,616 | 100% |
| 13. | මාතලේ | 5,000 | 2,210 | 975 | 3,185 | 64% |
| 14. | කුරුණෑගල | 38,155 | 31,494 | 2,504 | 33,998 | 89% |
| 15. | මොණරාගල | 10,257 | 3,406 | 450 | 3,856 | 38% |
| 16. | පොළොන්නරුව | 85,313 | 81,137 | 1,650 | 82,787 | 97% |
| 17 | පුත්තලම | 13,202 | 8,657 | 525 | 9,182 | 70% |
| 18. | ත්‍රිකුණාමලය | 55,816 | 25,473 | 648 | 26,121 | 47% |
| 19. | වව්නියාව | 4,135 | 1,089 | 350 | 1,439 | 35% |
| 20. | මන්නාරම | 31,892 | 4,182 | 400 | 4,582 | 14% |
| | එකතුව | **650,664** | **483,156** | **39,990** | **523,145** | **80%** |

**4 වගුව:- මධ්‍යම පරිමාණ වාරි ව්‍යාපාරවල 2016 යල කන්නයෙහි කළ බිම් ප්‍රමාණය**

| නො. | දිස්ත්‍රික්කය | බිම් ප්‍රමාණය දළ වශයෙන් (හෙක්.) | වගා කළ බිම් ප්‍රමාණය (හෙක්.) | | | දිස්ත්‍රික්ක ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | | | වී වගාව | අතිරේක භෝග | එකතුව | |
| 1. | අම්පාර | 3,783 | 1,776 | 0 | 1,776 | 47% |
| 2. | අනුරාධපුර | 30,930 | 12,688 | 379 | 13,067 | 42% |
| 3. | බදුල්ල | 3,300 | 0 | 1,800 | 1,800 | 55% |
| 4. | මඩකලපුව | 4,587 | 2,671 | 0 | 2,671 | 58% |
| 5. | කොළඹ | 438 | 102 | 0 | 102 | 23% |
| 6. | ගම්පහ | 5,492 | 2,430 | 0 | 2,430 | 44% |
| 7. | කළුතර | 350 | 350 | 0 | 350 | 100% |
| 8. | රත්නපුර | 2,269 | 939 | 150 | 1,089 | 48% |
| 9. | ගාල්ල | 734 | 454 | 0 | 454 | 62% |
| 10. | මාතර | 4,170 | 3,870 | 0 | 3,870 | 93% |
| 11. | හම්බන්තොට | 2,505 | 1,275 | 0 | 1,275 | 51% |
| 12. | නුවර | 2,743 | 930 | 1,272 | 2,202 | 80% |
| 13. | නුවරඑළිය | 1,929 | 651 | 364 | 1,015 | 53% |
| 14. | මාතලේ | 5,275 | 2,294 | 2,280 | 4,574 | 87% |
| 15. | කුරුණෑගල | 7,435 | 5,552 | 204 | 5,756 | 77% |
| 16. | මොණරාගල | 8,995 | 5,290 | 939 | 6,229 | 69% |
| 17 | පොළොන්නරුව | 2,907 | 1,563 | 355 | 1,918 | 66% |
| 18. | පුත්තලම | 3,969 | 3,075 | 115 | 3,190 | 80% |
| 19. | ත්‍රිකුණාමලය | 600 | 600 | 0 | 600 | 100% |
| 20. | වව්නියාව | 2,681 | 550 | 370 | 920 | 34% |
| | එකතුව | **95,091** | **47,060** | **8,228** | **55,288** | **58%** |

## 2.2 2015/16 මහ කන්නයේ ජල කළමනාකරණය

### මහ 2015/16

දෙවන අන්තර් මෝසම සුළු වශයෙන් ක්‍රියාත්මක වු අතර 2015/ 16 මහ කන්නය ආරම්භයේදී 73ක් වු ප්‍රධාන ජලාශවල ජල ප්‍රතිශතය 50%ක් විය. ඊසාන දිග මෝසම් කාලවකවානු තුළ සැලකිය යුතු වර්ෂාපතනයක් ප්‍රධාන ජලාශ 73ට ලැබුණි. එම නිසා ජලාශයන්හි ධාරිතාව 2016 ජනවාරි 7 වනදා වන විට 94%ක් දක්වා වැඩි විය.

2015/16 මහ කන්නයේදී ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම මඟින් 93%ක් සහ මධ්‍යම යෝජනා ක්‍රම මඟින් 84%ක වගා කටයුතු අවසන් කෙරුණි.

### යල 2016

පළමු අන්තර් මෝසම සුළු වශයෙන් ක්‍රියාත්මක වු අතර 2016 අප්‍රේල් මස ආරම්භය වන විට ප්‍රධාන ජලාශ 73හි 84%ක ජල ප්‍රමාණයක් තිබුණි. නමුත් මහවැලි යෝජනා ක්‍රමය යටතේවු සමහර ජලාශ වල ජල ධාරිතාව අඩුවු අතර විශේෂයෙන් ගාමිණි දිසානායක ජලාශයේ (කොත්මලේ) ජල ධාරිතාව 31.3%ක් පමණ අඩු මට්ටමක පැවතුණි. එහෙයින් මහවැලි යෝජනා ක්‍රමය යටතේ වගා කරන ප්‍රමාණය අඩු කිරීමට තීරණ ගන්නා ලදී.

2016 මැයි මාසයේ මැද භාගයේ ඇතිවු සුළි සුළං කාළගුණය හේතුවේන් රටේ මධ්‍යම කඳුකරයේ සියලු වැව් පිරීගිය අතර කැළණි ගඟේ ගංවතුර තත්වයක් ද ඇති විය.
යල කන්නයේදී ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම යටතේ 80%ක් ද මධ්‍යම වාරිමාර්ග යෝජනා ක්‍රම යටතේ 58%ක් පමණ වගා කටයුතු සිදු කරන ලදී.

## 2.3 වාරි ඵලදයීතා වැඩි දියුණු කිරීම.

2013 වර්ෂයේ දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගතකරණය යටතේ නව අංශයක් ස්ථාපිත කරන ලදී. එහි අරමුණ වුයේ ගොවි ජනතාවගේ ආර්ථික තත්වය උසස් කිරීම සඳහා නවීන ඒකාබද්ධ කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීමය. සහභාගීත්ව කළමනාකරණය මඟින් භූමි ඒකකයක් සඳහා උපරිම ප්‍රතිඵලාභදායී ලෙස ජල ඒකකයක් භාවිත කිරීම සඳහා යොමු කිරීමට හැකිය.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් අක්කර 756000ක භූමි ප්‍රමාණයක් වාරි ජලය සපයා නඩත්තු කරන අතර ඒවයින් 75%ක් ප්‍රධාන වාරිමාර්ග සහ 340ක් වාරිමාර්ග යෝජනා ක්‍රම මඟින් සිදුකරනු ලබයි.

එහෙයින් සහල් නිෂ්පාදයෙන් 75%ක ප්‍රමාණයක් සපුරනු ලබනුයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ජලය සපයනු ලබන භූමි ප්‍රමාණ තුළිනි. එහෙයින් අප සහලින් ස්වයංපෝෂිත බවට පත්ව ඇති අතර අප රටට ආනයනය කරනු ලබන අනෙකුත් කෘෂිභෝග පිළිබඳ අවධානය යොමු කරමින් සිටිමු.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව රටේ ජල සම්පත සංවර්ධනයට සැලසුම් වැඩි වැඩියෙන් සකස් කළද ජලය සපයනු ලබන භූමි ප්‍රමාණය මහ පරිමාණයෙන් වැඩි කිරීම මහත් අභියෝගයක් වී ඇත.

රටේ වනාන්තර, මිනිස් වාසස්ථාන සහ අනෙකුත් කාර්මාන්ත සඳහා යොදා ගන්නා ලද භූමි ප්‍රමාණය සැලකිල්ලට ගත් විට ඉතිරි භූමි ප්‍රමාණයේ ඵලදායිතාව වැඩි දියුණු කිරීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුව දැඩි අවධානයක් යොමු කරමින් සිටී.

මේ සමඟම රජය විසින් ජාතික ආහාර සුරක්ෂිත කිරීමේ ව්‍යාපෘති සහ **"වස විස නැති රටක්"** නමින් ජාතික වැඩසටහන් හඳුන්වා දී ඇත. එම නව අදහස් පැහැදිලි කිරීම සඳහා 2016 වසර තුළ පහත දැක්වෙන ක්‍රියාකාරකම් වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් දියත් කර ඇත.

**1. ව්‍යාපෘති කළමනාකරුවන් සහ ක්ෂේත්‍ර නිළධාරීන් පුහුණු කිරීම.**

වාරිමාර්ග දෙපාර්තමේන්තුව වැනි ආයතන වල නව වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ක්ෂේත්‍ර නිළධාරීන් පුහුණු කිරීම ඉතා වැදගත් වේ. නව වප් හවුල වැඩසටහන යටතේ නවක ව්‍යාපෘති කළමනාකරුවන් කාණ්ඩායම් 2ක් පුහුණු කරන ලදී.





ව්‍යාපෘති කළමනාකරුවන් පුහුණු කිරීම - කොත්මලේ ජාත්‍යන්තර පුහුණු ආයතනය - පෙබරවාරි -2016

**2. අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් වාරිමාර්ග ගොවීන් සඳහා ජාතික සමුළුවක් බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී පවැත්වීම.**

වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් වාරිමාර්ග ගොවීන් සඳහා ජාතික සමුළුවක් (ජාතික වාරි ගොවි සමුළුව) බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී 2016 අප්‍රේල් මස 06 වන දින පවත්වන ලදී. එහිදී ගොවීන් විසින් ගැටළු රාශියක් එනම්, ඉදිකිරීම් වල, නඩත්තු කිරීම් වල, ජල හිඟකම සහ රජය විසින් අලුතින් හඳුන්වා දුන් පොහොර සහනාධාරපිළිබඳවද ප්‍රශ්න, ඉදිරිපත් කරන ලදී. ගරු වාරිමාර්ග සහ ජල සම්පත් කළමනාකරණ ඇමතිතුමා ගොවීන් විසින් නගන ලද ප්‍රශ්න සම්බන්ධව ඉතා සංවේදීව අවධානය යොමු කළ අතර ඔවුන්ගේ ගැටළු නිරාකරණය කිරීමට පියවර ගන්නා ලදී.

මෙම සමුළුවේදී ගොවීන් මුහුණ දෙන ගැටළු විසඳීමට අමතරව ඔවුන් බහුලව මුහුණදෙන සෞඛ්‍ය ගැටළුවක් වනවකුගඩු රෝගය පිළිබඳව දැනුවත් කිරීමේ දේශනයක් රජරට විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වෛද්‍ය චන්න ජයසුමන මහතා විසින් පවත් වන ලදී.






### 3. ජාතික ආහාර සුරක්ෂිතතා වැඩසටහන සහ "වස විස නැති රටක්" වැඩසටහන

ඉහත වැඩසටහන් කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් සංවිධානය කරන ලද අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුව ක්ෂේත්‍ර මට්ටමින් දායකත්වය සපයන ලද අතර කෘෂිකර්මදෙපාර්තමේන්තුව මඟින් බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී 2016 මාර්තු 06 වනදා සිට 08 වනදා තෙක් පවත්වන ලද ජාතික ප්‍රදර්ශනයට ද වාරිමාර්ග දෙපාර්තමේන්තුව දායකත්වය සපයන ලදී.





ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම මඟින් අනෙකුත් භෝග වගා කිරීම





2016 මාර්තුමස බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලද "වස විස නැති රටක්" ප්‍රදර්ශනය

### 4. සම්ප්‍රදායික වී වගා වැඩසටහන සහ කාබනික පොහොර වැඩසටහන

මෙම වැඩසටහන් අනුරාධපුර, පොළොන්නරුව, මොණරාගල, බදුල්ල, ගාල්ල, මාතර, හම්බන්තොට සහ නුවර යන දිස්ත්‍රික්ක වල නියමු ව්‍යාපෘතියක් ලෙස සුළු පරිමාණයෙන් ක්‍රියාත්මක කර සාර්ථක ප්‍රතිඵල ලබා ගන්නා ලදී. නමුත්, සම්ප්‍රදායික වී වගාව දියුණු කිරීමේදී අලෙවිකරණ ප්‍රශ්න ඇති බව නිරීක්ෂණය වන ලදී.





**5. වාරිමාර්ග යෝජනා ක්‍රම වල අක්‍රමණික ජලජ ශාක විශේෂ ව්‍යාප්තිය කළමනාකරණය කිරීම.**

(i) වාරිමාර්ග යෝජනා ක්‍රමවල පැතිර පවත්නා ජපන් ජබර (Eichhornia Crassipes), සැල්වේනියා (Molesta), දියහවරිය (Velisneria Spiralis), හයිඩ්‍රිල්ලා (Hydrilla Verticillara) යනාදී අක්‍රමණික ජලජ ශාඛ විශේෂ ව්‍යාප්ත වීම ප්‍රධාන ගැටළුවක් බවට පත්වී ඇත. එමඟින් සැලකිය යුතු ආර්ථික හානියක් වාරිමාර්ග යෝජනා ක්‍රම වලට සිදුකරන බව හඳුනාගෙන ඇත.





පරාක්‍රම සමුද්‍රයේ සැල්වේනියා (Molesta) ඉවත් කිරීම

(ii) වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශයේ සහයෝගය ලබා ගනිමින් යාන්ත්‍රික සහ ජීව විද්‍යාත්මක ක්‍රම මඟින්අක්‍රමණික ජලජ ශාක ව්‍යාප්තිය පාලනය කිරීමට වැඩසටහන් සංවිධානය කරන ලදී. 2016 ජුලි මස දී කොත්මලේ පුහුණු ආයතනයේදී වාරිමාර්ග කාර්ය මණ්ඩලයට සහ පුහුණු වන පුහුණුකරුවන්ට අක්‍රමණික ජලජ ශාක විශේෂ සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.





(ii) තෝරා ගන්නා ලද වාරි යෝජනා ක්‍රම 5ක (පරාක්‍රම සමුද්‍රය, හල්මිල්ල වැව, නීල බැම්ම, බෙන්තර දකුණු ඉවුර, කරවිල වැව) සියලුම ආක්‍රමණික ජලජ පැළෑටි නියෝජනය වන අයුරින් මූලික විමර්ශන වාර්තාවක් පරිසර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී. මේ හේතුව මත සමාජයීය ආර්ථික ගැටළුකාරී තත්ව හඳුනාගෙන ඇති අතර වාරි යෝජනා ක්‍රම වල ආක්‍රමණික ජලජ පැළෑටි පාලනය කිරීම සඳහා අවශ්‍ය පියවර නිර්දේශ කර ඇත.




(iii) වාරිමාර්ග යෝජනා ක්‍රමයන්හි මූලික විමර්ශන කටයුතු වල ප්‍රතිපල මත පදනම්ව ආක්‍රමණික ජලජ පැළෑටි විශේෂ ජීව විද්‍යාත්මක පාලන ක්‍රම හරහා සැලකිය යුතු මට්ටමකට පාලනය කිරීමට පර්යේෂණාත්මක අධ්‍යනයක් සිදු කිරීමට යෝජනා කර ඇත. ඒ අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය හා එක්ව පර්යේෂණ අධ්‍යන කටයුතු සිදුකිරීමට අවබෝධතා ගිවිසුමකට එළඹ ඇති අතර එහි වාර්තාව 2017 මාර්තු මස වන විට දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමට නියමිතය.




## 6. ජාතික රුක් රෝපණ ව්‍යාපෘතිය

රුක් රෝපණ ව්‍යාපෘතියට සමගාමීව වාරිමාර්ග රක්ෂිත ආරක්ෂා කිරීමේ විශේස ව්‍යාපෘතියක් ජනාධිපති ලේකම් කාර්යාලීය මඟ පෙන්වීම යටතේ 2016 වසරේ ද ක්‍රියාත්මක විය. මේ යටතේ 20000 වඩා වාරිමාර්ග කොට්ඨාශ සෑම එකකටම පාහේ බෙදා හරින ලද අතර සාර්ථක ප්‍රගතියක් ළඟා කරගන්නා ලදී.




7. විවිධ අධ්‍යාපන ආයතන සහ පාසල් වල ජාතික වැඩමුළු වලදී වාරිමාර්ග තාක්ෂණය ප්‍රදර්ශණය කර පැහැදිලි කිරීමට බොහෝ ඉල්ලීම් දෙපාර්තමේන්තුවට ලැබේ. මෙම ඉල්ලීම් සපුරා ගැනීම පිණිස කොළඹ රාජකීය විද්‍යාලය සහ නුගේගොඩ අනුලා විද්‍යාලයේදී ප්‍රදර්ශණාගාර කුටියක් පවත් වන ලදී.





8. ඒකක කාර්යාල ප්‍රතිශ්ඨාපනය

වාරිමාර්ග ඉංජිනේරු කොට්ඨාශ කාර්යාල මඟින් විශාල ගොවිබිම් ප්‍රමාණයක් ආවරණය කෙරේ. මේ හේතුව නිසා ගොවීන්ට විවිධ සේවා ලබා ගැනීම සඳහා වැඩිදුරක් ගෙවා පැමිණීමට සිදුවිය. මෙම අපහසුතාවය ඉවත් කිරීම පිණිස වාරිමාර්ග යෝජනා ක්‍රම සඳහා අත්හැර දැමු ගොඩනැගිලි භාවිතයට ගනිමින් ඒකක කාර්යාල හඳුන්වා දෙන ලදී. මෙම ව්‍යාපෘතිය 2014 ආරම්භ කරන ලද අතර යහපත් ප්‍රගතියක් අත්කරගන්නා ලදී. 2016 වසර අගභාගය වන විට සැලසුම් කළ ඒකක කාර්යාල 215න් 175ක් පමණ පිහිටුවා අවසන් කොට ඇත.





9. ලෝක ජල දිනය සෑම වසරකම 2016 මාර්තු මස 22 දිනට යෙදී තිබෙන අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කළ උත්සවය ප්‍රධාන කාර්යාලයේදී පැවැත්වූ අතර වාරිමාර්ග කොට්ඨාශ ඉංජිනේරු මට්ටමින් පාසල් දරු දැරියන් දැනුවත් කිරීමේ විවිධ වැඩසටහන් පවත්වන ලදී.

**10.** ලෝක පරිසර දිනය ජුනි 5 වන දින උත්සවාකාරයෙන් සමරනු ලැබූ අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුව ඒ වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන පවත්වන ලදී. රුක් රෝපණ වැනි වැඩසටහන් මේ අනුව සිදු කරන ලදී.

## 3.0 වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිවල වර්තමාන තත්වය

2016 වර්ෂය මූලධන වියදම් සඳහා රුපියල් මිලියන13,571.43 ක ප්‍රතිපාදන ඇති අතර වර්ෂයේ දෙසැම්බර් මස අවසානය වන විට වියදම රුපියල් මිලියන 10,352.07කි. එක් එක් අයිතමය සඳහා ලබා දී ඇති ප්‍රතිපාදනය හා දෙසැම්බර් මස වන විට ප්‍රගතිය පහත දැක්වේ.

**මූලධන වියදම් සාරාංශය**

| ව්‍යාපෘතියේ නම | 2016 වර්ෂය සඳහා සංශෝධිත ප්‍රතිපාදන (රු. මිලියන) | 2016 දෙසැම්බර් අවසාන විට වියදම (රු.මිලියන) |
|---|---|---|
| ව්‍යාපෘති 01<br>පරිපාලන හා ආයතනික සේවා | 43.10 | 42.28 |
| ව්‍යාපෘති 02<br>වාරි ව්‍යාපාරවල පරිපාලන හා නඩත්තුව | 2,305.50 | 2030.05 |
| ව්‍යාපෘති 03<br>මහා පරිමාණ වාරි ව්‍යාපාර | 10,833.77 | 8020.42 |
| ව්‍යාපෘති 04<br>මධ්‍යම පරිමාණ වාරි ව්‍යාපාර | 389.06 | 260.97 |
| මුළු එකතුව | **13,571.43** | **10,353.73** |

**පුනරාවර්තන වියදම් සාරාංශය**

| ව්‍යාපෘතියේ නම | 2016 වර්ෂය සඳහා සංශෝධිත ප්‍රතිපාදන (රු. මිලියන) | 2016 දෙසැම්බර් අවසාන විට වියදම (රු.මිලියන) |
|---|---|---|
| **ව්‍යාපෘති 01**<br>පරිපාලන හා ආයතනික සේවා | 672.96 | 622.46 |
| **ව්‍යාපෘති 02**<br>වාරි ව්‍යාපාරවල පරිපාලන හා නඩත්තුව | 2,339.39 | 2,246.65 |

**මහා පරිමාණ වාරි ව්‍යාපෘති**

01 දැදුරු ඔය ජලාශය

02 මැණික් ගඟ ජලාශය (වෙහෙරගල)

03 රඹුක්කන් ඔයජලාශය

04 පහල ඌව ව්‍යාපෘතිය

05 යාන්ඔයව්‍යාපෘතිය

06 මහගෝනා වැව ව්‍යාපෘතිය

07 ගල්ඔය නවෝදය

08 තෝරාගත් අත්‍යවශ්‍ය මහා වාරි ව්‍යාපාර ප්‍රතිසංස්කරණය

09 මොරාණ ජලාශය

10 ඇල්ලේ වැව ජලාශය

11 කලුගල්ඔය ජලාශය

12 කුඹුක්කන් ඔය ජලාශය

13 රුගම් කිතුල් ජලාශය

**මධ්‍යම පරිමාණ වාරි ව්‍යාපෘති**

14 ගුරුගල් ඔය ව්‍යාපෘතිය

15 ගෝනගල්තැන්න වැව

16 කවුඩුල්ල පියවර 11 දම්සෝපුර දක්වා වම් ඉවුර ඇල දිගුව

17 මහගල්ගමුව වැව නඟා සිටුවීම

18 පෙතියාගොඩ පොම්පාගාරය ඉදිකිරීම

19 ගිංගඟ ගංවතුර පාලන ව්‍යාපෘතිය පුනරුත්ථාපනය කිරීම

20 බෙන්තර ගඟ දකුණු ඉවුර කරදිය ගලා ඒම වැළැක්වීමේ ව්‍යපෘතිය පුනරුත්ථාපනය

## මහා පරිමාණ වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ විස්තර

### 3.1 දැදුරු ඔය ජලාශ ව්‍යාපෘතිය

| | |
|---|---|
| පිහිටීම | :කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්ක |
| ජලාශ ධාරිතාවය | :ඝන මීටර මිලියන 75 |
| වාරි වපසරිය | : අක්කර27,000 |
| ප්‍රතිලාභීන් | :ගොවි පවුල් 11,500 |
| ඇස්තමේන්තු පිරිවැය | :රු. මිලියන 13,540 |
| වම් ඉවුර ප්‍රධාන ඇළ | :කි.මී. 45 |
| දකුණු ඉවුරු අන්තර් නිම්න ඇළ | :කි.මී. 36.5 |

මේ වන විට දැදුරු ඔය ජලාශය මගින් ඉඟිනිමිටිය ජලාශය (පුත්තලම දිස්ත්‍රික්කය), මාගල්ල ජලාශය (නිකවැරටිය), වාරියපොළ, කොටවෙහෙර, කොබෙයිගනේ සහ මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල කුඩා වැව් 300කට පමණ ජලය සපයනු ලබයි. ඉහත ප්‍රදේශයන්හි අක්කර 30,000කට වඩා වැඩි භූමි ප්‍රමාණයක් යල, මහා දෙකන්නයේදී වගා කරන ලදී.

ව්‍යාපෘතියේ මුලස්ථායී වැඩ සහ දකුණු ඉවුර අන්තර් බෙසම් ඇළ කි.මී. 25 – කි.මී. 36 දක්වා අවසන් කර ඇති අතර 2014 නොවැම්බර් 22 වැනි දින අතිගරු ජනාධිපතිතුමා විසින් ව්‍යාපෘතිය විවෘත කර මංගල දියවර මුදාහරින ලදි.

2016 දෙසැම්බර් මස වන විට මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි. 11456.83ක් වියදම් කර ඇති අතර ව්‍යාපෘතිය අවසන් කර ඇත. මෙයට අමතරව පානීය ජල සැපයුම් ව්‍යාපෘතියක් දැදුරු ඔය ජලාශ ව්‍යාපෘතිය මගින් අරඹා ඇති අතර එමඟින් පවුල් 3000කට පමණ පානීය ජල පහසුකම් ලබාදේ.

දැදුරු ඔය ජලාශ ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ පහළ දැදුරු ඔය ජලාශ ව්‍යාපෘතිය මගින් අබලන්ව ඇති සෙංගල් ඔය අමුණ සංවර්ධනය කිරීම සිදු කරනු ලබයි. මේ සඳහා ප්‍රතිපාදන රු.මි. 1000ක් වන අතර අක්කර 3500කට පමණ මෙමගින් ජල පහසුකම් සැපයේ. 2016 දෙසැම්බර් මස වන විට 19% භෞතික ප්‍රගතියක් ළඟා කරගෙන ඇත.

### 3.2 වෙහෙරගල ජලාශ ව්‍යාපෘතිය

| | |
|---|---|
| පිහිටීම | : හම්බන්තොට දිස්ත්‍රික්කය |
| ජලාශ ධාරිතාවය | : ඝන මීටර මිලියන 64 |
| වාරි වපසරිය | : හෙක්ටයාර 10,000 |
| ප්‍රතිලාභීන් | : ගොවි පවුල් 8,000 |
| ඇස්තමේන්තු පිරිවැය | : රු. මිලියන 2,900 |

වෙහෙරගල ජලාශ ව්‍යාපෘතිය 2005 වසරේදී ආරම්භ කරන ලද අතර එහි ජලාශය හා ඇළ පද්ධතියේ ඉදිකිරීම් 2009 වසරේදී අවසන් කරන ලද අතර අතිරේක සංවර්ධන කටයුතු වලට අදාළ වැඩ දැනට කෙරීගෙන යයි. ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 2,900ක් වන අතර 2016 දෙසැම්බර් මස අවසාන වනවිට ව්‍යාපෘතියේ මුළු වියදම රු.මිලියන 2559.02ක් විය. ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 99.8%කි. වෙහෙරගල ජලාශ ව්‍යාපෘතිය යටතේ පහත වැඩ දැනට ක්‍රියාත්මක වේ.

| විස්තරය | භෞතික ප්‍රගතිය |
|---|---|
| 1. වෙහෙරගල යෝජනා ක්‍රමය නිම කිරීම | 90% |
| 2. අත්තික්කාව අමුණ නිම කිරීම | 50% |
| 3. ලුණුගම්වෙහෙර යෝජනා ක්‍රමයේ ප්‍රධාන ඇළ මාර්ග වම් සහ දකුණු ඉවුරු පුනරුත්ථාපන වැඩ | 71% |
| 4. ඇල්ලගල යෝජනා ක්‍රමය යටතේවූ වැව් 5ක ඇළ මාර්ග පද්ධති වැඩි දියුණු කිරීම | 98% |

## 3.3 රඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය

| | |
|---|---|
| පිහිටීම | : අම්පාර දිස්ත්‍රික්කය |
| ජලාශ ධාරිතාවය | : ඝන මීටර මිලියන 56 |
| වාරි වපසරිය | : හෙක්ටයාර 1,423 |
| ප්‍රතිලාභීන් | : ගොවි පවුල් 2,300 |
| ඇස්තමේන්තු පිරිවැය | : රු. මිලියන 3,970 |
| බැම්මේ දිග | : මීටර 1,097 |
| ප්‍රධාන ඇළ | : කි.මී. 7.6 |

ව්‍යාපෘතියේ මුලස්ථායී වැඩ අවසන් කර ඇති අතර 2013 ජුලි 20 වැනි දින අතිගරු ජනාධිපතිතුමා විසින් ව්‍යාපෘතිය විවෘත කරමංගල දියවර කලාප 1 වෙත මුදාහරින ලදි. ක්ෂේත්‍ර ඇළ හා අනෙකුත් යටිතල පහසුකම් ඉදිකිරීම් කරමින් පවති. ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය 98%කි. 2016 දෙසැම්බර් මස අවසන් වනවිට ව්‍යාපෘතියේ සමුච්ඡිත වියදම රු.මි. 3847.26කි.

## 3.4 යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය

| | |
|---|---|
| පිහිටීම | : අනුරාධපුර හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය |
| ජලාශ ධාරිතාවය | : ඝන මීටර මිලියන 169 |
| වාරි වපසරිය | : හෙක්ටයාර 5,696 |
| ඇස්තමේන්තු පිරිවැය | : රු. මිලියන 22,000 |

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පගුරුගස් වැව යාන් ඔය හරහා වේල්ලක් ඉදිකිරීමට නියමිත අතර යෝජිත ස්ථානය වර්තමාන යාන් ඔය අමුණට ඉහළින් ප්‍රදේශයට වන්නට පිහිටා ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ කි.මී. 2.35ක් දිග ප්‍රධාන පස් බැම්මක් හා කි.මී. 3.59 ක් දිග සෑදල බැමිද වම් ඉවුරේ හා දකුණු ඉවුරේ කි.මී. 34ක් දිග ඇළ මාර්ග ඉදිකිරීමට නියමිත අතර එමගින් අනුරාධපුර හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්ක වල ඉඩම් හෙක්ටයාර 5,696කට වාරි ජලය සැපයීමට හැකි වේ. යල කන්නයේ දී ඇඩි ජල හිගයකට මුහුණ දෙන පදවිය යෝජනා ක්‍රමය යටතේ පවතින ඉඩම් හෙක්ටයාර 2,200ක් ද මීට ඇතුළත්ය. මෙම ව්‍යාපෘතිය මගින් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ වාහල්කඩ යෝජනා ක්‍රමය යටතේ දැනට වගා කරන ඉඩම් හෙක්ටයාර 140කට ද වම් ඉවුර ඇළ ඔස්සේ වූ නව ඉඩම් හෙක්ටයාර 100කට ද යාන් ඔය අමුණ යටතේ පවතින ඉඩම් හෙක්ටයාර 750ක් හා මී ඔය ද්‍රෝණියේ කුඩා යෝජනා ක්‍රම වලට (හෙක්ටයාර1,735) ජලය සැපයේ.

2016 දෙසැම්බර් මස අවසන් වනවිට ව්‍යාපෘතියේ ප්‍රධාන කොටස් වල භෞතික ප්‍රගතිය පහත දැක්වේ.

| | |
|---|---|
| **මුලස්ථායී වැඩ** | ලබාගත් ප්‍රගතිය |
| වේලි පිරවීම | 94% |
| කොන්ක්‍රීට් වැඩ | 217% |
| | |
| **මිනුම් කටයුතු** | |
| වම් ඉවුර ප්‍රධාන ඇළෙහි මිනුම් කටයුතු | 100% |
| | |
| **වාරිමාර්ග පහසුකම් සැපයීම** | |
| වම් ඉවුර සහ දකුණු ඉවුර ඇළ ඉදිකිරීම් කටයුතු | සිදු කරමින් පවතී. (1% සහ 4%) |
| | |
| **ඉඩම් පවරා ගැනිම සහ නැවත පදිංචි කිරීමේ කටයුතු** | |
| බෝග වගා කිරීම වන්දි ගෙවීම | 95% |
| නැවත පදිංචි කිරීම සඳහා වම් සහ දකුණු ප්‍රදේශ වල කැළෑ එළි පෙහෙළි කිරීම් කටයුතු | සිදු කරමින් පවතී. (1% සහ 50%) |
| | |
| **පරිසර කළමනාකරණ පිරිවැය** | |
| නැවත කැළෑ ඇති කිරීම | 17% |
| පුරාවිද්‍යා සංරක්ෂණ පිරිවැය | 4% |

2016 වසර සඳහා සංශෝධිත ප්‍රතිපාදන රු.මි. 7500ක් වන අතර දෙසැම්බර් මස අවසන් වනවිට සමුච්චිත වියදම රු.මි. 16706.44කි. දෙසැම්බර් මස අවසන් වනවිට සමස්ථ භෞතික ප්‍රගතිය 61%කි.



ප්‍රධාන වේල්ල



පිටවාන

## 3.5 ඌව වැව කුඩා/ මධ්‍යම වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතිය

| | |
|---|---|
| පිහිටීම | : මොණරාගල දිස්ත්‍රික්කය |
| ප්‍රතිලාභීන් | : ගොවි පවුල් 2,500 |
| ඇස්තමේන්තු පිරිවැය | : රු. මිලියන 550 |

මෙම ව්‍යාපෘතිය තුළින් වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දෙබර ආර වැව හා තවත් කුඩා වැව් 22ක් වැඩිදියුණු කිරීමට අපේක්ෂා කෙරේ. මුළු ඇස්තමේන්තු පිරිවැය රු.මි. 550ක් වන අතර 2016 වර්ෂය සඳහා ප්‍රතිපාදන රු.මි. 90කි. මේ දක්වා ලබා ඇති මුළු භෞතික ප්‍රගතිය 90%කි. 2016 දෙසැම්බර් මස අවසානයේදි රු.මි. 603.87ක වියදමක් මෙම ව්‍යාපෘතිය සඳහා සිදු කොට ඇත.

කුඩා වැව් 18ක වැඩ නිම කර ඇති අතර පහත වැඩ කෙරීගෙන යයි.

| | භෞතික ප්‍රගතිය (%) |
|---|---|
| දෙබර ආර වැව පෝෂක ඇළ | 58% |
| වටගල ආර වැව | 35% |
| දෙමොදර ආර | ඇස්තමේන්තු සකස් කරමින් පවතී. |
| මල්ලිපොත වැව | මූලස්ථායී වැඩ අවසන් කර ඇත. වාරි පහසුකම් සැපයීම සිදු කරමින් පවතී. |
| හල්මිල්ලපිල්ලැව වැව | පුනරුත්ථාපන කටයුතු CRIP ව්‍යාපෘතිය යටතේ සිදු කරයි. |





දෙබර ආර





වටගල ආර වැව

### 3.6 මහගෝනා වැව

යෝජිත මහගෝනා වැව බණ්ඩාංක S/1 (2.0 X 8.6) දරණ අත්හැර දැමූ වැවක් වන අතර මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටා ඇත. මුළු ඇස්තමේන්තු පිරිවැය රු. මි. 70කි. ප්‍රමාණ වෙනස්වීම නිසා ඇස්තමේන්තුව රු.මි. 260කට සංශෝධනය කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා 2016 දෙසැම්බර් මස අවසන් වන විට රු.මි.102.38ක් වියදම් කර ඇත. ලබා ඇති සමස්ථ භෞතික ප්‍රගතිය 56%කි.

දෙසැම්බර් මස අවසන් වන විට ලබා ඇති ප්‍රගතිය පහතින් දක්වා ඇත.

1. ප්‍රධාන වේල්ලේ ඉදිකිරීම් - 100%
2. සොරොව්ව ඉදිකිරීම් - 85%
3. පිටවාන‍ේ ඉදිකිරීම් - 37%
4. රළපනාව ඉදිකිරීම් - 95%

2016 වර්ෂය සඳහා සංශෝධිත ප්‍රතිපාදනය රු.මි. 27 වන අතර වර්ෂය තුළ වියදම රු.මි. 26.9ක් වේ.




### 3.7 ගල්ඔය නවෝදය

මෙම ව්‍යාපෘතියට පහත ප්‍රධාන සංරචකයන් ඇතුළත් වේ.

1. සවිස්තර ජල සම්පත් සංවර්ධන සහ වාරි සැලැස්මක තුළින් ජල භාවිතයේ කාර්යක්ෂමතාව වැඩි කිරීම.
2. වාරි කෘෂිකාර්මාන්තයෙන් වැඩි ආදායමක් උත්පාදන කිරීම සඳහා වූ ඵලදායීතා ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
3. මහාමාර්ග, ජල සැපයුම්, සනීපාරක්ෂක, අධ්‍යාපන ආදී ක්ෂේත්‍රයන්හි භෞතික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම හා යාවත්කාලීන කිරීම තුළින් ජනතාවට ප්‍රතිලාභ සැලසීම.
4. පසු අස්වනු කටයුතු ද ඇතුළත්ව කෘෂිකර්මය ආශ්‍රිත කාර්මාන්තයන්හි අගය එකතු කිරීම් හා ව්‍යාපාර සංවර්ධනය තුළින් එහි විභවය ශක්තිමත් කිරීම.

ව්‍යාපෘති ඇස්තමේන්තුව රු.මි. 1260ක් වන අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුව සඳහා රු.මි. 650ක ප්‍රතිපාදන වෙන්කර ඇත. 2016 වසර සඳහා රු.මි. 301.650ක ප්‍රතිපාදන වෙන්කර ඇත. ව්‍යාපෘතිය සඳහා 2016 දෙසැම්බර් මස අග වන විට මුළු වියදම රු.මි. 953.43කි. ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 89% කි.

ගල්ඔය නිම්න සංවර්ධන කටයුතු ඇතුළත් කිරීම සඳහා ඇස්තමේන්තු නැවත සකස් කරන ලද අතර අයිතමයන් සඳහා සංශෝධිත ප්‍රතිපාදන පහත දැක්වේ.

| | ලබාගත් ප්‍රගතිය |
|---|---|
| වාරිමාර්ග කොටස | 96% |
| යටිතල පහසුකම් කොටස | 48% |




## 3.8 තෝරාගත් විශාල වාරිමාර්ග ව්‍යාපාරයන්හි අත්‍යාවශ්‍ය පුනරුත්ථාපන කටයුතු

**හැඳින්වීම**

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ තෝරාගත් විශාල වාරිමාර්ග ව්‍යාපාරයන්හි ඇළ පද්ධති වල අත්‍යාවශ්‍යය උපාංගයන් පුනරුත්ථාපනය කරමින් කෘෂිකාර්මික ඵලදායීතාව ස්ථාවර කිරීම හා ඉහළ නැංවීම වේ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම 109ක් මඟින් අක්කර 586323 සහ මධ්‍යම පරිමාණ යෝජනා ක්‍රම 254ක් මඟින් අක්කර 96333කට වඩා ජල පහසුකම් සපයනු ලබයි. විවිධ හේතු මත මෙම යෝජනා ක්‍රම බොහෝමයක් පුනරුත්ථාපනය කළයුතු තත්වයක පවතී. තෝරාගත් අත්‍යවශ්‍ය මහා වාරි ව්‍යාපාර ප්‍රතිසංස්කරණ යෝජනා ක්‍රමය යටතේ 2009දී වාර්ෂික අයවැය ප්‍රතිපාදන මඟින් අත්‍යවශ්‍ය පුනරුත්ථාපනය කළයුතු යෝජනා ක්‍රම හඳුනා ගන්නා ලදී.

**ප්‍රගතිය**

2015 අගවන විට 150කට වඩා වාරිමාර්ග යෝජනා ක්‍රම වල පුනරුත්ථාපන කටයුතු සිදුකරඇත. මෙම වසරේ දී වාරිමාර්ග යෝජනා ක්‍රමවල අත්‍යාවශ්‍යය පුනරුත්ථාපන කටයුතු 200ක් පමණ සිදුකිරීමට සැලසුම් කර ඇති අතර බොහෝමයක කටයුතු දැනටමත් ආරම්භ කර ඇත.

එක් එක් වර්ෂ වල මුල්‍ය ප්‍රගතිය පහත වගු වල දක්වා ඇත.

| මුල්‍ය ප්‍රගතියේ සාරාංශය | |
|---|---|
| **වර්ෂය** | **වියදම / රු.මිලියන** |
| 2009 | 11.3 |
| 2010 | 102.04 |
| 2011 | 172.73 |
| 2012 | 1217.58 |
| 2013 | 657.42 |
| 2014 | 634.81 |
| 2015 | 559.00 |
| 2016 (දෙසැම්බර් මස අග) | 594.119 |

නියඟයෙන් පීඩාවට පත් ජනතාවගේ ජීවන තත්වය නඟා සිටුවීමේ කඩිනම් සංවර්ධන ව්‍යාපෘතිය රු.මි. 1115 වැයකොට 2012/2013 වර්ෂයේදී සිදුකරන ලදී. එම නිසා ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් මස අග වන විට සම්පූර්ණ වියදම් රු.මි. 3963.36ක් විය. ලබාගත් භෞතික ප්‍රගතිය 65%කි.





පල්ලේමත්තල වැවේ වේල්ල වැඩි දියුණු කිරීම





## 3.9 මොරාණ ජලාශ ව්‍යාපෘතිය

| | |
|---|---|
| පිහිටීම | : බදුල්ල දිස්ත්‍රික්කය |
| ජලාශ ධාරිතාවය | : ඝන මීටර මිලියන 16.53 |
| වාරි වපසරිය | : අක්කර 1300 |
| ප්‍රතිලාභීන් | : ගොවි පවුල් 1,000 |
| ඇස්තමේන්තු පිරිවැය | : රු. මිලියන 1,700 |

උල්හිටිය ඔය හරහා මොරාණ නම් ස්ථානයෙහි යෝජිත මොරාණ ජලාශය ඉදිකරනු ලබන අතර එමගින් නාගදීප ව්‍යාපාරයේ ජල හිඟයට පිළියමක් ලෙස රොටගොල්ල වැවට ජලය ලබාදීමට නියමිතය. රොටගොල්ල වැව පිහිටා ඇත්තේ නාගදීප ව්‍යාපාරයේ පහළ ප්‍රදේශයේය. 2016 වසර සඳහා සංශෝධිත ප්‍රතිපාදන රු.මි. 524.33කි. 2016 දෙසැම්බර් මස අවසානයේදී සමුච්චිත වියදම රු.මි.1106.81කි. 2016 දෙසැම්බර් මස අවසානයට එහි භෞතික ප්‍රගතිය පහත පරිදි වේ.

| වැඩ විස්තරය | භෞතික ප්‍රගතිය |
|---|---|
| මුලස්ථායී වැඩ | වැව් බැම්ම ඉදිකිරීම– 79%<br>වම් සොරොව්ව ඉදිකිරීම – 74%<br>ආරීය ගේට්ටු පිටවාන ඉදිකිරීම – 48% |
| ඇළ මාර්ග පද්ධතිය | වම් ප්‍රධාන ඇළ සහ නිර්මිත ඉදිකිරීම – 75%<br>කුඩා වැව් 2ක් සහ රොටගොල්ල වැව වැඩි දියුණු කිරීම –52% |
| (ඉඩම් ක්‍රමිකකරණය) ඉඩම් සංවර්ධනය, නැවත පදිංචි කිරීම | ඉඩම් අත්පත් කර ගැනීම සහ මිනුම් කටයුතු සඳහා අත්තිකාරම් ගෙවීම – 78%<br>ප්‍රවේශ මාර්ග සහ නැවත පදිංචි කළ ස්ථාන සඳහා අනෙකුත් අභ්‍යන්තර මාර්ග ඉදිකිරීම – 82% |
| යටිතල පහසුකම් | ක්ෂේත්‍ර ගොඩනැගිල්ලක් ඉදිකිරීම සහ වේලි සඳහා විදුලිය සැපයීම – 37% |
| පරිසර පහසුකම් | වන සංරක්ෂණ දෙපර්තමේන්තුව සමඟ එක්ව වන වගා කිරීමේ කටයුතු 25% |

සමස්ථ භෞතික ප්‍රගතිය 52.5%



සොරොව්ව ඉදිකිරීම



පිටවාන ඉදිකිරීම

### 3.10 ඇල්ලේ වැව ජලාශ ව්‍යාපෘතිය

පිහිටීම : රත්නපුර දිස්ත්‍රික්කය

ජලාශ ධාරිතාවය : ඝන මීටර මිලියන 2.25

වාරි වපසරිය : අක්කර 1250

ප්‍රතිලාභීන් : ගොවි පවුල් 1000

ඇස්තමේන්තු පිරිවැය : රු. මිලියන 467.38

පනාමුර අමුණ ව්‍යාපාරයේ ජල ගැටළු වලට පිළියම් ලෙස මෙම ජලාශය ඉදිකිරීමට යෝජිතය. අනවසර වගාවන් සඳහා ජලය ලබා ගැනීමත් ධාරා ප්‍රදේශ වල සංවර්ධනය නිසා ස්වාභාවික දිය සිරාව අඩු වී යාමත් නිසා මෙසේ ජලය ගබඩා කිරීම අවශ්‍ය කටයුත්තක් වී ඇත. මෙම ව්‍යාපෘතිය තුළින් වාර්ෂිකව ගිගා වොට් පැය 2.59ක් උත්පාදනය කිරීමටත් අවට ප්‍රදේශ වල පදිංචි පවුල් දහසකට පමණ පානීය ජලය සැපයීමටත් අපේක්ෂා කෙරේ.

ජලාශයට අයත් වන ප්‍රදේශ වල පදිංචි ජනතාව සඳහා වන්දි ගෙවීමෙන් පසු ව්‍යාපෘතියේ ඉදිකිරීම් ආරම්භ කිරීමට නියමිත අතර වන්දි ගෙවීමේ කටයුතු සිදුකරමින් පවතින අතර සැලසුම් හා ඇස්තමේන්තු සකස් කිරීමේ කටයුතු සිදුවෙමින් පවතී.

2016 වර්ෂය සඳහා සංශෝධිත ප්‍රතිපාදනය රු.මි. 50කි.

## 3.11 කළුගල්ඔය ජලාශ ව්‍යාපෘතිය

| | |
|---|---|
| පිහිටීම | : අම්පාර දිස්ත්‍රික්කය (උහන) |
| ජලාශ ධාරිතාවය | : අක්කර අඩි 7800 |
| වාරි වපසරිය | : අක්කර1,500 |
| ඇස්තමේන්තු පිරිවැය | : රු. මිලියන 1481.40 |

කළුගල් ඔය හරහා පාලම ඉදිකර අවසන් කර ඇත. නේවාසික ඉංජිනේරු කාර්යාලයේ ඉදිකිරීම්, ප්‍රධාන වැඩ බිමට විදුලිය සැපයීම, ප්‍රධාන වැඩ බිමෙහි ඉදිකිරීම් සහ ගබඩාවේ ඉදිකිරීම් අවසන් කර ඇත. යටිතල පහසුකම් සැපයීම සඳහා 102% භෞතික ප්‍රගතියක් ලබා ගෙන ඇත. යටිතල පහසුකම් සැපයීම සහ ප්‍රධාන බැම්මේ ඉදිකිරීම් 72% අවසන් කර ඇත. පිටවානේ ඉදිකිරීම් 154%ක්, සොරොව්වේ ඉදිකිරීම් 43%ක් සහ ඇළ මාර්ග පද්ධතියේ ඉදිකිරීම් 113%ක් අවසන් කර ඇත. 2016දෙසැම්බර් අවසන් වන විට සමුච්චිත වියදම රු.මි. 471.32කි. 2016 වසර සඳහා රු.මි.450ක සංශෝධිත ප්‍රතිපාදන අනුමත කර ඇති අතර 16%ක භෞතික ප්‍රගතියක් 2016 දෙසැම්බර් අවසන් වන විට ළඟා කර ගෙන ඇත.


ප්‍රධාන ඇළේ ඉදිකිරීම


ප්‍රධාන වේල්ලේ ඉදිකිරීම

## 3.12 කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය

| | |
|---|---|
| පිහිටීම | : මොණරාගල දිස්ත්‍රික්කය |
| ජලාශ ධාරිතාවය | : ඝන මීටර මිලියන 55 |
| වාරි වපසරිය | : නව ඉඩම් අක්කර 10,000 හා පවතින ඉඩම් අක්කර 3,000 |
| ප්‍රතිලාභීන් | : ගොවි පවුල් 6,000 |
| ඇස්තමේන්තු පිරිවැය | : රු. මිලියන 10,000 |

මෙහි වැඩ කටයුතු ප්‍රදේශවාසීන්ගේ විරෝධය හමුවේ තාවකාලිකව නවතා ඇත. 2016 වර්ෂය සඳහා සංශෝධිත ප්‍රතිපාදනය රු.මි. 20කි.

## 3.13 රුගම් කිතුල් ජලාශ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය මඟින් කිතුල් වැව ජලාශය හා ඒකාබද්ධ කොට රුගම් ජලාශයේ ධාරිතාව කියුබික් මීටර් මිලියන 90 දක්වා වැඩි කිරීමට යෝජිතයි. එසේම රුගම් ව්‍යාපාරය හා කිතුල් වැව ව්‍යාපාරයේ දැනට පවතින ඇළ පද්ධතිය නවීකරණය කිරීමටත් මුන්දෙනි ආරු ද්‍රෝණියේ වම් ඉවුරෙහි අමතර වගා බිම් සඳහා ඇළ පද්ධති ඉදිකිරීමටත් අපේක්ෂා කෙරේ.

රුගම් හා කිතුල් වැව ව්‍යාපාර වල වගා වපසරිය 200% දක්වා වැඩි කිරීමටත් අහස් දියෙන් වගා කරනු ලබන අක්කර 1500ක පමණ භූමි ප්‍රදේශයකට වාරි ජලය සැපයීමටත් උස්සාන වාරි ක්‍රමය යටතේ අක්කර 2000ක පමණ නව වගා බිම් ඇති කිරීමටත් මෙම ව්‍යාපෘතියේ මූලික ප්‍රතිලාභ වේ.

මෙම ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තු පිරිවැය රු.මි. 4500කි. භූ විද්‍යාත්මක පර්යේෂණ ඇතුළුව ශක්‍යතා අධ්‍යන සිදු කරමින් පවතී. 2016 වර්ෂය සඳහා සංශෝධිත ප්‍රතිපාදනය රු.මි. 5කි.

## 3.14 ගුරුගල් ඔය ජලාශ ව්‍යාපෘතිය

| | |
|---|---|
| පිහිටීම | : මහනුවර දිස්ත්‍රික්කය |
| වාරි වපසරිය | : හෙක්ටයාර810 |
| ප්‍රතිලාභීන් | : ගොවි පවුල් 2400 |
| ඇස්තමේන්තු පිරිවැය | : රු. මිලියන 780 |

පස් වේල්ලේ ඉදිකිරීම් අවසන් කර ඇත. වම් සහ දකුණු ඉවුරු සොරොව් වල ඉදිකිරීම් 99% ක් අවසන් කර ඇත. පිටවානේ නිර්මිතයේ ඉදිකිරීම් 99%ක් නිම කර ඇත. වම් සහ දකුණු වේලි ඉදිකිරීම් 99%ක් අවසන් කර ඇති අතර ගුරුගල් ඔය වේල්ල හරහා ඉදිකිරීමට නියමිත පාලමේ සහ ආරීය ගේට්ටු සවිකිරීමේ භෞතික ප්‍රගතිය පිළිවෙලින් 95%ක් සහ 80%කි.

ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය 2016 දෙසැම්බර් මස අවසන් වන විට 97%කි. 2016 වර්ෂය සඳහා රු.මි. 80.41ක ප්‍රතිපාදන ලැබුණු අතර 2016 දෙසැම්බර් මස අවසන් වන විට සමුච්චිත වියදම රු.මි. 755.48 කි.

ගුරුගල් ඔය ව්‍යාපෘතියේ ඉදිකිරීම්





## 3.15 ගෝනගලතැන්න වැව

යෝජිත ගෝනගලතැන්න වැව පිහිටා ඇත්තේ මහනුවර දිස්ත්‍රික්කයෙහිය. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් මහ කන්නයේ කුඹුරු අක්කර 325කට හා යල කන්නයේ කුඹුරු අක්කර 37 කට වාරි ජලය ලබා දීමට යෝජිතය. ව්‍යාපෘති පිරිවැය රුපියල් මිලියන 55 කි.

වැව් බැම්මේ ඉදිකිරීම් 71%ක්, පිටවානේ ඉදිකිරීම් 100%ක් ද දකුණු ඉවුරු සොරොව්ව 2016 දෙසැම්බර් මස වනවිට 11%ක් අවසන් කර ඇත. 2016 අනුමත ප්‍රතිපාදන රු.මි. 13.65. 2016 වර්ෂය සඳහා අනුමත ප්‍රතිපාදනය රු.මි. 13.65ක වන අතර දෙසැම්බර් මස අවසන් වනවිට සමුච්චිත වියදම රු.මි. 55.39 කි. 2016 දෙසැම්බර් මස අවසන් වනවිට සමුච්චිත භෞතික ප්‍රගතිය 55%කි.


බැම්ම


වම් ඉවුරු සොරොව්ව


දකුණු ඉවුරු සොරොව්ව


පිටවාන

## 3.16 කවුඩුල්ල පියවර 11 දම්සෝපුර දක්වා වම් ඉවුර ඇල දිගුව

මෙම ව්‍යාපෘතියට කවුඩුල්ල යෝජනා ක්‍රමයේ වම් ඉවුරු ඇළ දිගු කිරීම, දම්සෝපුර වැව දියුණු කිරීම, බෙබියාව වැව දියුණු කිරීම, අදාළ නිර්මිත සහිතව ව්‍යාපෘතියට අයත් ප්‍රදේශයේ ඇළ මාර්ග පද්ධතිය ඉදිකිරීම.

නව කුඹුරු අක්කර 870ක් ද ඇතුළත්ව කුඹුරු අක්කර 1850කට වාරි පහසුකම් සැපයීමට බලාපොරොත්තු වේ. කි.මී 4ක් දිග ඇළ මාර්ග පද්ධතිය පිහිටුවීමේ අවසාන තීරණය ගෙන ඇත. ව්‍යාපෘතිය සඳහා මුළු පිරිවැය රු.මි. 368.82කි. 2016 වසර සඳහා රු.මි. 20.00 ප්‍රතිපාදන ලැබුණු අතර 2016 දෙසැම්බර් අවසන් වන විට රු.මි. 22.4 6 වියදම් කර තිබුණි. දෙසැම්බර් අවසන් වන විට සමුච්චිත භෞතික ප්‍රගතිය 38%කි.

| | |
|---|---|
| ඇළමාර්ග කැපීම කි.මී 0+000 – කි.මී. 4+200 | 95% |
| **කොන්ක්‍රීට් වැඩ** | |
| 0+375 කි.මී. – 1+525 කි.මී. | 50% |
| අනෙකුත් නිර්මිත | 15% |





කවුඩුල්ල පියවර 11 දම්සෝපුර දක්වා වම් ඉවුර ඇල දිගුව

### 3.17 මහගල්ගමුව වැව

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇහැටුවැව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පිහිටා ඇති මෙම ව්‍යාපෘතිය මඟින් කුඹුරු ඉඩම් අක්කර 1400කට ජල පහසුකම් සපයනු ලැබේ. ව්‍යාපෘතියේ මූලික පිරිවැය රු.මි. 500ක් වන අතර 2016 දෙසැම්බර් මස අවසන් වන විට සමුච්චිත වියදම රු.මි. 118.38කි. පෝෂිත ඇළේ පස් වැඩ 100% අවසන් කර ඇත. ඇළ මාර්ග නිර්මිත 20ක ඉදිකරීම් වැඩ 40%ක් අවසන් කර ඇත. 2016 වසර සඳහා ප්‍රතිපාදනය රු.මි. 100.00 කි. 2016 දෙසැම්බර් මස අවසන් වනවිට සමස්ථ භෞතික ප්‍රගතිය 50%කි

### 3.18 පෙතියාගොඩ පොම්පාගාරය ඉදිකිරීම

කැලණිය ප්‍රදේශිය ලේකම් කොට්ඨාශයේ පෙතියාගොඩ නම් පහත් බිම් ප්‍රදේශයේ කොටසක් නිරන්තර ජල ගැලීම් වලට බඳුන් වන අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ජනතාවට දේපළ හානි සිදුවේ. කැලණිය උතුර ගංවතුර පාලන ව්‍යාපෘතියේ බැම්ම ඉහළින් වර්ෂා ජලය එකතු වීම මෙම ජල ගැලීම් වලට මූලික හේතුවය. ජලයට යටවන ප්‍රදේශ වල ඉඩම් වල ඉහළ වටිනාකමක් තිබෙන අතර මෙම ප්‍රදේශයේ ඉහළ ජන ඝනත්වයක් දැකිය හැක. එබැවින් ජල ගැලීම් වළක්වා ගැනීමට වැසි ජලය පොම්ප මගින් ඉවත් කරන ලෙසට විශාල ජන ඉල්ලීම් ප්‍රමාණයක් ලැබෙමින් පවති. කැලණි ගග ගංවතුර වැළැක්වීමේ යෝජනා ක්‍රමයේ පෙතියාගොඩ ජලාප්‍රවහාන ගේට්ටුව අසල පොම්පාගාරයක් හා ආශ්‍රිත පහසුකම් ඉදිකිරීම් ව්‍යාපෘතිය මඟින් සිදු කෙරේ. මේ වන විට සැලසුම් නිම කර ඉඩම් පවරා ගැනීමේ කටයුතු කෙරෙමින් පවති.

හෙක්. 33ක වේගවත් සංවර්ධනයක් සහිත ප්‍රදේශයක් වන මෙහි ගංවතුර වැළැක්වීමට සහ මිලියන 5ක් පමණ වන ජනතාවගේ දේපළ ආරක්ෂා කිරීමට මෙම ව්‍යාපෘතිය මඟින අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතියේ පිරිවැය රු.මි. 310කි.

ව්‍යාපෘති ප්‍රදේශයේ ජනතාව නැවත පදිංචි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් ඇත. 2016 වසර සඳහා ප්‍රතිපාදනය රු.මි. 50.00 කි.

## 3.19 ගිංගඟ ගංවතුර පාලන ව්‍යාපෘතිය පුනරුත්ථාපනය කිරීම

මෙම ව්‍යාපෘතිය ගාලු දිස්ත්‍රික්කයේ බද්දේගම, බෝපේ පෝද්දල, වැලිවිට, දිවිතුර හා හික්කඩුව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ ක්‍රියාත්මක වේ. වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් 70 දශකයේ අග භාගයේ චීන රජයේ ආධාර මත ගිංගඟ ගංවතුර පාලන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද අතර ව්‍යාපෘතියේ වැඩ අවසන් කොට මෙහෙයුම් කටයුතු 1982 වර්ෂයේ ආරම්භ කරන ලදී.

මෙම ව්‍යාපෘතියේ මූලික ප්‍රතිලාභ වසර 30 පුරා සාර්ථකව අත්විඳින ලදී. යෝජිත පුනරුත්ථාපන ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකළහොත් පහත මූලික ප්‍රතිලාභ ලබාගත නොහැකි වන අතර විශාල හානියක් සිදුවිය හැක.

I. හෙක්ටයාර 5000ක කුඹුරු ඉඩම් සඳහා ගංවතුර පාලන හා ජලප්‍රවාහන පහසුකම් සැපයීම සහ යල, මහ දෙකන්නය කරදරයකින් තොරව වගා කටයුතු සිදුකිරීම.

II. ව්‍යාපෘතිය ආරම්භයට පෙර පැවති ගංවතුර ආපදා තත්ව වලින් මිනිස් ජීවිත හා දේපළ ආරක්ෂා කිරීම. මෙම ප්‍රදේශයේ පදිංචි පවුල් 20,000කට පමණ ව්‍යාපෘතිය යටතේ සෘජු ප්‍රතිලාභ හිමිවේ.

මෙම ව්‍යාපෘතියේ යාන්ත්‍රික කොටස් නවීකරණය කිරීම, 2009 වර්ෂයේදී ජපාන සහයෝගිතා ආයතනයේ (**JICA**) විශේෂඥ කාණ්ඩායමක් විසින් නිර්දේශ කරන ලදී.

ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මි.700ක් වන අතර ව්‍යාපෘති කාලය මාස 36කි. අමතර උපාංග මිලදී ගැනීම් සවිකිරීම් සහ පොම්පාගාරය සඳහා පොම්ප 10ක් මිලදී ගැනීමේ කටයුතු සැපයුම්කරුවන්ට පවරනු ලැබ ඇත.

2016 වර්ෂය සඳහා ප්‍රතිපාදන රු.මි. 125ක් වන අතර දෙසැම්බර් මස අවසන් වන විට වියදම රු.මි. 60.96කි. 2016දෙසැම්බර් මස අවසන් වන විට ව්‍යාපෘතියේ සමුච්චිත භෞතික ප්‍රගතිය 17%කි.



දිවිතුර ගංවතුර පාලන ගොඩනැගිල්ල



මෙහිමුල්ල ගංවතුර පාලන ගොඩනැගිල්ල

## 3.20 බෙන්තර ගඟ දකුණු ඉවුර කරදිය ගලා ඒම වැළැක්වීමේ ව්‍යාපාරය පුනරුත්ථාපනය

බෙන්තර ගඟ දකුණු ඉවුර කරදිය ගලා ඒම වැළැක්වීමේ ව්‍යාපාරය මීගම හා ඉත්තැපාන වශයෙන් ප්‍රධාන කොටස් 2ට බෙදේ. මීගම හා ඉත්තැපාන කොට්ඨාශ වල ඉඩම් හෙක්ටයාර 1110 ක් පමණ බෙන්තර ගඟ දකුණු ඉවුර ව්‍යාපාරය මඟින් ආවරණය කරණු ලබයි.

මෙම යෝජනා ක්‍රමයේ අබලන් වූ නිර්මිත සහ ගේට්ටු ඇති අතර ගංවතුර අවස්ථා වලදී සහ වඩදිය බාදිය ඇතිවන අවස්ථා වලදී ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වන ගේට්ටු 115ක් මෙම යෝජනා ක්‍රමයේ පැවතුනි. සමහර ගේට්ටු අබලන්ව පවතින අතර එම ගේට්ටු මෙම ව්‍යපෘතිය යටතේ සවි කිරීමට නියමිතය. මෙම යෝජනා ක්‍රමයේ ගං වතුර බැම් සහ ඇළ වේළි මාර්ග වල පැති ආනති සේදී යාම නිසා අබලන් වී ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීම සඳහා නිර්මිත වල ගේට්ටු සහ වේලි පිළිසකර කිරීමට වහාම ක්‍රියාමාර්ග ගන්නා ලදී. මෙහි ප්‍රධාන කාර්ය වනුයේ අපවහන සහ වාරිමාර්ග පහසුකම් වැඩි දියුණු කිරීම මඟින් ගංවතුර වැළැක්වීම හා කරදිය ගලා ඒම වැළැක්වීම සහ ජනතාවගේ ජීවන තත්වය ඉහල නැංවීමයි.

බෙන්තර ගඟ දකුණු ඉවුර කරදිය ගලා ඒම වැළැක්වීමේ ව්‍යාපාරය මඟින් සිදු කරනු ලබන අයිතමයන්හි සාරාංශයක් සහ ඒවායේ භෞතික ප්‍රගතිය පහත දක්වා ඇත.

| | |
|---|---|
| මුහුදු ජලය පැමිණීම වළක්වා ගැනීමේ බැම්වල 3.25 කි.මී. දිගක පුනරුත්ථාපන සහ අලුත්වැඩියා කටයුතු | 37% |
| ජලප්‍රවාහන ඇළ වල 15ක අලුත්වැඩියා කටයුතු | 63% |
| මුහුදු ජලය පැමිණීම වැළැක්වීමේ නිර්මිත 15 | 34% |

- වාරිමාර්ග ප්‍රදේශ එළිපෙහෙළි කිරීම.
- ඉත්තැපාන ප්‍රදේශයේ ප්‍රජා ශාලාවක් ඉදිකිරීම.
- අවශ්‍ය ස්ථානයන්හි ගව පැන්නුම් සහ ට්‍රැක්ටර් පැන්නුම් ඉදිකිරීම.

2016 වසර සඳහා ප්‍රතිපාදන රු.මි. 50කි. දෙසැම්බර් මස අවසන් වන විට ව්‍යාපෘතියේ සමුච්චිත භෞතික ප්‍රගතිය 24%ක් වන අතර 2016 දෙසැම්බර් මස අවසන් වන විටමුළු වියදම රු.මි. 41.61කි.




## 4.0 වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන අනෙකුත් මහා පරිමාණ ව්‍යාපෘති

### 4.1 වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් ව්‍යාපෘතිය

වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් ව්‍යාපෘතියේ අරමුණ වන්නේ විශාල වේලිවල නඩත්තු හා මෙහෙයුම් කටයුතු සඳහා දීර්ඝ කාලීනව අඛණ්ඩව පවත්වා ගත හැකි ක්‍රමවේදයක් සකස් කිරීම සහ ජල සම්පත් සැලසුම් වැඩි දියුණු කිරීමයි. මෙම ව්‍යාපෘතිය කොටස් හතරකට බෙදිය හැකිය. පලමුවැනි කොටසනම් වේලි ආරක්ෂාව හා මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි කිරීමයි. මෙම කොටසින් තෝරා ගත් වැඩි අවදානම් සහිත විශාල වේලි 32 ක මහජන ආරක්ෂාව උසස් මට්ටමකට ගෙන ඒම සහ වේලි 80 ක (ඉහත වේලි 32 ක් ඇතුළුව) මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම, ආයතනික ක්‍රියාකාරකම්, වේලි ආරක්ෂණ කළමනාකරණ සහ නඩත්තු හා මෙහෙයුම් කටයුතු වැඩි දියුණු කිරීම සිදු කරයි. මෙය පහත උප කොටස්වලට බෙදේ.

I. වැඩි අවදානම් සහිත වේලි සඳහා පිළියම් යෙදීම.
II. විශාල වේලි 80 ක් සඳහා මූලික ආරක්ෂණ පහසුකම් සැපයීම.
III. වේලි හිමිකම් සංවිධාන ශක්තිමත් කර පුහුණු කිරීම.
IV. විශේෂිත උපකරණ සැපයීම හා අධ්‍යානය.



මෙහෙයුම් හා නඩත්තු කාර්යයන් යටතේ පරාක්‍රම සමුද්‍රයේ වැවේ වේල්ලේ තණකොළ ගලවා ශුද්ධ කිරීම



මෙහෙයුම් හා නඩත්තු කාර්යයන් යටතේ කවුඩුල්ල වැවේ වේල්ලේ තණකොළ ගලවා ශුද්ධ කිරීම



මෙහෙයුම් හා නඩත්තු කාර්යයන් යටතේ ගිරිතලේ වැවේ වේල්ලේ තණකොළ ගලවා ශුද්ධ කිරීම

| | ජලාශයේ නම | ඇස්තමේන්තුව (රු. මි.) | වර්තමාන තත්වය |
|---|---|---|---|
| **1** | **අමතර කාර්යයන්** | | |
| 01 | මහවිලච්චිය | 254.00 | භෞතික ප්‍රගතිය – 75%<br>මූල්‍ය ප්‍රගතිය – 77.81% |
| 02 | මහකනදරාව | 133.00 | භෞතික ප්‍රගතිය – 99%<br>මූල්‍ය ප්‍රගතිය – 66.28% |
| 03 | පදවිය | 160.50 | භෞතික ප්‍රගතිය – 52%<br>මූල්‍ය ප්‍රගතිය – 34.68% |
| 04 | අන්ගමුව | 212.00 | භෞතික ප්‍රගතිය – 95%<br>මූල්‍ය ප්‍රගතිය – 131.58% |
| 05 | උන්නච්චිවැව | 37.81 | භෞතික ප්‍රගතිය – 2%<br>මූල්‍ය ප්‍රගතිය – 12.03% |
| 06 | තොප්පුර් | 56.20 | භෞතික ප්‍රගතිය – 85%<br>මූල්‍ය ප්‍රගතිය – 16.18% |
| 07 | වාන් ඇළ | 82.79 | භෞතික ප්‍රගතිය – 45%<br>මූල්‍ය ප්‍රගතිය – 13.88% |
| 08 | ජනරංජනවැව | 124.77 | භෞතික ප්‍රගතිය – 50%<br>මූල්‍ය ප්‍රගතිය – 31.21% |
| 09 | සොරබොර වැව | 23.55 | භෞතික ප්‍රගතිය – 16%<br>මූල්‍ය ප්‍රගතිය – 2.51% |
| 10 | නවාකිරිවැව | 111.90 | භෞතික ප්‍රගතිය – 30%<br>මූල්‍ය ප්‍රගතිය – 23.16% |
| 11 | කාච්චිමඩු | 104.47 | භෞතික ප්‍රගතිය – 15%<br>මූල්‍ය ප්‍රගතිය – 17.12% |
| 12 | කොට්ටුකච්චිය | 75.25 | භෞතික ප්‍රගතිය – 25%<br>මූල්‍ය ප්‍රගතිය – 17.16% |
| 13 | බන්දගිරි | 95.55 | භෞතික ප්‍රගතිය – 10%<br>මූල්‍ය ප්‍රගතිය – 0.0% |
| 14 | රාජාංගණය වෙල්ල (පැකේජ-01) | 265.50 | භෞතික ප්‍රගතිය – 2%<br>මූල්‍ය ප්‍රගතිය – 54.50% |
| 15 | රාජාංගණය වෙල්ල (පැකේජ -02) | 265.50 | භෞතික ප්‍රගතිය – 2%<br>මූල්‍ය ප්‍රගතිය – 0.0% |
| 16 | රොසෙන්ත් වෙල්ල | 26.39 | භෞතික ප්‍රගතිය – 28%<br>මූල්‍ය ප්‍රගතිය – 4.28% |
| 17 | දුන්මාදලාව වෙල්ල | 58.87 | භෞතික ප්‍රගතිය – 10%<br>මූල්‍ය ප්‍රගතිය – 8.48% |
| 18 | මුතුකන්ඩිය වැව | 24.14 | භෞතික ප්‍රගතිය – 0%<br>මූල්‍ය ප්‍රගතිය – 0% |
| 19 | බදුලු ඔය | 66.21 | ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නියමිතව ඇත. |
| 20 | වෙලි නඩත්තු කාර්ය මණ්ඩලය සඳහා පුහුණු මධ්‍යස්ථානයේ වැඩි දියුණු කිරීම් සිදුකිරීම | 185.48 | භෞතික ප්‍රගතිය – 95%<br>මූල්‍ය ප්‍රගතිය – 141.17% |
| 21 | ඉංජිනේරු භූ විද්‍යා පර්යේෂණාගාරය වැඩි දියුණු කිරීම | 23.54 | ඉංජිනේරු ඇස්තමේන්තුව අනුමත කොට ඇත.<br>මුළු ඇස්තමේන්තු මුදල රු.මි. 45 |
| 22 | ජල විද්‍යා නිරීක්ෂණ කාර්යාලය වැඩි දියුණු කිරීම | 46.73 | භෞතික ප්‍රගතිය – 60% |

## 4.2 උමා ඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘතිය

| | |
|---|---|
| ඇස්තමේන්තුගත පිරිවැය | : රු.මි. 9352 |
| වාරි වපසරිය | : අක්කර 3200 |
| නව වාරි බිම් | : අක්කර 11,000 |
| ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂිත කාලය | : 2016 වසර අග |

2016 වසරේ ප්‍රතිපාදන රු.මි. 1200.00

ව්‍යාපෘති අධ්‍යක්ෂක මඟින් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට මේ වන විට නිකුත් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 1200.00කි.

මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 9352ක් වන අතර 2016 දෙසැම්බර් මස අවසානයේ මුළු වියදම රු.මි. 1200.00කි.

2016 දෙසැම්බර් 31 ගෙවීමට ඇති වියදම් රු.මි. 281

2016 දෙසැම්බර් 31 සමුච්චිත වියදම් රු.මි. 2388.24

2016 දෙසැම්බර් 31 භෞතික ප්‍රගතිය 25.54%

මෙම ව්‍යාපෘතිය යටතේ පහත වැඩ සිදුකරමින් පවතී.

**ප්‍රධාන කොටස්**

- අලිකොටආර ජලාශය ඉදිකිරීම - 95%
- කුඩා ඔය ජලාශය ඉදිකිරීම (ඝන මීටර මිලියන 40.0) -12.3%
- හඳපානාගල වැවේ ධාරිතාවය වැඩිකිරීම (ඝන මීටර මිලියන 6.5 සිට ඝන මීටර මිලියන14 දක්වා) - 85%
- අලිකොටආරේ සිට කුඩා ඔය දක්වා ප්‍රධාන ඇළමාර්ගය ඉදිකිරීම - 4%
- කුඩා ඔයේ සිට සිංහලයාගමවැව දක්වා ප්‍රධාන ඇළ මාර්ගය ඉදිකිරීම. (කි.මී. 30) – 4%
- හඳපානාගල වම් ඉවුර ඇළ ඉදිකිරීම හා දකුණු ඉවුරු පුනරුත්ථාපන කටයුතු – 8%
- කුඩා වැව් වැඩි දියුණු කිරීම – 15%
- බණ්ඩාරවෙල හා තෙලුල ඉඩම් අත්පත් කර ගැනීම හා නැවත පදිංචි කිරීම – 95%


අලිකොටආර ඔය


කුඩා ඔය

## 5.0 ආමාත්‍යාංශය සහ අනෙකුත් කාර්යාංශ වැය ශීර්ෂ මඟින් ඉටුකරනු ලබන මධ්‍යම පරිමාණ ව්‍යාපෘති

### 5.1 කොච්චිපොතාන පෝෂිත ඇළ ඉදිකිරීම

කොච්චිපොතාන ජලාශය තිස්සමහාරාමය හා කතරගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ තුළ පිහිටා ඇත. යල කන්නය සඳහා පවතිත ජලය ප්‍රමාණවත් නොවන නිසා වර්තමානය වනවිට මෙම වැඩ යටතේ කුඹුරු අක්කර 200ක් පමණ මහ කන්නය යටතේ පමණක් වගා කරනු ලබයි. කොච්චිපොතාන ව්‍යාපාරයේ වගාවන්හි සරුසාර ඉඩම් පැවතුණත් ජලාශයේ පෝෂිත ප්‍රදේශ වලින් ජලය ගලා ඒම ප්‍රමාණවත් නොවන නිසා වගාබිම් වපසරිය වැඩි කිරීමේ හැකියාවක් නොමැත.

කොච්චිපොතාන ජලාශයේ ධාරිතාවය හා යාබද පෝෂිත ප්‍රදේශයකින් හෝ ජලාශයකින් ජලය ලබාගැනීමට පවතින හැකියාව මත වගාබිම් වපසරිය අක්කර 300 දක්වා වැඩි කළ හැක.

දෙටගමුව ජලාශයේ සිට කොච්චිපොතාන ජලාශය දක්වා පෝෂිත ඇළක් ඉදිකිරීම මඟින් කොච්චිපොතාන ව්‍යාපාරයේ දැනට පවතින ජල අවශ්‍යතාව සම්පූර්ණ කොට යල මහ දෙකන්නයම මුළු වගා වපසරියම වගා කිරීමේ හැකියාවක් ඇත.

**2016 දෙසැම්බර් මාසය අවසන් වන විට ප්‍රගතිය**

පෝෂිත ඇළ කැපීම කි.මී. 0 සිට කි.මී.6 දක්වා – 93.86%
කි.මී. 0 සිට කි.මී.6 දක්වා නිර්මිත ඉදිකිරීම – 90%

2016 වර්ෂය සඳහා ප්‍රතිපාදන රු.මි. 95.00 (ඉතිරිවැඩ සඳහා රු.මි. 45ක් සහ නව වැඩ සඳහා රු.මි. 50ක්) දෙසැම්බර් මාසය අවසන් වන විට වියදම රු.මි. 99.15

### 5.2 මුතුකෙලියාව පෝෂිත ඇළ ඉදිකිරීම - අදියර II

මෙම පෝෂිත ඇළ හරහා කුඩා ජලාශ 7ට ජලය සැපයීම යෝජිතය. මෙම සියලු ජලාශ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව සහ පළාත් සභා පාලනය යටතේ පවතින ඒවා වේ. මුළු වගා වපසරිය අක්කර 600කි.

**2016 දෙසැම්බර් මාසය අවසන් වන විට ප්‍රගතිය**

පෝෂිත ඇළ කැපීම - 100%
නිර්මිත ඉදිකරීම - 76.5%

2016 වර්ෂය සඳහා ප්‍රතිපාදන රු.මි. 50.00 දෙසැම්බර් මාසය අවසන් වන විට වියදම රු.මි. 34.635

## 5.3 යක් අමුණ ඉදිකිරීම.

මෙම යෝජිත අමුණ පුත්තලම දිස්ත්‍රික්කයට අයත් වේ. මෙය ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ආරම්භ කරන ලද නැවත පිහිටු වීමේ ව්‍යාපාරයකි. 2014 වර්ෂයේ සිට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් ඉතිරි වැඩ කොටස් වාරිමාර්ග අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ඉටුකිරීමට කටයුතු කරන ලදී.

**2016 දෙසැම්බර් මාසය අවසන් වන විට ප්‍රගතිය**

අමුණ ඉදිකිරීම අවසන් කර ඇත. අමුණේ ගේට්ටු ඉදිකිරීමේ සැලසුම් සකස් කරමින් පවතී. 2016 වර්ෂය සඳහා ප්‍රතිපාදන රු.මි. 15.00 දෙසැම්බර් මාසය අවසන් වන විට වියදම රු.මි.13.283 භෞතික ප්‍රගතිය 91%

## 5.4 ගල්සේරුගොල්ල වැව

ගල්සේරුගොල්ල වැවේ ඉදිකිරීම් කටයුතු 2012 වසරේදී ආරම්භ කරන ලදී. මුළු ඇස්තමේන්ත පිරිවැය මිලියන රු.100.00ක් වේ.

2016 වසරේ අවසානය වන විට ලබාගත් සමස්ථ භෞතික ප්‍රගතිය පහත දැක්වේ.

| | | |
|---|---|---|
| පස් වේල්ල ඉදිකිරීම් කටයුතු | – | 90% |
| පිටවාන ඉදිකිරීම් කටයුතු | – | සම්පූර්ණ කොට ඇත |
| සොරොව්ව ඉදිකිරීම් කටයුතු | _ | 95% |

## ආ. වාරිමාර්ග කළමනාකරණ අංශය

1984 වර්ෂයේ දී ආරම්භ කරන ලද වාරිමාර්ග කළමනාකරණ අංශය දැනට හෙක්ටයාර් 400 ට වැඩි මහා වාරිමාර්ග බල ප්‍රදේශ 54 ක ඒකාබද්ධ හා සහභාගිත්ව කළමනාකරණ ක්‍රියාවලිය පවත්වාගෙන යනු ලැබේ. මෙම වැඩසටහනේ දැක්ම වනුයේ ස්වයං කළමනාකරණය සඳහා ආත්ම විශ්වාසය පදනම් කරගත් වාරිමාර්ග ජනාවාස ආශ්‍රිත ගොවි ප්‍රජාවක් බිහි කිරීමයි. ගොවි සංවිධාන, රාජ්‍ය හා පෞද්ගලික ආයතන සහ රාජ්‍ය නොවන ආයතන යන පාර්ශවයන්ගේ සහභාගීත්වය සහ දායකත්වය තුළින් මහා වාරිමාර්ග ව්‍යාපාරවල ජල ඒකකයක ඵලදායීතාවය ඉහළ නංවමින් ඒකාබද්ධ ජල කළමනාකරණය තුළින් ගොවි ජනතාවගේ තිරසර ආර්ථික සංවර්ධනය සාක්ෂාත් කර ගැනිම මෙම වැඩසටහන තුළින් අපේක්ෂා කෙරේ.

මහා වාරිමාර්ග බල ප්‍රදේශවල විධිමත් කළමනාකරණයක් හරහා නිෂ්පාදන ඵලදායීතාව වැඩි කිරීමේ අරමුණෙන් ගොවි සංවිධාන බිහි කිරිම, පවත්වාගෙන යාම හා ශක්තිමත් කිරිම, වාරිමාර්ග උපපද්ධති නඩත්තු හා මෙහෙයුම් කටයුතු වැඩි දියුණු කිරිම, කෘෂි නිෂ්පාදනය හා නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පහසුකරණය, වාතාවරණය සැකසීම හා සම්බන්ධිකරණය තුළින් ගොවි ජනතාවගේ ජීවන තත්වය ඉහළ නැංවීම මෙම අංශයේ වගකීම වේ.

## 2016 ක්‍රියාත්මක වැඩ සටහන්වල ප්‍රගතිය

### 1. ගොවි සංවිධාන ශක්තිමත් කිරීම හා බල ගැන්වීම

1.1. මෙම අංශය මගින් කළමනාකරණය කරනු ලබන මහා වාරිමාර්ග ව්‍යාපාර 54 හි ගොවි සංවිධාන 874 ක් පිහිටුවා ඇති අතර එම ගොවි සංවිධානවල යහපාලනය තහවුරු කිරීම සඳහා පහත කාර්යයන් ඉටු කිරීමට පහසුකරණය හා මග පෙන්වීම් කර ඇත.

| කාර්යයන් | මිනුම් ඒකකය | ඉලක්ක | ප්‍රගතිය | % |
|---|---|---|---|---|
| ගොවි සංවිධාන අවසන් ගිණුම් සැකසීම | සංඛ්‍යාව | 864 | 807 | 93 |
| ගොවි සංවිධාන ගිණුම් කටයුතු යථාවත් කිරීම | සංඛ්‍යාව | 874 | 821 | 94 |
| ගොවි සංවිධාන ගිණුම් විගණනය සඳහා පහසුකරණය | සංඛ්‍යාව | 834 | 635 | 76 |
| ගොවි සංවිධාන නිළවරණ පැවැත්වීම | සංඛ්‍යාව | 380 | 360 | 95 |
| ගොවි සංවිධාන මහා සභා රැස්වීම් පැවැත්වීම | සංඛ්‍යාව | 1,664 | 1,649 | 99 |
| ගොවි සංවිධාන මාසික කමිටු රැස්වීම් පැවැත්වීම | සංඛ්‍යාව | 10,093 | 7,314 | 72 |
| ගොවි සංවිධාන සාමාජික නාමලේඛණ යථාවත් කිරීම | සංඛ්‍යාව | 751 | 584 | 78 |
| ගොවි සංවිධාන ව්‍යවස්ථාව සංශෝධනය හා සම්මත හා කාර්ය පරිපාටි හඳුන්වාදීම හා ඒවා භාවිතය තහවුරු කිරීම | සංඛ්‍යාව | 792 | 580 | 73 |
| ගොවි සංවිධාන විෂය කමිටු පිහිටුවීම | සංඛ්‍යාව | 38 | 19 | 50 |
| ගොවි සංවිධාන අරමුදල් වර්ධනය | රුපි (000) | 30,156 | 30,200 | 100 |
| පද්ධති මට්ටමේ ගොවි සංවිධාන 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත යටතේ ලියාපදිංචි කිරීම | සංඛ්‍යාව | 27 | 10 | 37 |




ගොවි සංවිධාන මහසභා රැස්වීමක් - පදවිය  ව්‍යාපාරය




ගොවි සංවිධාන මහා සභා රැස්වීමක් - කිරිදිඔය ව්‍යාපාරය



ගොවි සංවිධාන මහසභා රැස්වීමක් - හක්වටුනාඔය ව්‍යාපාර



ගොවි සංවිධාන මහා සභා රැස්වීමක් - රිදීබැදි ඇල ව්‍යාපාරය



ගොවි සංවිධාන නිලවරණ රැස්වීමක් -  දමන ව්‍යාපාරය



ගොවි සංවිධාන නිලවරණ රැස්වීමක්  - වාහල්කඩ ව්‍යාපාරය






ගොවි සංවිධාන කාරක සභා රැස්වීමක් - මුරුතවෙල ව්‍යාපාරය    ගොවි සංවිධාන කාරක සභා රැස්වීමක් - ගිරිතලේ ව්‍යාපාරය

1.2. ගොවි සංවිධාන වල යහපාලනය තහවුරු කිරීම හා සහභාගීත්ව කළමනාකරණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා පහත ක්ෂේත්‍ර යටතේ ගොවි සංවිධාන නිලධාරීන් හා ගොවීන් පුහුණු කර ඇත.

| පුහුණු වැඩසටහන | ඉලක්කය (පුද්ගලයන් සංඛ්‍යාව) | ප්‍රගතිය (පුද්ගලයන් සංඛ්‍යාව) | % |
|---|---|---|---|
| මූල්‍ය කළමනාකරණය | 2,812 | 2,950 | 105 |
| නායකත්ව ගුණාංග වර්ධනය | 505 | 446 | 88 |
| ව්‍යවස්ථා සංශෝධනය හා සම්මත හා කාර්යය පටිපාටි හඳුන්වා දීම | 605 | 352 | 58 |
| ආදායම් කළමනාකරණය | 160 | 75 | 47 |
| අභ්‍යන්තර විගණක පුහුණුව | 70 | 70 | 100 |
| ගොවි සංවිධාන ශක්තිමත් කිරීම | 715 | 477 | 68 |
| **එකතුව** | **4,867** | **4,370** | **90** |



මූල්‍ය කළමනාකරණ පුහුණුව - පරාක්‍රමසමුද්‍රය ව්‍යාපාරය



මූල්‍ය කළමනාකරණ පුහුණුව - බතලගොඩ ව්‍යාපාරය



සම්මත හා කාර්යය පටිපාටි හඳුන්වා දීමේ දැනුවත් කිරීම
මී ඔය ව්‍යාපාරය



ආදායම් කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීම
මහකනදරාව ව්‍යාපාරය



ආයතන සංවර්ධන ගැටළු නිරාකරණය කිරීමේ වැඩමුළුව
ඉගිණිමිටිය ව්‍යාපාරය



ගොවි සංවිධාන ශක්තිමත් කිරීම පිළිබඳ දැනුවත් කිරීම
රිදීබැදි ඇළ ව්‍යාපාරය

1.3. ගොවි සංවිධාන මගින් ලබා දෙන සේවාවන් ඵලදායී ලෙස ලබා දීම හා ගොවි සංවිධාන ශක්තිමත් කිරීම අරමුණු කරගෙන ආදර්ශයක් ලෙස වාරි පුබුදුව ක්‍රියාත්මක කල රිදීබැදිඇල, මී ඔය, නාච්චදූව හා නුවරවැව මහා වාරිමාර්ග ව්‍යාපාර වල සහ හුලුගල්ල, මහනාන්නේරිය මධH වාරිමාර්ග ව්‍යාපාර වල ගොවි සංවිධාන කාර්යාල 14 ක් පිහිටුවා ඒවාට කාර්යාලයීය උපකරණ, ලී බඩු සහ පරිගණක පහසුකම් ලබා දී ඇත. මෙම කාර්යාල වලට අන්තර් ජාල පහසුකම් ලබාදී ඒ හරහා ගොවීන් හා තාක්ෂණික උපදෙස් ලබාදෙන ආයතන හා වෙලඳ පොල සම්බන්ධීකරණය කර ගොවි ගැටළු විසදීමට අපේක්ෂා කරයි.




අබකොලවැව ගැමුණු ගොවි සංවිධාන කාර්යාලය විවෘත කිරීම
මී ඔය ව්‍යාපාරය




පරාක්‍රම ගොවි සංවිධාන කාර්යාලය විවෘත කිරීම
නුවරවැව ව්‍යාපාරය

මීට අමතරව රාජාංගනය ව්‍යාපාරයේ ගොවි සංවිධාන 5 ක ගොවි සංවිධාන විසින්ම කාර්යාල 5 ක් ඉදිකර ඇත.




ශ්‍රී උදාර ගොවි සංවිධාන කාර්යාලය




විජය ගොවි සංවිධාන කාර්යාලය

1.4. මහා වාරි ප්‍රදේශවල ජලය ඇතුළු කෘෂිකාර්මික යෙදවුම් සේවා කලට වේලාවට සැපයීම තහවුරු කිරීම සඳහා නියමිත වේලාවට පෙර කන්න රැස්වීම් පවත්වා කන්න රැස්වීම් පැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකරනය කර ඇත. එසේම ජලය ඇතුළු කෘෂිකාර්මික යෙදවුම් හා සේවා සපයන රාජ්‍ය ආයතන ඇතුලු පෞද්ගලික ආයතන හා ගොවි සංවිධාන වල සහභාගීත්වය ඇතිව වාරිපද්ධතියේ කළමනාකරණය පිලිබඳ තීරණ ගැනීම සඳහා සෑම මසකම ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා ඇත. මෙම රැස්වීම් පැවැත්වීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| රැස්වීම | ඒකකය | ඉලක්කය | ප්‍රගතිය | % |
|---|---|---|---|---|
| ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම | සංඛ්‍යාව | 461 | 442 | 96 |
| පෙරකන්න රැස්විම් පැවැත්වීම | සංඛ්‍යාව | 148 | 148 | 100 |
| කන්න රැස්වීම් පැවැත්වීම | සංඛ්‍යාව | 115 | 115 | 100 |




ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම - රිදියගම ව්‍යාපාරය




ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම - මුරුතවෙල ව්‍යාපාරය



කන්න රැස්වීම - යෝධවැව ව්‍යාපාරය



කන්න රැස්වීම - රාජාංගනය ව්‍යාපාරය

1.5. මහා වාරිමාර්ග ව්‍යාපාර වල නීරෝගී ජනතාවක් බිහි කිරීමේ අරමුණින් මත්ද්‍රව්‍ය වලින් ජනතාව මුදවා ගැනීම සඳහා මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව පිළිබඳව ගොවීන් සහ ගොවි සංවිධාන නිලධාරීන් 6283 ක් දැනුවත් කර ඇත.



**මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දැනුවත් කිරීම**
**තිසාවැව ව්‍යාපාරය**



**මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දැනුවත් කිරීම**
**බතලගොඩ ව්‍යාපාරය**

1.6. වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍ය ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මැතිතුමාගේ උපදෙස් පරිදි වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශයේ මගපෙන්වීම යටතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ වාරිමාර්ග කළමනාකරණ අංශය සහ ජාතික ඒකාබද්ධ ගොවි සංවිධානයේ සංවිධානයෙන් ගොවීන් 6000 ක පමණ සහභාගිත්වය ඇතිව අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් “ගොවි මුළුවයි ජනසුවයයි” තේමාව යටතේගොවි සමුළුවක් 2016/04/06 දින බණ්ඩාරනායක සම්මන්ත%k ශාලාවේ දී ගොවි සමුළුවක් පවත්වන ලදි.










**ගොවි සමුළුව - 2016.04.06 දින බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව**

## 2. සහභාගිත්ව නඩත්තු හා ජල කළමනාකරණ වැඩ සටහන

මෙම අංශය මගින් කළමනාකරණය කරනු ලබන මහා වාරිමාර්ග ව්‍යාපෘති 54හි වාරිමාර්ග උප පද්ධතියේ (බෙදුම් ඇල හා කෙත් ඇල) මෙහෙයුම් හා නඩත්තු කටයුතු ගොවි සංවිධාන වෙත පවරා ඇත. මෙම කාර්යය ගුණාත්මයෙන් යුක්තව ඉටු කිරීම සඳහා ගොවි සංවිධාන මෙහෙය වීම මගපෙන්වීම හා ඒ සඳහා ගොවි සංවිධානවල හැකියා වර්ධනය කිරීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

2.1. මෙම අංශයේ මෙහෙයවීම මගපෙන්වීම හා පහසුකරණය යටතේ වාරිමාර්ග උප පද්ධතියේ නඩත්තු කටයුතු වෙනුවෙන් ගොවි සංවිධාන විසින් ලබා දෙන දායකත්වය පහත දැක්වේ.

| ක්‍රියාකාරකම | ඉලක්කය (රු.000) | ප්‍රගතිය (රු.000) | % |
|---|---|---|---|
| බෙදුම් ඇල, කෙත් ඇල හා කෘෂි මාර්ග වල තණකොළ මට්ටමකට කැපීම | 70,419 | 55,536 | 79 |
| වාරි මාර්ග නිර්මිත හා උපාංග නඩත්තුව | 15,939 | 21,138 | 133 |
| කෘෂි මංමාවත් නඩත්තුව | 20,556 | 19,230 | 94 |
| දියබස්නා ඇලවල නඩත්තුව | 9,380 | 8,576 | 91 |
| ශ්‍රමදාන පැවැත්වීම (කැලෑ කැපීම, රොන් මඩ ඉවත් කිරීම් හා වෙනත් කටයුතු) * | 58,873 | 52,258 | 89 |
| **එකතුව** | **175,167** | **156,738** | **89** |

*මිනිස් දින එකක වටිනාකම රු.700.00 කි.




නිරතුරුව නඩත්තු කරන ඇළක්

රාජාංගනය ව්‍යාපාරය




නිරතුරුව නඩත්තු කරන ඇළක්

මිණිපේ ව්‍යාපාරය



ජලජ පැලෑටි ඉවත් කිරීමේ ශ්‍රමදානය
නීලබැම්ම ව්‍යාපාරය




ජලජ පැළෑටි ඉවත් කිරීමේ ශ්‍රමදානය
නුවරවැව ව්‍යාපාරය

2.2. එසේම වාරිමාර්ග උප පද්ධතියේ සහභාගිත්ව නඩත්තු හා ජල කළමනාකරණ වැඩ සටහන් ප්‍රවර්ධනය සඳහා පහත වැඩ සටහන් ක්‍රියාත්මක කර ඇත.

| ක්‍රියාකාරකම | ඒකකය | ඉලක්කය | ප්‍රගතිය | % |
|---|---|---|---|---|
| ගොවි සංවිධාන මට්ටමින් නිරන්තර නඩත්තු සැළසුම් සැකසීම | සංඛ්‍යාව | 213 | 229 | 108 |
| ගොවි සංවිධාන මට්ටමින් නිරන්තර නඩත්තු සැලසුම් යථාවත් කිරීම | සංඛ්‍යාව | 499 | 360 | 72 |
| රක්ෂිත මායිම් සලකුණු කිරීම හා ආරක්ෂා කිරීම | කි.මීටර් | 1076 | 641 | 60 |
| මෙහෙයුම් හා නඩත්තු අරමුදල් වර්ධනය කිරීම | රු. 000 | 75,359 | 60,256 | 80 |
| දැන්වීම් පුවරු සවිකිරීම | සංඛ්‍යාව | 374 | 268 | 50 |
| ජලය ආශ්‍රිත පූජා කර්ම / චාරිත්‍ර වාරිත්‍ර පැවැත්වීම හා ප්‍රවර්ධනය | සංඛ්‍යාව | 353 | 286 | 81 |



රක්ෂිතයේ ඉවත් කලයුතු ගස් හඳුනා ගැනීම
මහකනදරාව ව්‍යාපාරය



රක්ෂිත මායිම් ලකුණු කිරීම - රිදීබැදි ඇළ ව්‍යාපාරය

## 2.3. වාරි සංස්කෘතිය ගොවි ජනතාව හා පාසල් සිසුන් අතර ප්‍රචලිත කිරීම

වාරි පද්ධති කළමනාකරණ කටයුතු සඳහා ජනතා සහභාගිත්වය වර්ධනය සඳහා වාරි සංස්කෘතිකාංග ජනතාව අතර ප්‍රචලිත කිරීම හා ඒවා සුරක්ෂිතව අනාගත පරම්පරාවට දායාද කිරීම සඳහා පවත්වාගෙන යාම අරමුණු කරගෙන මහා වාරිමාර්ග බල ප්‍රදේශ මට්ටමින් සහ ගොවි සංවිධාන මට්ටමින් කිරි ඉතිරවීම, මුට්ටි නැමීම, අලුත් සහල් මංගල්‍ය ඇතුළු සංස්කෘතික මංගල්‍යයන් රාශියක් පවත්වන ලදි. මෙම සංස්කෘතික මංගල්‍යයන් සියළුම ජාතීන් සහභාගිත්වයෙන් පැවැත්වීම විශේෂත්වයකි. 2016 වර්ෂයේ ඉහත වාරි සංස්කෘතික මංගල්‍යයන් 286 ක් පවත්වා ඇත.



**කිරි ඉතිරවීමේ මංගල්‍යය - ඉගිණිමිටිය ව්‍යාපාරය**



**කිරි ඉතිරවීමේ මංගල්‍යය - මහවිලච්චිය ව්‍යාපාරය**



**මුට්ටි නැවීමේ මංගල්‍යය - මහවිලච්චිය ව්‍යාපාරය**



**දේව දානය - දේවහුව ව්‍යාපාරය**

2016 සිරි දළදා යල් අස්වනු පූජාව වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමා;H ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා මෙම අංශය මගින් මෙහෙයවනු ලබන මහා වාරිමාර්ග ව්‍යාපාර j, ගොවි සංවිධාන නායකයින් හා ගොවීන් 2500 ක පමණ සහභාගීත්වයෙන් 2016 ඔක්තෝම්බර් 13 දින Y%S දලදා මාලිගාවේදී පවත්වන ලදි. මෙම සංස්කෘතික මංගල්‍ය මෙතැන් සිට අඛණ්ඩව ඉදිරියට පවත්වාගෙනයාමට අපේක්ෂා කරයි. දළදා මාලිගාවට අමතරව පුල්ලයාර් කෝවිල, මීරා මක්කම් පල්ලිය, ශාන්ත පාවුළු දෙව්මැදුරට ද යල් අස්වනු පූජාකිරීම මෙම යල් අස්වනු පූජාවේ විශේෂත්වයකි. සියළු ජාතීන් නියෝජනය කරමින් ගොවීන් සහභාගී වීම හා යල් කන්නයේ වගාකරණ ලද සියළු බෝග වල අස්වැන්නේ අග්‍රඵල පූජා කිරීම මෙම සංස්කෘතික මංගල්‍යයේ තවත් විශේෂත්වයකි.






2.4. සහභාගිත්ව නඩත්තු හා ජල කළමනාකරණ කටයුතු ප්‍රවර්ධනය සඳහා ගොවීන් හා ගොවි සංවිධාන නිලධාරීන්ගේ දැනුම හා කුසලතා වර්ධනයට පහත පුහුණු හා දැනුවත් කිරීමේ වැඩ සටහන් පවත්වා ඇත.

| පුහුණු හා දැනුවත් කිරීමේ වැඩ සටහන | ඉලක්කය (පුද්ගලයින් සංඛ්‍යාව) | ප්‍රගතිය (පුද්ගලයින් සංඛ්‍යාව) | % |
|---|---|---|---|
| නිරන්තර නඩත්තුව | 2,085 | 1,246 | 48 |
| ජල කළමනාකරණය | 1,265 | 546 | 43 |
| රක්ෂිත ආරක්ෂාව හා නඩත්තුව | 465 | 223 | 48 |
| නීතිමය බලතල | 1,015 | 621 | 61 |
| ජල පාලක පුහුණුව | 280 | 109 | 39 |
| **එකතුව** | **5,110** | **2,745** | **54** |

2016 වර්ෂය අවසානයේ පැවති නියං කාලගුණික තත්වය මත සමහර වාරිමාර්ග ව්‍යාපාර වල වගා කටයුතු සිදු නොකිරීම නිසා අපේක්ෂිත ඉලක්ක ලගා කරගැනීමට නොහැකි විය.



නිරන්තර නඩත්තු පුහුණුව - දමන ව්‍යාපාරය



ජල කළමනාකරණය පුහුණුව - දමන ව්‍යාපාරය

2.5. දේශීය ඖෂධ වගාව ප්‍රචලිත කිරීම හා වාරිමාර්ග රක්ෂිත ආරක්ෂාව සඳහා වාරිමාර්ග රක්ෂිත වල නික හා පාවට්ටා වැනි ඖෂධ වර්ග වගාකිරීමේ නියමු ව්‍යාපෘතියක් රිදීබැදිඇල ව්‍යාපාරයේ තරණගොල්ල ගොවි සංවිධානයේ ක්‍රියාත්මක කර ඇති අතර එම වැඩ සටහන ව්‍යාපාරය පුරාම ක්‍රමානුකූලව ව්‍යාප්ත කරමින් සිටී.



වාරි රක්ෂිතයේ ඖෂධ පැළ සිටුවීම
රිදීබැදි ඇළ ව්‍යාපාරය



වාරි රක්ෂියේ ඖෂධ පැළ සිටුවීම
රිදීබැදි ඇළ ව්‍යාපාරය

2.6. මාර්තු 21 දිනට යෙදෙන ලෝක ජල දිනය සැමරීම සඳහා මහා වාරි බල ප්‍රදේශ වල පහත වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදි.

| වැඩ සටහන | මිනුම් ඒකකය | එකතුව |
|---|---|---|
| ගොවි සංවිධාන නායකයින් දැනුවත් කිරීම | සංඛ්‍යාව | 566 |
| ගොවීන් දැනුවත් කිරීම | සංඛ්‍යාව | 1,213 |
| පාසල් සිසුන් දැනුවත් කිරීම | සංඛ්‍යාව | 3,969 |
| පාසල් සිසුන් අතර චිත්‍ර / රචනා / කථීක තරග පැවැත්වීම | සංඛ්‍යාව | 430 |
| ශ්‍රමදාන පැවැත්වීම | මිනිස් දින | 7,318 |
| | | |





ලෝක ජල දිනය පිළිබද දැනුවත් කිරීමේ පා ගමන - ප්‍රධාන කාර්යාලය




ලෝක ජල දිනය පිළිබද දැනුවත් කිරීමේ පා ගමනක්
මුරුතවෙල ව්‍යාපාරය




ලෝක ජල දිනය පිළිබද දැනුවත් කිරීමේ පා ගමනක්
මුරුතවෙල ව්‍යාපාරය



ලෝක ජල දිනය වෙනුවෙන් පාසල් සිසුන් දැනුවත් කිරීම
බතලගොඩ ව්‍යාපාරය



ලෝක ජල දිනය වෙනුවෙන් පාසැල් සිසුන් දැනුවත් කිරීම
මහකනදරාව ව්‍යාපාරය

2.7. ජල ඒකකයක ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා හෙක් 27,652 ක් අන්තර් මෝසම් වර්ෂාව උපයෝගී කරගෙන බිම් සකස් කිරීමට ගොවීන් යොමු කර ඇත. කෙත් ඇලවල 1146 ක් සහ බෙදුම් ඇලවල 357ක ජල කාලසටහනක් සකස් කිරීමට හා ඒ අනුව වාරි ජලය බෙදා දීම සඳහා අවශ්‍ය පහසුකරණය හා මග පෙන්වීම කර ඇත. විශේෂයෙන්ම 2016 මහ කන්නයේ අපේක්ෂිත වර්ෂාව නොලැබීම නිසා ජල පාලන රැස්වීම් සතියකට

වරක් පවත්වමින් ගොවීන් දැනුවත් කරමින් උපරිම කාර්යක්ෂමතාවයකින් යුක්තව ජල භාවිතය සඳහා කටයුතු කරඇත.

## 3. කෘෂි නිෂ්පාදනය හා නිෂ්පාදන ඵලදායිතාව ඉහල නැංවීම.

3.1. මෙම අංශය සම්බන්ධීකරණය, මෙහෙයවීම හා පහසුකරණය යටතේ ඒකාබද්ධ මහා වාරිමාර්ග කළමනාකරණ වැඩසටහන ක්‍රියාත්මක වන මහා වාරිමාර්ග ව්‍යාපාර 54 හි කෘෂිකාර්මික නිෂ්පාදනය හා ඵලදායීතාවය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| | ඒකකය | 2015/16 මහ | 2016 යල | 2016 |
|---|---|---|---|---|
| වී වගා කළ බිම් ප්‍රමාණය (හෙක්) | හෙක්. | 152,384 | 126,236 | 278,620 |
| වෙනත් ආහාර බෝග වගාව | හෙක් | 1,959 | 10,288 | 12,247 |
| බහු වාර්ෂික බෝග වගාව (කෙසෙල්, උක්) | හෙක් | 4,236 | 4,236 | 4,236 |
| වගා කළ මුළු බිම් ප්‍රමාණය | හෙක් | 158,579 | 140,760 | 299,339 |
| වගා තිව්‍රතාවය | % | | | 182 |
| මුළු වී නිෂ්පාදනය | ටොන් මිලියන | 0.73 | 0.57 | 1.33 |
| වී නිෂ්පාදනයේ වටිනාකම | රුපි. මිලියන | 25,600 | 22,721 | 48,321 |
| වෙනත් ක්ෂේත්‍ර බෝග හා එළවලු නිෂ්පාදනයේ වටිනාකම | රුපි. මිලියන | 519 | 2,464 | 2,983 |
| බහු වාර්ෂික බෝග නිෂ්පාදනයේ වටිනාකම | රුපි. මිලියන | - | - | 2,275 |
| වී, වෙනත් ක්ෂේත්‍ර බෝග , එළවලු හා බහු වාර්ෂික බෝග නිෂ්පාදනයේ මුළු වටිනාකම | රුපි. මිලියන | - | - | 53,579 |

ජාතික ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා වාරි ඉඩම් වල 12,247 ක වෙනත් ආහාර භෝග වගා කිරීමට හැකිවීම විශේෂත්වයකි.



රටකජු වගාව - රිදීබැඳි ඇල ව්‍යාපාරය




බඩඉරිගු වගාව - 2016 යල හුරුළුවැව ව්‍යාපාරය

තවද ජාතික ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීමට, ගොවි පවුලේ ආදායම වැඩි කිරීම, අනෙකුත් ප්‍රජාවට ආදායමක් ලබාදීම හා පසට කාබනික පොහොර එකතු කිරීම අරමුණු කරගෙන තෝරා ගත් මහා වාරිමාර්ග ව්‍යාපාර වල තුන්වන කන්නයේ හෙක්. 7764 ක මුං වගා කරණ ලද අතර එමගින් රුපියල් මිලියන 1164 ක ආදායමක් ලබාගැනීමට හැකි වී ඇත.





තුන්වන කන්නයේ මුං වගාව - කිරිදිඔය ව්‍යාපාරය

තුන්වන කන්නයේ මුං වගාව - කන්තලේ ව්‍යාපාරය

3.2. වී වගාවේ සාමාන්‍ය අස්වැන්න ඉහල නැංවීම හා වල් නාශක භාවිතය අඩු කිරීම සඳහා හෙක්ටයාර් 527 ක බීජ පැල විසුරුම් වගා ක්‍රමය (Parachute Method) ව්‍යාප්ත කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය සිදු කරන ලදී. එසේම, හෙක් 34 ක වපසරියක යාන්ත්‍රික පැල සිටුවීම සඳහා ගොවීන් යොමු කරවීම සිදු කර ඇත. වී වගාව සඳහා හෙක් 7272 ක කාබනික පොහොර යෙදීමට අවශ්‍ය සම්බන්ධීකරණය සිදු කර ඇත.



පැළ විසුරුම් ක්‍රමය භාවිතය - දඹරාව ව්‍යාපාරය



පැළ විසුරුම් ක්‍රමය යටතේ වගා කරන ලද වී වගාවක්
දඹරාව ව්‍යාපාරය



යන්ත්‍ර මගින් පැළ සිටුවීම - ඉගිනීමිටිය ව්‍යාපාරය



යන්ත්‍ර මගින් පැළ සිටුවන ලද වී වගාවක්

ඉගිනීමිටිය ව්‍යාපාර

3.3. ලොකු ළූණු බීජ හිඟයට පිළියමක් ලෙස දේවහුව ව්‍යාපාරයේ මව් බල්බ කිලෝග්‍රෑම් 8650 ක් වගා කර බීජ කිලෝග්‍රෑග්‍රෑම් 500 නිෂ්පාදනය කරන ලද අතර එහි වටිනාකම රු.මිලියන 7 කි.



ලොකුළූණු පැළ සිටුවීම - දේවහුව ව්‍යාපාරය



ලොකුළූණු බීජ වගාව - දේවහුව ව්‍යාපාරය

3.4. ගොවියාගේ නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් ලබා දීම සඳහා ගොවියා හා මිලදී ගන්නා ආයතන අතර ඇති කර ගන්නා ලද ඉදිරි වෙළඳ ගිවිසුම් යටතේ ගොවි නිෂ්පාදන අලෙවිකරණය සඳහා පහසුකම් සපයන ලදී. ඒ අනුව, හුරුළු වැව, නාච්චදූව හා නුවර වැව ව්‍යාපාරවල සෝයා හෙක්ටයාර් 1365 සඳහා ගිවිසුම 1680 අත්සන් කරන ලද අතර බඩඉරිඟු හෙක්ටයාර් 520 සඳහා ගිවිසුම් 530 ක් අත්සන් කරන ලදී.



සෝයා වගාව - නාච්චාදූව ව්‍යාපාරය



අස්වැන්න නෙලීමට ආසන්න සෝයා වගාව
හුරුළුවැව ව්‍යාපාරය

3.5. ගොඩ ඉඩම් සංවර්ධනය කිරීම තුලින් ගොවීන්ට ආදායම් මාර්ගයක් සලසා දීම අරමුණු කරගෙන වාරිමාර්ග කළමනාකරණ අංශයේ සම්බන්ධීකරණය යටතේ කිරිදි ඔය මහා වාරිමාර්ග ව්‍යාපාරයේ ගොවින් 164 දෙනෙකු සම්බන්ධ කරගෙන අක්කර 41 ක ආරම්භ කළ අපනයන තත්වයේ අඹ ප්‍රභේදයක් වන TOM EJC අඹ වගාව සාර්ථකව පවත්වා ගෙන යනු ලැබේ. මේ වන විට එම පැලවල වයස අවු 3 ක් පමණ ගත වී ඇති අතර මේ වන විට ඵල දරණ තත්වයේ පවතී.





3.6. වස විසෙන් තොර කෘෂිකර්මාන්තයක් සඳහා ගොවීන් යොමු කරවීම අරමුණු කරගෙන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණික උපදෙස් මත මෙම අංශයේ සම්බන්ධීකරණය හා මැදිහත්වීම මත ගොවි සංවිධාන වල සහභාගිත්වයෙන් කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේ වැඩ සටහනක් ආරම්භ කර ඇත. එහි පලමු වැඩසටහන වේලිඔය ව්‍යාපාරයේ ඇත්දත්ගල ගොවි සංවිධානය බල ප්‍රදේශයේ ගොවින් 14 ක් සම්බන්ධ කරගනිමින් ආරම්භ කරන ලදී. එසේම රිදියගම මහා වාරිමාර්ග ව්‍යාපාරයේ ප්‍රගති ගොවි සංවිධානය ගොවීන් 70 සම්බන්ධ කර ගෙන කාබනික පොහොර නිෂ්පාදනය කිරීම ආරම්භ කර ඇත. මෙම කාබණික පොහොර ඒකක දෙකෙන් 2016 වර්ෂය තුලදී කාබණික පොහොර කි.ග්‍රෑම් 11000 ක් නිෂ්පාදනය කර වගාවට යොදා ඇත.

මොණරාගල දිස්ත්‍රික්කයේ කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය ප%වර්ධනය කිරීමේ නියමු වැඩ සටහනක් ලෙස වාරිමාර්ග කළමනාකරණ අංශය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජනසංවර්ධන දෙපාර්තමේන්තුව, දිවිනැගුම දෙපාර්තමේන්තුව යනා දී ආයතන වල මොණරාගල දිස්;%sක්කයේ සේවය කරනු ලබන ක්ෂේත% නිලධාරීන් හා තෝරාගත් ගොවි සංවිධාන නායකයින් 457ක් පුහුණු කර ඇත.



**කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය**
**රිදියගම ව්‍යාපාරය**



**කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය**
**වේලිඔය ව්‍යාපාරය**





**මොණරාගල දිස්ත්‍රික්කයේ ක්ෂේත්‍ර නිළධාරීන් සඳහා නායකත්ව හා අභිප්‍රේරණ පුහුණුව ලබා දීම**
**ග්‍රාමීය නායකයින් පුහුණු කිරීමේ මධ්‍යස්ථානය ඇඹිලිපිටිය**

3.7. වාරිමාර්ග කළමනාකරණ අංශයේ සම්බන්ධීකරණය හා පහසුකරණය යටතේ ඉහිනිමිටිය මහා වාරිමාර්ග ව්‍යාපාරයේ වී වල අගය වැඩි කිරීම සඳහා බිස්කට් නිෂ්පාදනයට යොදා ගැනෙන BG MA2 වී ප්‍රභේදය 2016 යල කන්නයේ අක්කර 175 ක් සහ 2016 මහ කන්නයේ අක්කර 105 ක වගා කරන ලදි. මෙම වී කිලෝ ග්‍රෑම් එකක් රු 38.00කට මිලදී අලෙවි කිරීම සඳහා ඉදිරි වෙළඳ ගිවිසුම් අත්සන් කරන ලදි. එසේම මෙම වැඩසටහන තිරසරව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය බිත්තර වී නිෂ්පාදනයට අක්කර 05ක බීජ වී නිෂ්පාදන වැඩ සටහනක් ක්‍රියාත්මක කර ඇත.

3.8. කිරි නිෂ්පාදනය ඉහල නැංවීම සහ එමගින් ගොවි පවුලේ ආදායම ඉහල නැංවීම අරමුණු කර ගෙන කිරිදිඹය, නුවරවැව, දේවහුව, රාජාංගනය මහා වාරිමාර්ග ව්‍යාපාර වල සත්ව පාලන කටයුතු ව්‍යාප්ත කිරීම සඳහා පහසුකරණය හා මග පෙන්වීම ඇති අතර එහි ප්‍රගතිය පහත දැක්වේ.

| කාර්යයන් | මිනුම් ඒකකය | ප්‍රමාණය |
|---|---|---|
| කිරි ගවයන් බෙදා දීම සඳහා පහසුකරණය | සංඛ්‍යාව | **34** |
| විදිමත් ගවගාල් ඉදිකිරීම සඳහා පහසුකරණය | සංඛ්‍යාව | **33** |
| CO3 තෘණ වගාව ව්‍යාප්ත කිරිම සඳහා පහසුකරණය | හෙක්. | **9** |

එසේම කිරිගවයින් ලබා ගැනීම සඳහා බැංකු මගින් රු.මිලියන 5.4 ක uQ,H පහසුකම් ලබා දීම කටයුතු සම්බන්ධීකරණය කර ඇත.

3.9. ගෙවතු වගා සංවර්ධනය යටතේ අඹපැල 2642 ක් ද දොඩම් පැල 3722 ක් ද පොල් පැළ 13145 ක් ද දෙළුම් පැල 3400 ක් ද වගා කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය හා පහසුකරණය කර ඇත.

3.10. ගොවි පවුලේ ආදායම ඉහල නැංවීම සඳහා ගොඩ ඉඩම් වල කෙසෙල් හෙක්.245 ක් ද පැපොල් හෙක්.84 ක් ද කජු හෙක්.30 ක් හා ගම්මිරිස් පැළ 16300 ක් ද සිටු වීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය හා පහසුකරණය කර ඇත.

3.11. 2016 වාරි බල ප්‍රදේශ වල ක්‍රියාත්මක වැඩ සටහන් වල ප්‍රගතිය පරීක්ෂා කිරීම සඳහා සියලු පාර්ශව වල සහභාගිත්වයෙන් රිදීබැදි ඇළ ව්‍යාපාරයේ ක්ෂේත්‍ර දින වැඩසටහනක් ක් සිදු කර ඇත.





3.12. ජගත් පරිසර දින සැමරුමට සමගාමීව ගංගා ඉවුරු ඛාදනය වැලැක්වීම සඳහා කලාඔය ඉවුරේ උණ පැළ 1000 ක් රාජාංගනය නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේ සම්බන්ධීකරණයෙන් සිටුවා ඇත. එසේම ජාතික පරිසර මාසය හා වනරෝපා ජාතික රුක් රෝපණ වැඩ සටහන යටතේ පහත කාර්යයන් ඉටුකර ඇත.

3.12.1. පරිසර සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳව ගොවීන් 1250 ක් දැනුවත් කිරීම.

3.12.2. කෘෂි රසායන බෝතල් හා ඝණ අපද්‍රව්‍ය එකතු කිරීම සඳහා ඇල ඉවුරුවල බඳුන් 169 ක් ස්ථාපිත කිරීම.

3.12.3. ඇල ඉවුරු හා රක්ෂිත වල තෝරාගත් පැල වර්ග 5550 ක් සිටුවීම.

3.12.4. වාරිමාර්ග ඇලවල් සහ රක්ෂිත වලට දමා ඇති කැලි කසල ඉවත් කිරීමේ ශ්‍රමදාන 17 ක් පැවැත්වීම.





අඹගස්වැව රක්ෂිතයේ පැල සිටුවීම කවුඩුළුවැව ව්‍යාපාරය




ඇල ඉවුරුවල කුණු කසළ ඉවත් කිරීමේ ශ්‍රමදානය පැවැත්වීම - කිරිදිඔය ව්‍යාපාරය



බතලගොඩ ව්‍යාපාරය ජලාශය අසල අපද්‍රව්‍ය ඉවත් කිරීම - බතලගොඩ ව්‍යාපාරය



කෘෂි රසායන ඇසුරුම් එකතු කිරීමේ බඳුන් ස්ථාපිත කිරීම රිදීබැදිඇල ව්‍යාපාරය



කෘෂි රසායන ඇසුරුම් එකතු කිරීමේ බඳුන් ස්ථාපිත කිරීම මී ඔය ව්‍යාපාරය

උණ පැළ සිටුවීම - රාජාංගනය ව්‍යාපාරය

3.13. කෘෂි නිෂ්පාදන ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා ගොවීන්ගේ දැනුම හා කුසලතා වර්ධනයට පහත පුහුණු හා දැනුවත් කිරීමේ වැඩ සටහන් පවත්වා ඇත.

| පුහුණු වැඩ සටහන | ඉලක්කය (පුද්ගලයින් සංඛ්‍යාව) | ප්‍රගතිය (පුද්ගලයින් සංඛ්‍යාව) | % |
|---|---|---|---|
| 1. ක්ෂේත්‍ර අත්දැකීම් හුවමාරුව | 1751 | 2528 | 92 |
| 2. පැළ විසුරුම් තාක්ෂණය | 1000 | 563 | 56 |
| 3. පසු අස්වනු තාක්ෂණය | 410 | 209 | 51 |
| 4. සත්ව පාලනය | 169 | 143 | 85 |
| 5. වෙනත් ආහාර බෝග වගාව ව්‍යාප්ත කිරීම | 1800 | 1762 | 98 |
| 6. කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය | 910 | 483 | 53 |
| 7. ගොවි පොළ ජල කළමනාකරණය | 620 | 402 | 65 |
| 8. බහුවාර්ෂික බෝග වගාව ප්‍රචලිත කිරීම | 3000 | 3090 | 101 |
| 9. කිරි ආශ්‍රිත ආහාර නිෂ්පාදනය | 450 | 508 | 113 |
| 10. වෙනත් පුහුණු හා දැනුවත් කිරීම් | 1,540 | 545 | 35 |
| **එකතුව** | **12650** | **10233** | **81** |






වෙලිඔය ගොවීන් යාපනය ගොවීන් සමඟ යාපනයේ දී අත්දැකීම් හුවමාරු කර ගැනීම






**ගම්මිරිස් වගාව පිළිබඳ දැනුවත් කිරීම - වෙලිඔය ව්‍යාපාරය**

## 4. නිලධාරීන්ගේ හැකියා වර්ධනය

මෙම අංශයේ නිලධාරීන්ගේ හැකියා වර්ධනය සඳහා පහත පුහුණු වැඩ සටහන් පවත්වා ඇත.

| පුහුණු වැඩ සටහන | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|
| අභිප්‍රේරණ හා නායකත්ව පුහුණු වැඩසටහන | 148 |
| එක් අවුරුදු පශ්චාත් උපාධි පාඨමාලාව - කැළණි විශ්ව විද්‍යාලය | 2 |
| නිවැරදි ධාවන මංතීරු භාවිතය හා ඵලදායී රියදුරකු ලෙස සේවය සැලසීම පිළිබඳ පුහුණු වැඩමුළුව | 36 |
| ඊ තාක්ෂණය භාවිතය තුළින් දත්ත හා තොරතුරු හුවමාරුව පහසුකරණය කිරීම | 34 |
| පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළුව | 32 |
| වෙනත් පුහුණු | 14 |

ඉහත අභිප්‍රේරණ හා නායකත්ව පුහුණුව ඒ සඳහා විශේෂ කුසලතාවක් ඇති සම්පත්දායකයකු මගින් මෙම අංශයේ සියළු ක්ෂේත්‍ර නිලධාරීන්ට හා ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන්ට ලබා දෙන ලදි.




**පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩ මුළුව - මහවැලි පුහුණු ආයතනය ගිරාදුරු කොට්ටේ**



මාර්ග නීති පිළිබඳ රියදුරන් දැනුවත් කිරීම
රතනපිටිය ග්‍රාම සංවර්ධන පුහුණු ආයතනය



ඊ තාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම
සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA)

## 5. ප්‍රගති සමාලෝචන වැඩමුළු පැවැත්වීම

2016 ක්‍රියාත්මක සැලැස්මේ ප්‍රගති සමාලෝචනය කිරීම හා ශුන්‍ය පාදක අයවැය යටතේ ලබා දෙන ප්‍රතිපාදන වියදම් කිරීම පිළිබඳව දැනුවත් කිරීමේ අරමුණින් වැඩමුළු 03 ක් අතුරුගිරිය ජාතික වැවිලි කළමනාකරණ ආයතනය, ත්‍රිකුණාමල සර්වෝදය පුහුණු මධ්‍යස්ථානය හා තලාහේන ප්‍රජා අධ්‍යපන පුහුණු ආයතනයේදී පවත්වන ලදි. මේ සඳහා සියළුම නේවාසික ව්‍යාපාර කළමනාකරුවන් හා ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් සහභාගි වන ලදි.

## 6. විශේෂ වැඩ සටහන්

6.1. තරුණ පරපුර කෘෂිකර්මයට යොමු කිරීම සඳහා අවශ්‍ය ආකල්පමය වෙනසක් ඇති කිරීම අරමුණු කරගෙන පොලොන්නරුව දිස්ත්‍රික්කයේ තරුණ තරුණියින් 131 ක සහභාගීත්වයෙන් පුහුණු වැඩ සටහන් 2 ක් පවත්වන ලදි.



පුලතිසි උදාන ගොවි වැඩමුළුව - කුන්ඩසාලේ පුහුණු ආයතනය

6.2 මහවැලි හා පරිසර අමාත්‍යාංශයේ වේලි ආරක්ෂණ ව්‍යාපෘතියේ සමාජ ආරක්ෂණ වැඩ සටහන මහකනදරාව සහ මහවිලච්චිය ව්‍යාපාර වල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය හා පහසුකරණය කර ඇත. මේ යටතේ මිනිස් දින 67,359 ක් බෙදුම් ඇලවල් සහ කෙත් ඇළවල් නඩත්තුව සඳහා ලබා දී ඇත.



**සමාජ ආරක්ෂණ වැඩ සටහනේ ශ්‍රමදායකත්වයෙන් නඩත්තු කරන ලද බෙදුම් ඇලක්**
**මහවිලච්චිය ව්‍යාපාරය**



**සමාජ ආරක්ෂණ වැඩ සටහනේ ශ්‍රමදායකත්වයෙන් නඩත්තු කරන ලද බෙදුම් ඇලක්**
**මහකනදරාව ව්‍යාපාරය**

6.3 ශ්‍රී ලංකා ජල සංසදය හා එක්ව දේශගුණික වෙනස් වීම් වලට අනුගත වීම පිළිබඳව ගොවීන් 65 දෙනෙකු දැනුවත් කර ඇත.

6.4 වයඹ හා උතුරු මැද පලාත් ප්‍රාදේශීය සංවර්ධන බැංකු සමග එක්ව ගොවීන් 240 දෙනකු සඳහා රු. ලක්ෂ 02 ක උපරිමයකට යටත්ව ආදායම් උත්පාදන කටයුතු සඳහා ණය පහසුකම් ලබා දී ඇත.




**කෘෂි නිෂ්පාදන අලෙවිසැලක් - රාජාංගනය ව්‍යාපාරය**




**පන් ආශ්‍රිත නිෂ්පාදන - රාජාංගනය ව්‍යාපාරය**

## 7 මහජන දුක් ගැනවිලි හා පැමිණිලි වලට විසඳුම් ලබා දීම

මෙම අංශයේ ප්‍රධාන කාර්යාලයට හා නේවාසික ව්‍යාපාර කාර්යාල වලට ලැබුණු මහජන දුක් ගැනවිලි හා පැමිණිලි වලට විසඳුම් ලබා දීම පහත පරිදි වේ.

- ❖ මහජන දුක් ගැනවිලි/පැමිණිලි ලැබුණු සංඛ්‍යාව 2225
- ❖ ඉන් විසඳුම් ලබාදුන් සංඛ්‍යාව 2132
- ❖ විසඳුම් ලබා දීමේ ප්‍රතිශතය 95%

## ඉ. ජල සම්පත් මණ්ඩලය

**ජල සම්පත් මණ්ඩලය විසින් සිදුකරන ලද ක්‍රියාකාරකම්වල ප්‍රගතිය 2016.01.01 සිට 2016.12.30 දක්වා**

### 01. භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ සිදුකල භූජල අධ්‍යයන

### 1.1 කොළඹ සිට මීගමුව දක්වා දිවෙන වෙරළබඩ වැලි සහිත ජලධරයෙහි සිදුකරන සවිස්තරාත්මක භූජල විද්‍යාත්මක අධ්‍යයනය (රු. මිලියන 0.25)

කොළඹ සිට මීගමුව දක්වා දිවෙන වෙරළබඩ වැලි සහිත ජලධරයෙහි සිදු කරන සවිස්තරාත්මක භූ ජල විද්‍යාත්මක අධ්‍යයනය 2011 වර්ෂයේදී ආරම්භ කරන ලදී. මෙම අධ්‍යයනය මූලික අරමුණ වූයේ මෙම ප්‍රදේශය තුල පරීක්ෂණ නල ළිං ඉදි කර භූජල සමීක්ෂණ ජාලයක් පිහිටුවීම මගින් භූගත ජල මට්ටමේ හා ගුණාත්මක භාවයේ සිදුවන වෙනස්කම් අධ්‍යයනය කිරීමයි. මෙම පරීක්ෂණ නළ ළිං කර්මාන්ත සඳහා විශාල වශයෙන් ජලය උකහා ගන්නා හා නාගරීකරණය හේතුවෙන් දූෂණයට ලක් විය හැකි ප්‍රදේශ මෙන්ම පාරිසරික සංවේදී කලාප තෝරාගෙන ඉදි කරන ලදී. 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා මෙහි අදාල ක්‍රියාකාරකම් සිදු කරන ලද අතර අවසානයේ නිරීක්ෂණ නල ළිං ස්ථාපනය කරන ලදී.

ඉදි කරන ලද පරීක්ෂණ නළ ළිං 78 ක් භූ ජල සමීක්ෂණ ජාලය ලෙස තෝරා ගන්නා ල දී. ඒ අනුව 2015 වර්ෂයේ සිට කාර්තු 04 තුළදී (වර්ෂා කාල හා අන්තර් මෝසම් කාල වලදී) ජල සාම්පල හා ජල මට්ටම් පරීක්ෂා කිරීම ආරම්භ කරන ලදී.

**2016 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ප්‍රගතිය පහත පරිදි වේ.**

වියලි කාලය තුලදී සහ එක් අන්තර් මෝසම් කාලයකදී ජල සාම්පල එකතු කල අතර ළිං වල ජාල මට්ටම්ද නිරීක්ෂණය කරන ලදී.

| **ක්‍රියාකරකම්** | **සාම්පල ගණන** | | | |
|---|---|---|---|---|
| | **කාර්තුව 01** | **කාර්තුව 02** | **කාර්තුව 03** | **කාර්තුව 04** |
| ජල සාම්පල එක්රැස් කිරීම | 78 | 73 | 73 | 76 |
| ජල සාම්පල රසායනික විශ්ලේෂණය | 78 | - | - | 82 |
| ජල මට්ටම් මැනීම | 78 | 73 | 73 | 76 |





*ජල සාම්පල එක්රැස් කිරීම හා ජල මට්ටම් මැනීම*

## 1.2 අනුරාධපුර දිස්ත්‍රික්කයේ දිගුකාලීන භූගත ජලය අධ්‍යයනය හා ජලය ආශ්‍රිත රෝග සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන පැවැත්වීම (රු. මිලියන 0.25)

මෙම අධ්‍යයනය අනුරාධපුර දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික කටයුතු සිදුකරන හා වකුගඩු රෝග පැතිර පවත්නා ප්‍රදේශවල සිදුකරන ලදි. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ කාලගුණයන් සමග සිදුවන ස්වභාවික හා කෘත්‍රිම ක්‍රියාකාරකම් නිසා ජලයේ ගුණාත්මකභාවයෙහි වෙනස්වීම අධයයනය කිරීමය. 2016 ජනවාරි මස සිට 2016 දෙසැම්බර් මස දක්වා ඉහත ව්‍යාපෘතිය යටතේ සිදුකරනු ලැබූ ක්‍රියාකාරකම් පිළිබඳ සංක්ෂිප්ත ප්‍රගතිය පහත දක්වා ඇති පරිදි වේ.

| ක්‍රියාකාරකම් විස්තරය | එකතුව |
|---|---|
| ස්ථාපිත කරන ලද නිරීක්ෂණ ජාලයේ ජල නියැදි එකතු කිරිම. | 200 |
| ජල සාම්පල් විශ්ලේෂණය | 70 |
| ජල සායන පැවැත්වීම | 05 |

## 1.3 මන්නාරම් දිස්ත්‍රික්කයේ හුණුගල් ජලධර පිළිබද විස්තරය

මන්නාරම් ප්‍රදේශය සීඝ්‍රයෙන් දියුණු වන අතර ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික කටයුතු සිදුකරනු ලබයි. මේ සඳහා ප්‍රධාන වශයෙන් වාරි ජලය ලබා ගන්නා අතර වියළි කාලයේ ගැඹුරු නලළිං ආශ්‍රයෙන් ජලය ලබා ගෙන ඇතැම් ප්‍රදේශ වල කෘෂි කාර්මික කටයුතු සිදු කරයි. මෙම ප්‍රදේශයේ ප්‍රධාන ලෙස බීමට හා ගෘහස්ථ පරිභෝජනය සඳහා ජලය ලබා ගනු ලබනුයේ ගැඹුරු නල ළිං උපයෝගී කර ගෙනය. එම නිසා මන්නාරම් ප්‍රදේශයේ ගැඹුරු හුණුගල් ආශ්‍රිත ජලධර ප්‍රධාන ලෙස ජලය ලබා ගැනීම සඳහා භාවිතා කරයි. මෙම ජලධර හුණුගල් තුල පිහිටි එකිනෙකට සම්බන්ධ කුහර හා පැලුම් අතර පිහිටා ඇත. එම නිසා දීර්ඝකාලීනව අධික ලෙස ජලය ලබා ගැනීමේදී භූගත ජලයට සිදුවන බලපෑම හා හානිය පිළිබඳ අධ්‍යයනය කිරීම අනිවාර්ය වේ. තවද වෙරළට ආසන්නයේදී භූගත ජලය ලබා ගැනීමේදී මුහුදු ජලය රට තුලට පැමිණීමට හැකි බැවින් ඒ පිළිබඳ අධ්‍යයනය කිරීම සිදු කල යුතු වේ. ඉදිරි තිරසාර සංවර්ධනය සඳහා හුණුගල් ආශ්‍රිත

භූගත ජල ප්‍රභවය භාවිතා කිරීමට අවශ්‍ය නිර්ණායකයන් සොයා බැලීම, අවශ්‍ය ක්‍රමවේද හා සැලසුම් සකස් කිරීම මෙවැනි අධ්‍යයනයන් මගින් සිදු කිරීමට හැකි වේ.

**ප්‍රධාන ක්‍රියාකාරකම් හා ප්‍රතිඵල**

නොගැඹුරු හා ගැඹුරු භූගත ජලධර අධ්‍යයනය කිරීම සඳහා ප්‍රතිරෝධතා විද්‍යුත් ක්‍රම භාවිතා කරන ලදි. මේ යටතේ භූජල විද්‍යාත්මක සමීක්ෂණ 15 ක් මුරුකන්, උයිලන්කුලම, වට්ටකන්ඩාල්, අඩම්පාන්, නනද්ඩන්, ඇරවද්ඩන්, වන්කාලෛයි, තලාදි, සිලාවතුර හා පපරාකඩන්තන් යන ප්‍රදේශවල සිදුකරන ලදි.

**පරීක්ෂණාත්මක නල ළිං ඉදි කිරිම.**

භූජල සමීක්ෂණ මගින් තෝරාගත් ස්ථානවල පරීක්ෂණ නල ළිං 15 ක් ඉදි කර ඇත.

**ජල නිමානය හා ජල සාම්පල් විශ්ලේෂණය**

මෙය යටතේ ජල සාම්පල 270 ක් එක්රැස් කල අතර ඉන් නොගැඹුරු ජල නිමාන පද්ධතියෙහි ජල සාම්පල් 96 එක් රැස් කර ඇති අතර ගැඹුරු නල ළිං පද්ධතියෙහි ළිං 31 ක ජල සාම්පල් එක් රැස් කර රසායනාගාරය වෙත විශ්ලේෂණය සඳහා ලබා දී ඇත. මේ යටතේ සම්පූර්ණ රසායනික විශ්ලේෂණ සමග නයිට්‍රේට් හා කාබන් සඳහා විශ්ලේෂණ සිදුකර ඇත.

**පොම්ප පරීක්ෂණ සිදු කිරීම.**

මෙය යටතේ පොම්ප පරීක්ෂණ කටයුතු 20 ක් අදාල වර්ෂය තුළ සම්පූර්ණ කර ඇත.





## 1.4 වව්නියාව හා කිලිනොච්චි දිස්ත්‍රික්ක වල සිදු කරන ලද භූජල අධ්‍යයනය.

2013 වර්ෂයේ භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ආරම්භ වු මෙම අධ්‍යයන ව්‍යාපෘතියේ අරමුණ වන්නේ අනාගතයේ පානීය ජලය අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහාත් කුඩා පරිමාණයේ වාරි කෘෂිකර්මාන්ත ව්‍යාපෘතිය සඳහා භූගත ජල විභව සහිත ප්‍ර දේශ හඳුනා ගැනීමත් මෙම ප්‍ර දේශ වල භූගත ජල ප්‍රභව සංවර්ධනය කිරිමට ඇති හැකියාව නිරීක්ෂණය කිරිම සඳහාත්ය.

තවද වවුනියාව හා කිලිනොච්චි දිස්ත්‍රික්කයන්හි භූගත ජල විබවය සහිත ප්‍ර දේශ වල ව්‍යාප්තිය වැඩිදියුණු කිරිම හා භූගත ජලය පිළිබද සීමා මායිම් පැනවීම සදහා භූගත ජලධරවල විවිධ පරාමිතීන් අධ්‍යයනය මෙම ව්‍යාපෘතියේ විශේෂ අරමුණක් වේ.

මෙහිදී අනාගත පානීය ජල අවශ්‍යතාව සපුරා ගැනීමට හා කුඩා පරිමාණ වාරි කර්මාන්තය ව්‍යාපෘති සදහා භූගත ජල ප්‍රභව හදුනා ගැනීම තුලින් මෙමම දිස්ත්‍රික්ක වල ජීවත් වන ජනතාවගේ ජීවන තත්වය ඉහල නැංවීම ප්‍රධාන අභිලාෂය වේ.

මෙම ව්‍යාපෘතිය යටතේ 2016 ජනවාරි සිට 2016 දෙසැම්බර් මස දක්වා සිදු කල ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

| අංකය | ක්‍රියාකාරකම්/ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | ජල සාම්පල් ලබා ගැනීම හා ළිං නිමානය කිරිම | 200 |
| 02 | ජල සාම්පල් රසායනිකව පරික්ෂාව | 100 |





## 1.5 යාපනය අර්ධද්වීපයේ භූගත ජල නිමාන පද්ධතිය සංවර්ධනය කිරීම

යාපනය අර්ධද්වීපයේ සම්පූර්ණ ජල සැපයුම සිදු කෙරෙනුයේ භූගත ජල සම්පත් මගින් නිසා යාපනය හුණුගල් සහිත ජලධර රටේ ඉතාමත් වැදගත් ජලධරපද්ධතියක් ලෙස සලකනු ලැබේ. ප්‍රබලව සිදුවන කෘෂිකර්මාන්තය සහ අනෙකුත් මිනිස් ක්‍රියාකාරකම් නිසා යාපනයේ හුණුගල් ජලධර ද දූෂණයට ලක්වීමේ ප්‍රවනතාව අවම කරලීම සඳහා අවශ්‍ය භූජල විද්‍යාත්මක දත්ත එක්රැස් කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ.

| අනු අංකය | කාර්යය | ප්‍රගතිය |
|---|---|---|
| 01 | භූගත ජල සමීක්ෂණ සිදු කිරීම | 30 |
| 02 | පර්යේෂණ නල ළිං ඉදි කිරීම | 28 |
| 03 | ජල ධාරිතා පරීක්ෂණ පැවැත්වීම | 30 |

| | | |
|---|---|---|
| 04 | ජල නියැදීන් එක්රැස් කිරීම | 568 |
| 05 | වල ජල මට්ටම් ලබාගැනීම | 30 |
| 05 | ජල නියැදීන්වල රසායනික විශ්ලේෂණය | 300 |
| 06 | දත්ත විශ්ලේෂණය කර වාර්තා සකස් කිරීම | සිදුකෙරෙමින් පවතී |



## 1.6 කාළගුණික විපර්යාසයන් හේතුවෙන් ශ්‍රී ලංකාවේ වෙරළාසන්න ජලධර පද්ධතියට සිදුවිය හැකි ඍජු හා වක්‍ර බලපෑම් පිලිබඳ අධ්‍යයනය

**බස්නාහිර වෙරළාසන්න භූගත ජලධරය - කොළඹ සිට වැලිගම දක්වා දිවෙන වෙරළ තීරය**

මෙම ව්‍යාපෘතියේ අරමුණ ලඟා කර ගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් 2016 ජනවාරි මස සිට දෙසැම්බර් මාසය දක්වා කාල පරාසය තුළදී සිදුකරන ලදි.

- **ජල නියැදි එකතු කිරීම හා ජල මට්ටම් විචලනය මැනීම - ජල නියැදි 200 කි.**

වෙරළාශ්‍රිත භූගත ජලධරයේ ලවනතාවයේ සිදුවන වෙනස්කම් හා ජල මට්ටමේ විචලනයන් අධ්‍යයනය කිරීම සඳහා ස්ථාපිත භූගත ජල නිමාන පද්ධතියේ තවදුරටත් මෝසම් කාලවකවානුවට අනුකූලව ජල මට්ටම් මැනීම හා ජල නියැදි එකතු කිරීම සිදු කරන ලදී.

මෙහිදී 2016 අගෝස්තු මස දක්වා ජල නියැදි එකතු කිරීමේ අවස්ථා 02 ක් මෝසම් කාලයන්ට අනුරූපව වරකට ජල නියැදි 50 බැගින් එකතු කිරීම සිදු කරන ලදී. (මුලු නියැදි ගණන 200) ඊසානදිග මෝසම් කාලයට අදාලව එකතු කරන ලද ජල නියැදි පරාමිතීන් 17 ක් සඳහා විශ්ලේෂණය කරන ලද අතර පළමු අන්තර් මෝසම් කාලයට අදාල ජල නියැදි අත්‍යාවශ්‍ය පරාමිතීන් සඳහාද විශ්ලේෂණය කරන ලදී.

- **භූජල සමීක්ෂණ -10**

2016 ව්‍යාපෘති සැලැස්මට අනුව කොළඹ සිට වැලිගම දක්වා දිවෙන වෙරළ තීරයේ භූජල සමීක්ෂණ 10 ක් සිදු කිරීමට තිබුණු අතර එම භූජල සමීක්ෂණ 10 අගොස්තු මස වන විට අවසන් කරන ලදී.

- **පරීක්ෂණ නල ළිං ඉදි කිරීම හා ජලධාරිතා පරීක්ෂණ සිදුකිරීම -10**

පරීක්ෂණ නල ළිං ඉදි කිරීම් 10 ක් සිදුකල අතර ඉදිකරනු ලැබූ නල ළිං වල ජලධාරිතා පරීක්ෂණ සිදුකරන ලදි.




*ජල මට්ටම් මැනීම - නිදහස් වෙළඳ කලාපය ,කොග්ගල*



*ජල මට්ටම් මැනීම - ගුවන් හමුදා කඳවුර කොග්ගල*



*ජල මට්ටම් මැනීම - සද්ධර්මන්කාර පිරිවෙන, පානදුර*



*පරීක්ෂණ නල ළිං ඉදි කිරීම - පයාගල පොලිස් ස්ථානය*

මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ කාළගුණික විපර්යාස හේතුවෙන් භූගත ජලයට සිදුවන බලපෑම අධ්‍යයනය කිරීම වන අතර වෙරළාසන්න ප්‍රදේශයේ වර්ෂාපතන රටාව වෙනස්වීම අධ්‍යයනය, නිසිලෙස සකස්කල භූගත ජල නිමාන පද්ධතියක් මඟින් ලවණතාවය වෙනස්වීම අධ්‍යයනය, භූගත ජලය තිරසාර අයුරින් භාවිතා කිරීම සඳහා පාලන යන්ත්‍රනයක් හා ඒ සඳහා අවශ්‍ය උපකරණ යොදාගැනීම, ප්‍රදේශයේ භූගත ජලය හා සම්බන්ධ දත්ත ගබඩාව වැඩිදියුණු කිරීම හා කෘත්‍රිමව භූගත ජලය ආරෝපණය කල හැකි සුදුසු ස්ථාන හඳුනාගැනීමත්ය.

2016 ජනවාරි සිට 2016 දෙසැම්බර් දක්වා මෙම ව්‍යාපෘතිය යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් සිදුකරන ලදි.

| අංකය | ක්‍රියාකාරකම | ප්‍රමාණය |
|---|---|---|
| 01 | ජල සාම්පල් ලබාගැනීම හා ළිං නිමාණය කිරීම | 100 |
| 02 | ජල සාම්පල් රසායනිකව පරීක්ෂා කිරීම | 50 |

## 1.7 ශ්‍රී ලංකාව තුළ භූගත ජලය ආරෝපණය කිරීමට සුදුසු ප්‍රදේශ හඳුනා ගැනීම (අදියර 1 - පුත්තලම දිස්ත්‍රික්කය)

**ව්‍යාපෘති අරමුණු**

ජල ධරයන්ගේ විවිධ පරාමිතීන් හඳුනාගැනීම, එම ජලධරයන්ගේ පිහිටීම හා ජ්‍යාමිතික ව්‍යාප්තිය හඳුනාගැනීම හා භූගත ජලය ආරෝපණය කිරීම මඟින් භූගත ජලයේ ධාරිතාවය ඉහළ දැමිය හැකි ප්‍රදේශ හඳුනා ගැනීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වේ.

පහත සඳහන් ක්‍රියාකාරකම් 2014 හා 2015 වර්ෂ වලදී සිදුකර අවසන් වූ අතර එම ප්‍රතිඵලයන් අනුව , භූගත ජලය නිමානය කිරීම සඳහා ජල මූලාශ්‍රයන් ස්ථාපිත කරන ලදි.

2014 හා 2015 වර්ෂවලදී සිදුකරන ලද ක්‍රියාකාරකම්

- භූජල විද්‍යාත්මක පරීක්ෂණ සිදුකිරීම
- පරීක්ෂණාත්මක නල ළිං ඉදිකිරීම
- ජල සාම්පල් එක්රැස් කර විශ්ලේෂණය කිරීම
- ජල ධාරිතා පරීක්ෂණ සිදුකිරීම

2016 වර්ෂය තුළ පහත සඳහන් ක්‍රියාකාරකම් සිදුකර ඇත

| අංකය | ක්‍රියාකාරකම | ප්‍රමාණය |
|---|---|---|
| 01 | ජල සාම්පල එක්රැස් කිරීම හා නිමානය | 200 |
| 02 | ජල සාම්පල රසායනික විශ්ලේෂණය | 100 |



## 1.8 වකුගඩු රෝග පවතින ප්‍රදේශවල ජලයේ ගුණාත්මකභාවය අධ්‍යයනය (රු. මිලියන 5.00)

කුරුණෑගල දිස්ත්‍රික්කය

මෙම අධ්‍යයනය 2014 වර්ෂයේදී ආරම්භ කරන ලදි. 2015 වර්ෂයේ ජල සම්පත් මණ්ඩලය පුත්තලම පළාත් කාර්යාලය මගින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ වකුගඩු රෝගය පැතිරී ඇති ප්‍රදේශවල ජලයේ ගුණාත්මකභාවය අධ්‍යයනය කිරීම

ආරම්භ කරන ලදී.එම වර්ෂයේ වකුගඩු රෝගීන් බහුලව වාර්ථාවන පොල්පිතිගම හා ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකෙහි අධ්‍යයන කටයුතු සිදු කරන ලදී. එමෙන්ම 2016 වර්ෂයේ තවත් කුරුණෑගල දිස්ත්‍රික්කයේ වකුගඩු රෝගීන් වැඩි සංඛ්‍යාවක් වාර්ථාවන ගල්ගමුව හා මහව ප්‍රාදේශීය සභා දෙක ආවරණය වන පරිදි ගල්ගමුව , ඇහැටුවැව, මහව හා අඹන්පොළ යන ප්‍රාදේශීය කොට්ඨාශ හතරෙහි අධ්‍යයන කටයුතු සිදු කරනු ලබයි.



**පොළොන්නරුව, ත්‍රිකුණාමලය හා මොනරාගල දිස්ත්‍රික්ක**

මෙම ව්‍යාපෘතිය 2014 වර්ෂයේදී පොළොන්නරුව, ත්‍රිකුණාමලය හා මොනරාගල දිස්ත්‍රික්ක මූලික කර ගනිමින් ආරම්භ කරන ලදි. ව්‍යාපෘතිය මඟින් 2016 වර්ෂය තුළදී සිදුකරනු ලැබූ ක්‍රියාකාරකම් පහත දැක්වේ.

| අංකය | ක්‍රියාකාරකම | ප්‍රගතිය |
|---|---|---|
| 01 | භූජල විද්‍යා සමීක්ෂණ | 20 |
| 02 | පර්යේෂණ නල ළිං ඉදි කිරීම | 20 |
| 03 | ජලධාරිතා පරීක්ෂණ සිදුකිරීම | 30 |
| 04 | ජල සාම්පල එක්රැස් කිරීම හා නල ළිං නිමානය | 370 |
| 05 | අත්පොම්ප ස්ථාපනය කිරීම | 08 |
| 06 | රසායනික විශ්ලේෂණ | 150 |
| 07 | දැනුවත්කිරීමේ වැඩසටහන් හා ජලසායන පැවැත්වීම | 09 |

## 1.9 කිරිඳි ඔය ද්‍රෝණියේ භූගත ජල විද්‍යාත්මක අධ්‍යයනය (රු. මිලියන 2.00)

මෙම අධ්‍යයනය 2015 වසරේදී ආරම්භ කරන ලදි. ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ පිහිටා ඇති කිරිඳි ඔය ගංගා ද්‍රෝණියේ භූගත ජලය පිළිබඳ අධ්‍යයනයක් මේ දක්වා සිදු කර නොමැති බව වාර්තා වී ඇති බැවින් ගංගා ද්‍රෝණියේ භූගත ජලයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මකබව තක්සේරු කිරීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරනු ලබයි. මෙම අධ්‍යයනයේ ප්‍රගතිය පහත වගුවෙන් දැක්වේ.

| අනු අංකය | කාර්යය | ප්‍රගතිය |
|---|---|---|
| 01 | භූගත ජල සමීක්ෂණ සිදු කිරීම | 10 |
| 02 | පර්යේෂණ නල ළිං ඉදි කිරීම | 10 |
| 03 | ජලධාරිතා පරීක්ෂණ සිදුකිරීම | 02 |
| 04 | ජල නියැදීන් එක්රැස් කිරීම | 175 |
| 05 | ජල නියැදීන්වල රසායනික විශ්ලේෂණය | 58 |
| 06 | දත්ත විශ්ලේෂණය කර වාර්තා සකස් කිරීම | සිදු කෙරෙමින් පවතී |

## 1.10 කැළණි ගඟ නිම්නයේ භූගත ජල විද්‍යාත්මක අධ්‍යයනය (රු. මිලියන 2.00)

මෙම අධ්‍යයනය මගින් කැළණි ගඟ ජල ද්‍රෝණියේ ඉහළ කලාපයේ භූගත ජල විද්‍යාත්මක දත්ත එක්රැස් කිරීම සිදු කරන ලදි. මේ අනුව ව්‍යාපෘතිය මගින් භූජල දත්ත එක්රැස් කිරීම, අවශ්‍ය ස්ථාන වල භූජල සමීක්ෂණ සිදු කිරීම, පර්යේෂණ නල ළිං ඉදිකිරීම, ජල සාම්පල් රසායනික විශ්ලේෂණය කොට අදාල දත්ත වාර්තා කිරීම ක්‍රියාකාරම් සිදුකරන ලදි.

2016 වර්ෂය තුළදී පහත සඳහන් ක්‍රියාකාරකම් සිදුකරන ලදි.

| අංකය | ක්‍රියාකාරකම | ප්‍රගතිය |
|---|---|---|
| 01 | භූගත ජල සමීක්ෂණ සිදු කිරීම | 10 |
| 02 | පර්යේෂණ නල ළිං ඉදි කිරීම | 10 |
| 03 | ජලධාරිතා පරීක්ෂණ සිදුකිරීම | 08 |
| 05 | ජල සාම්පල් එක්රැස් කිරිම | 100 |
| 06 | ජල නියැදීන්වල රසායනික විශ්ලේෂණය | 50 |
| 07 | දත්ත විශ්ලේෂණය කර වාර්තා සකස් කිරීම | සිදුකෙරෙමින් පවතී |

## 1.11 වියළි කලාපීය ප්‍රදේශවල හදිසි අවශ්‍යතාවයන් සඳහා නල ළිං ඉදිකිරීම (රු. මිලියන 5.00)

වියළි කලාපීය ප්‍රදේශවල නියගය පවතින කාල වකවානුව තුළදී පානීය ජලය ලබාදීම අරමුණ කරගෙන මෙම ව්‍යාපෘතිය ආරම්භ කර ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ 2016 වර්ෂය තුළදී මුලතිව් හා මොනරාගල දිස්ත්‍රික්ක වල සිදුකල ක්‍රියාකාරකම් පහත දක්වා ඇත.

| අංකය | ක්‍රියාකාරකම | ප්‍රගතිය |
|---|---|---|
| 01 | භූජල සමීක්ෂණ | 20 |
| 02 | පර්යේෂණ නල ළිං ඉදිකිරීම | 17 |
| 03 | ජලධාරිතා පරීක්ෂණ සිදුකිරීම | 01 |
| 03 | ජල නියැදීන් වල රසායනික විශ්ලේෂණය | 10 |

### 1.12 වියළි කලාපීය ප්‍රදේශවල අත්පොම්ප පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය (රු. මිලියන 5.00)

මෙම ව්‍යාපෘතිය යටතේ බදුල්ල, මොනරාගල හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක වල පැරණි අත්පොම්ප පුනරුත්ථාපනය කිරීම සිදුකරන ලදි. මෙහිදී 2016 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා සිදුකල ක්‍රියාකාරකම් පහත දැක්වේ.

| අංකය | ක්‍රියාකාරකම | ප්‍රගතිය |
|---|---|---|
| 01 | පැරණි අත්පොම්ප පිරිසිදු කිරීම | 85 |
| 02 | පැරණි අත්පොම්ප අළුත්වැඩියා කිරීම | 100 |

## 2. අමාත්‍යාංශ අරමුදල්

### 2.1 චුන්නාකම් ප්‍රදේශයේ තෙල් කාන්දුවීම මගින් භූගත ජලය දූෂණයවීම සම්බන්ධව අධ්‍යයනය

මෙම අධ්‍යයනය මගින් චුන්නාකම් ප්‍රදේශයේ තෙල් මගින් භූගත ජලය දූෂණයවීම සම්බන්ධව අධ්‍යයනය සිදුකරනු ලබන අතර එය දැනට පවතින තත්ත්වය හා ඒ සඳහා විසඳුම් ලබාදීම සඳහා අධ්‍යයනය සිදුකරනු ලබයි. 2015 වර්ෂයේදී මෙම අධ්‍යයනය ආරම්භ කල අතර ඒ අනුව 2016 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ප්‍රගතිය පහත දක්වා ඇත.

| අංකය | ක්‍රියාකාරකම | ප්‍රගතිය |
|---|---|---|
| 01 | භූජල විද්‍යාත්මක අධ්‍යයනය<br>ඒකමාන ප්‍රතිරෝධන<br>ද්විමාන ප්‍රතිරෝධන | <br>35<br>10 |
| 02 | නල ළිං ඉදිකිරීම | 34 |
| 03 | ළිං වල ජල මට්ටම | 60 |
| 04 | ජල සාම්පල එකතුකිරීම හා විශ්ලේෂණය | 200 |
| 05 | ජල ධාරිතා පරීක්ෂණ | 15 |
| 06 | දත්ත විශ්ලේෂණය හා වාර්ථා සකස් කිරීම | සිදුකෙරෙමින් පවතී |

### 2.2 මොනරාගල දිස්ත්‍රික්කයේ ගෝනගංආර ග්‍රාමීය ජල යොජනා ක්‍රමය සංවර්ධනය කිරීම

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ ගෝනගංආර ප්‍රදේශයේ ජීවත්වන ජනතාවට පිරිසිදු, ආරක්ෂිත පානීය ජලය ලබා දීමය. ඒ අනුව 2016 ජනවාරි සිට 2016 දෙසැම්බර් මස දක්වා පහත ක්‍රියාකාරකම් සිදුකර ඇත.

| අයිතමය | විස්තරය | ප්‍රගතිය |
|---|---|---|
| 01 | ගෝනගංආර ගඟ ආශ්‍රිතව ජල පිරිපහදු ඒකකය සැලසුම් කිරීම හා සවිකිරීම | 100% |
| 02 | ජල ධාරිතා පරීක්ෂණ සිදුකිරීම | 100% |
| 03 | ලීටර 5000 ජල ටැංකිය ස්ථාපනය කිරීම | 100% |
| 04 | පොම්පාගාරය ඉදිකිරීම | 100% |
| 05 | දියේගිල්වනු ලබන ජල පොම්ප, ජල පෙරණ හා අනෙකුත් අමතර කොටස් සවිකිරීම. | 100% |

## 2.3 කැළණි ගඟ පිටාර ගැලීමෙන් ගංවතුරට හසු වූ ප්‍රදේශවල ළිං පිරිසිදු කිරීමේවැඩසටහන

2016 මැයි මස මැද භාගයේදී ඇද හැලුණු අධික වර්ෂාව නිසා කැළණි ගඟ පිටාර ගැලීමෙන් කොළඹ දිස්ත්‍රික්කයේ හංවැල්ල සිට වැල්ලම්පිටිය දක්වා ඇති ප්‍රදේශ කීපයක් ගංවතුරට හසු විය. ගංවතුර බැසයාමත් සමග මෙම ගංවතුර තත්වය නිසා යටවූ ළිං පිරිසිදු කිරීම හැකි ඉක්මනින් ආරම්භ කිරීමට වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරන අමාත්‍යතුමාගේ මග පෙන්වීම මත හා අමාත්‍යාංශ ලේකම්තුමාගේ උපදෙස් අනුව ජල සම්පත් මණ්ඩලය කටයුතු කරන ලදී.

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | පිරිසිදු කල ප්‍රදේශ | පිරිසිදු කල වල ළිං ප්‍රමාණය | පිරිසිදු කල ළිං ප්‍රමාණය | පිරිසිදු කල නිවාස ප්‍රමාණය | පිරිසිදු කල බෝක්කු ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| හංවැල්ල | පහළ හංවැල්ල, පහත්ගම, ඉහළ හංවැල්ල, කොස්ගම, වනහගොඩ, කනම්පැල්ල, කළුඅග්ගල, නිරිපොල, සීවලීවත්ත, ඊරියගොල්ල, මැදගොඩ | 446 | 17 | 01 | 00 |
| කඩුවෙල | රණාල, නවගමුව උතුර සහ දකුණ, වැලිවිට, බෝමිරිය | 120 | 02 | 04 | 02 |
| කොළොන්නාව | හිඹුටුයාන, ගොතටුව, මුල්ලේරියාව, අංගොඩ, කැළණිමුල්ල, කොටිකාවත්ත, වැල්ලම්පිටිය, කොහිලවත්ත, තොටුපිල | 273 | 01 | 02 | 04 |





## 2.4 සාලාව කඳවුරේ සිදුවීමේදී බලපෑමට ලක්වූ ප්‍රදේශවල ළිං පිරිසිදු කිරීමේ හා ජල සාම්පල් පරීක්ෂා කිරීමේ වැඩසටහන

සාලාව යුධහමුදා කඳවුරේ සිදුවූ පිපිරීමෙන් අනතුරුව එම කඳවුර අවට ඇති ළිං (භූගත ජල මූලාශ්‍ර) පිරිසිදු කිරීමේ කටයුතු හා ඒවායේ ජල සාම්පල් විශ්ලේෂණය කිරීමේ කටයුතු ජල සම්පත් මණ්ඩලය විසින් 2016.06.09 වන දින ආරම්භ කරන ලදි. ගරු වාරිමාර්ග හා ජල සම්පත් කළමණාකරණ අමාත්‍යතුමන්ගේ මඟ පෙන්වීම යටතේ හා අමාත්‍යාංශ ලේකම්තුමාගේ උපදෙස් අනුව ජල සම්පත් මණ්ඩලය විසින් ළිං පිරිසිදු කිරීම හා ජල සාම්පල් පරීක්ෂා කිරීමේ කටයුතු ආරම්භ කල අතර ජල සාම්පල පරාමිතික 03 ක් සඳහා (PH අගය, විද්‍යුත් සන්නියකතාව, සල්ෆේට ප්‍රමාණය) පරීක්ෂා කරන ලදි.




මෙම පිරිසිදු කිරීමේදී හා ජල සාම්පල එක්රැස් කිරීමේදී හමුදා නිළධාරී මහතුන්, අදාළ ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී මහතුන් හා මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන්ගේ මගපෙන්වීම යටතේ සිදුකරන ලදි. මෙම වැඩසටහනේදී එම ප්‍රදේශය අවට බලපෑමට ලක් වූ වල ළිං 950 ක් පිරිසිදු කල අතර වල ළිං වලින් ජල සාම්පල 350 ක් එක්රැස් කර විශ්ලේෂණය කරන ලදි.






### 2.5 වියළි කලාපීය ප්‍රදේශවල නිෂ්පාදන නල ළිං ඉදිකිරීම

2016 වසරේ වියළි කලාපීය ප්‍රදේශවලට පවතින නියඟය සලකා එම ප්‍රදේශයේ ජනතාවට පානීය ජලය ලබාදීමේ අරමුණ ඇතිව කුඩා ප්‍රමාණයේ ජල සම්පාදන යෝජනා ක්‍රම 05 ක් ස්ථාපිත කිරීම සඳහා වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය මගින් රුපියල් මිලියන 10 ක මුදලක් පහත සඳහන් දිස්ත්‍රික්ක සඳහා වෙන්කර ඇත.

01. මොනරාගල
02. පොළොන්නරුව
03. මන්නාරම

මෙම ව්‍යාපෘතිය 2016 වසරේ ජූලි මාසයේදී ආරම්භ කල අතර පහත සඳහන් පරිදි එහි වැඩ සාර්ථකව අවසන් කර ඇත.

| අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ස්ථානය | ප්‍රගතිය |
|---|---|---|---|
| 01 | තණමල්විල | අඟුණුකොළපැලැස්ස | 90% |
| 02 | වැල්ලවාය | තෙලුල්ල | 90% |
| 03 | සියඹලාණ්ඩුව | බුද්ධම | 95% |
| 04 | මන්නාරම | උයිලන්කුලම | 95% |
| 05 | ලංකාපුර | ගැමුණුපුර | 80% |

මෙම ව්‍යාපෘතියේ පවතින ප්‍රධාන ක්‍රියාකාරකම් වන නල ළිං ඉදිකිරීම, ජලධාරිතා පරීක්ෂණ, ජල සාම්පල පරීක්ෂාව, ජල ටැංකි ඉදිකිරීම හා පොම්ප සකස් කිරීම මේ වන විට අවසන් කර ඇති අතර, මෙම ජල සම්පාදන යෝජනා ක්‍රම 2017 ප්‍රථම කාර්තුවේදී විවෘත කිරීමට නියමිතය.

## 3. හඳුනාගත් ප්‍රදේශයන්හි භූගත ජල නිමාන පද්ධතීන් ස්ථාපනය : වේලි ආරක්ෂණ ව්‍යාපෘතිය

මෙහි ප්‍රථම අදියරේ දී භූගත ජල සම්පත් පිළිබඳව ගැටළු පවතින හඳුනාගත් නියමු ප්‍රදේශයන් තුළ දිගුකාලීන නිමාන පද්ධතීන් ප්‍රතිස්ථාපනය සිදුකල අතර එහි නිමාන කටයුතු සහ භූගත ජලයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක විචලනයන් පිළිබඳ නිරීක්ෂණය කර එමඟින් සිදුකල යුතු ක්‍රමෝපායන් ගැන මේ වන විට අධ්‍යයනය කෙරෙමින් පවතී.

එයට සමගාමීව දෙවන අධියරේදී නියමු ප්‍රදේශයන් තව දුරටත් පුළුල් කර නිමාන පද්ධතීන් වඩාත් පුළුල් පරාසයක ව්‍යාප්ත වන පරිදි සිදුකෙරේ. මේ යටතේ පළමු අධියරේ සේම මූලික අධ්‍යයනයන්ගෙන් පසු අදාළ වාර්තාව දැනුවත් කර ප්‍රදේශයේ භූගත ජල සම්පත් ගැටළු පිළිබඳ සාකච්ඡා වලින් පසුව අවධානය යොමුකල යුතු විෂයන් ඔස්සේ නව නිමාන පද්ධතීන් ස්ථාපන කටයුතු ආරම්භ කෙරෙනි.

පළමු අදියරේදී මෙන්ම මෙහිදී භූ භෞතික සමීක්ෂණයන්, පර්යේෂණ මට්ටමේ නල ළිං, මුහුදු මට්ටමේ සිට උස්මට්ටම් නිර්ණය, රසායනික විශ්ලේෂණ හා එම කටයුතු වල ප්‍රතිඵල අධ්‍යයනයන් ඔස්සේ නව නිමාන ස්ථානයන් තෝරා ගැණිනි.

මෙහි පහත සඳහන් නියමු ප්‍රදේශයන්හි සිදුකරනු ලැබූ ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් ඔස්සේ භූගත ජලයෙහි ඇති ගැටළු පිළිබඳ හඳුනාගැනීම් සිදුකෙරෙනි.

ව්‍යාපෘතියෙහි සමස්ත භෞතික ප්‍රගතියද පහතින් දක්වා ඇත.


**නියාමන අධ්‍යයනය: ස්වයංක්‍රීය පද්ධතියක් භාවිතයෙන් කල්පිටිය ප්‍රදේශයේ භූගත ජල මට්ටම හා ගුණාත්මකභාවය නිමානය කිරීම**

වෙළි ආරක්ෂණ හා ජල සම්පත් සැළසුම්කරණ ව්‍යාපෘතියේ පළමු පියවරේදී හඳුනා ගත් කරුණු අනුව අධික කෘෂි රසායන භාවිතය නිසා භූගත ජලධරයන් දූෂණය ඇති බව අනාවරණය වේ. එම නිසා, ප්‍රදේශයේ ළිං තුළ ස්වයංක්‍රීය නිමාන පද්ධතියක් ස්ථාපිත කිරීමට කටයුතු කළ අතර මෙමඟින් භූගත ජලයේ ගුණාත්මක බවෙහි හා ජල මට්ටමෙහි සිදුවන වෙනස්කම් ඉතා සූක්ෂමව අධ්‍යයනය කල හැකි වේ.

කල්පිටිය අර්ධද්වීපයේ හඳුනාගත් ප්‍රධාන ගැටළු වන්නේ,

- අධික කෘෂි රසායන භාවිතය නිසා භූගත ජලය දූෂණයට ලක් වීම
- සමහර කෘෂිකාර්මික ප්‍රදේශවල ජලයේදෘඪ බව හෝ විද්‍යුත් සන්නායකතාවය අධික ලෙස ඉහළ යාම

ස්වයංක්‍රීය නිමාන පද්ධතිය ස්ථාපිත කිරීමට ප්‍රථම ප්‍රදේශයේ පවතින සංකීර්ණ භූගත තත්වයන් නිසා ජල සාම්පල 154ක් උපයෝගී කර ගෙන වියළි හා තෙත් කාලවලදී භූගත ජලයේ නයිට්‍රේට ව්‍යාප්තිය සිතියම් ගත කරන ලදී.




රූපය 1: වර්ෂාවට පෙර හා පසු නයිට්‍රේට ව්‍යාප්තිය

නයිට්‍රේට ව්‍යාප්තියේ හා පහත දැක්වෙන කාරණා අනුව ස්වයංක්‍රීය පද්ධතිය ස්ථාපිත කල යුතු ස්ථාන තෝරා ගන්නා ලදී.


- අධික නයිට්‍රේට නිසා භූගත ජලය දූෂණය වූ ප්‍රදේශ පැවතීම(නයිට්‍රේට ප්‍රමාණය 10mg/l වඩා අධික ස්ථාන )


- නයිට්‍රේට මඟින් දූෂණය වීම නිසා අවදානම් ප්‍රදේශ පැවතීම ( නයිට්‍රේට ප්‍රමාණය 5-10mg/l අතර පවතින ප්‍රදේශ)
- තමන්ගේ ගොවි බිම් සඳහා කාබනික පොහොර භාවිතා කරන ස්ථාන
- සමුද්දේශ ස්ථාන ලෙස ගත් ගත හැකි ඉතා හොඳ ගුණාත්මක තත්වයේ ජලය පවතින ස්ථාන





කල්පිටිය ප්‍රදේශයේ ස්වයංක්‍රීය නිමාන පද්ධති ස්ථාපිත ස්ථාන


පහත දැක්වෙන ප්‍රස්තාර මඟින් ප්‍රදේශයේ භූගත ජලයේ නයිට්‍රේට, විද්‍යුත් සන්නායකතාවය, TDS සහ ජල මට්ටම කාලය සමඟ වෙනස් වන ආකාරය නිරූපණය කෙරේ. මෙම දත්ත අධික නයිට්‍රේට ප්‍රමාණයක් අඩංගු මාම්පුරි ප්‍රදේශයේ ස්ථාපිත කල ස්වයංක්‍රීය නිමාන පද්ධතිය මඟින් ලබා ගන්නා ලදී.






## මාම්පුරි ප්‍රදේශය




## කන්දකැටිය ප්‍රදේශය

දත්ත නිමාන පද්ධතිය අවට ක්ෂේත්‍ර නිරීක්ෂණ පහත පරිදි වේ.

- ආසන්න ඉඩම් වල අවසන් මාසය තුළ කෘෂිකාර්මික කටයුතු සිදු කර නොමැත (පෙබරවාරි අග සිට අප්‍රේල් 3වන සතිය දක්වා)
- භූගත ජලය කෘෂිකාර්මික කටයුතු සඳහා පොම්ප කිරීම ඉතා අවම නිසා භූගත ජල පරිභෝජනය ඉතා අඩු වේ.

එම නිසා, නයිට්‍රේට මට්ටම ක්‍රමයෙන් අඩුවන අතර අවසානයේ එය නියත අගයක් ලෙස පවතී. කෙසේ නමුත්, ආරම්භයේදී එය 130ppm සහ එය 70ppm දක්වා අඩු විය. මෙය පහත කරුණු නිසා සිදුවිය හැක.


- ➢ කෘෂි කටයුතු මෙම කාලය තුළ නැවැත්වීම
- ➢ ජලය පොම්ප කිරීම අඩුවීම නිසා භූගත ජලය ගමන් කිරීම නැවතීම නිසා ජලයේ ඇති නයිට්‍රේට අවසාදිත ලෙස තැන්පත් වීම.
- ➢ භූගත ජලයේ චලනයන් අවම වන නිසා ගැඹුරු භූගත ජලයේ නයිට්‍රේට ප්‍රමාණය වැඩිවිය හැක.

  - ප්‍රදේශයට සැළකිය යුතු වර්ෂාපතනයක් නොලැබීම


මෙම තත්වයද ප්‍රදේශයේ පවතින භූගත ජලයෙහි නයිට්‍රේට හා විද්‍යුත් සන්නයකතාවය කාලය සමඟ ඉහළ අගයන් ගැනීමට හේතු විය හැක.

**අම්පාර නියමු ප්‍රදේශය**

වේළි ආරක්ෂණ හා ජල සම්පත් සැළසුම්කරණ ව්‍යාපෘතිය යටතේ ප්‍රධාන වශයෙන් අම්පාර නියමු කලාපයට අයත් වෙරළබඩ තීරයෙහි හා ඊට ආසන්න ප්‍රදේශයේ පවතින පිරිසිදු භූගත ජලය මුහුදු ජලය මඟින් දූෂණය වී ඇති තත්වය හා වකුගඩු රොඅගනට ගොදුරු වී ඇති දෙහිඅත්තකන්ඩිය, මහඔය හා පදියතලාව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ පවතින භූගත ජලයෙහි ප්‍රමාණාත්මක හා ගුණාත්මක තත්වයන් පිළිබඳ අධ්‍යයනයක් සිදු කිරීම අරමුණු වේ.
පහත සිතියමෙන් අම්පාර නියමු ප්‍රදේශය නිරූපණය වේ.




ව්‍යාපෘතියේ දෙවන අදියර ආරම්භයේදී  ප්‍රදේශයේ වගකිවයුතු නිළධාරීන් ව්‍යාපෘතිය පිලිබඳ දැනුවත් කිරීමක් සිදු කල අතර ප්‍රධාන එක් දැනුවත් කිරීමේ වැඩසටහනක් හා කුඩා දැනුවත් කිරීම් 3ක් 20415 වසරේදී පවත්වන ලදී. අනතුරුව වකුගඩු රෝගයට ලක් වූ පුද්ගලයන් සම්බන්ධ කර ගනිමින් විස්තර ලබා ගැනීම සිදු කරන ලදී.
මෙම තොරතුරුවලට අනුව පරීක්ෂණ ගැඹුරු ලිං ඉදිකිරීමට අවශ්‍ය ස්ථාන හඳුනා ගන්න ලද අතර ඒ අනුව එම ලිං ඉදි කිරීම සිදු කරන ලදී. ඇමුණුම I මඟින් ඉදිකිරීම් වල විස්තර නිරූපණය කර ඇති අතර රූපය I මඟින් ලිං ඉදි කල ස්ථාන හා ක්ෂේත්‍ර පරීක්ෂණ ඉදිරිපත් කෙරේ.









මේ අතරම, මුහුදු ජලය මඟින් අභ්‍යන්තර භූගත ජලය දූෂණය වී ඇති කලාපයන් හඳුනා ගැනීම සඳහා 2Dසමීක්ෂණ සිදු කරන ලදි.

මෙය මුහුදු ජලය රට තුළට කෙතරම් දුරට ආක්‍රමණය වී ඇත්දැයි සටහන් කිරීමට ප්‍රමාණවත් නොවන අතර තව දුරටත් මෙම සමීක්ෂණ කටයුතු කල යුතු වේ. පහත ගූගල් සිතියම මඟින් ද්විමාන සම්මෙක්ෂණ සිදු කල ස්ථාන නිරූපණය වේ.

**බදුල්ල නියමු ප්‍රදේශය**

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ ප්‍රදේශයේ පවතින ජල මූලාශ්‍ර වල ගුණාත්මක තත්වය පිළිබඳ අධ්‍යයනය කිරීම හා ඒ හරහා දිගු කාලීන නිමාන පද්ධතියක් ස්ථාපිත කිරීමයි.


ජල සාම්පල රසායනිකව පරීක්ෂාවට ලක් කරන ලද අතර මෙම සාම්පල ප්‍රදේශයේ කාලීන හා අවකාශීය තත්වයන් නිරූපණය කරයි. බදුල්ල නගර සීමාවේ අධික ෆ්ලෝරයිඩ ප්‍රමාණයක් පෙන්නුම් කරයි.
මහියංගනය, රිදීමාලියද්ද, කන්දකැටිය හා මීගහකිවුල යන ප්‍රදේශ වල තරමක පොස්ෆේට ප්‍රමාණයක් පෙන්නුම් කරයි.


රසායනික විශ්ලේෂණ ප්‍රතිඵල අනුව බදුල්ල හා වැලිමඩ ප්‍රදේශ වල අධික ලෙස ෆ්ලෝරයිඩ අඩංගු වේ. තවද, සමහර ප්‍රදේශ වල තරමක පොස්ෆේට ප්‍රමාණයන්ද දැකිය හැකි අතර මෙයට ප්‍රධාන හේතුව අධික කෘෂි රසායන භාවිතය විය හැක.

ලැබී ඇති තොරතුරු අනුව, වකුගඩු රෝගීන් සැළකිය යුතු ප්‍රමාණයක් හඳුනාඅ ගෙන ඇති අතර මෙම නිසා මහියංගනය, රිදීමාලියද්ද, කන්දකැටිය හා මීගහකිවුල යන ප්‍රදේශීය ලේකම් කොට්ඨාශ වල අධ්‍යනය අඛණ්ඩව කරගෙන යැම සඳහා පරීක්ෂණ ආරම්භ කරන ලදී.

**යාපනය නියමු ප්‍රදේශය**


මූලික ජල සාම්පල විශ්ලේශණය ස්ථාපිත කරන ලද නියාමන පද්ධතිය හරහා සිදු කරනු ලැබේ. මුහුදු ජලයේ ආක්‍රමණය හඳුනා ගැනීම සඳහා භූ සමීක්ෂණ කටයුතු හා පරීක්ෂණ ලිං ඉදි කිරීම සිදු කල යුතු වේ.




## අනුරාධපුර නියමු ප්‍රදේශය


අනුරාධපුර දිස්ත්‍රික්කයේ ෆ්ලෝරයිඩ ව්‍යාප්තිය





අනුරාධපුර දිස්ත්‍රික්කයේ පවතින ප්‍රධානතම ගැටළුව වන ෆ්ලෝරයිඩ ව්‍යාප්තිය සැලකීමේදී, මැදවච්චිය අවට ප්‍රදේශයේ ෆ්ලෝරයිඩ ව්‍යාප්තියේ තරමක අඩු වීමක් දැකිය හැකි අතර අනෙකුත් ප්‍රදේශ වල ෆ්ලෝරයිඩ ප්‍රමාණය අදික වන අතර ව්‍යාප්ති රටාවෙහිද වෙනසක් දැකිය හැකි නොවේ.


අනුරාධපුර දිස්ත්‍රික්කයේ සමස්ථ දෘඪතා ව්‍යාප්තිය










ජලයේ කඨිණත්වයද මෙහි දැකිය හැකි ප්‍රධාන ගැටළුවක් වන අතර මැදවච්චිය අවට ප්‍රදේශ වල මෙහි වැඩිවීමක් දැකිය හැකි අතර අනෙකුත් ප්‍රදේශවලද ව්‍යාප්තියෙහි වෙනසක් දැකිය හැකි නොවේ.


## මාතලේ නියමු ප්‍රදේශය








**ගම්පහ නියමු ප්‍රදේශය**

අරමුණු


- කාර්මික දූෂණය
- මුහුදු ජල ආක්‍රමණය

ප්‍රතිපල


1. pHඅගය අඩු බව හඳුනා ගන්න ලදී.
   - ➢ විශේෂ ව්‍යාප්ති රටාවක් නොමැත
   - ➢ pHඅඩු වීම නිසා ජල නල දිරා යා හැකි අතර එමඟින් විවිධ සෞඛ්‍ය ගැටළු ඇතිවිය හැක

2. හඳුනා ගත් ස්ථාන වල අධික $NO_3$ ප්‍රමාණයක් අඩංගු වීම
   - ➢ ප්‍රාදේශීය බලපෑමකි
   - ➢ සනීපාරක්ෂක ක්‍රමෝපායන් මත ඇති වේ.


3. ජල මට්ටමේ වෙනස් වීම
   - ➢ ස්වයංක්‍රීය ජල නිමාන පද්ධති 8ක් ස්ථාපිත කරන ලදී






ජල මට්ටමේ වෙනස 1mට අඩුය.



ජල මට්ටමේ වෙනස 2mට අඩුය.






## 2016 වර්ෂයේ නියමු ප්‍රදේශයන්හි ප්‍රගතිය

**Estabilishment of Groundwater Monitoring network - DSWRPP-AF : Progress as at 05/11/2016**

| SN | Pilot Area | CWQ | | Geophysics | | | | TW Drilling | | Geo_Logging | | Test Pumping | | Levelling | | Extended Area WQ | | | | | Awareness program | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | Wet | Dry | 1D | | 2D | | | | | | | | | | | | | | | | |
| | | | | Tgt | Cmpl | Tgt | Cmpl | Tgt | Cmpl | Tgt | Cmpl | Tgt | Cmpl | Tgt | Cmpl | Tgt | Smpled | A | C | D | Tgt | Cmpld |
| 1 | Ampara | | 27 | 20 | 20 | 20 | 8 | 10 | 10 | 6 | 0 | 4 | 0 | 50 | 0 | 100 | 121 | 66 | | 55 | 1 | 1 |
| 2 | Apura | 34 | 58 | 20 | 17 | NR | NR | 10 | 10 | 6 | 0 | 3 | 0 | 50 | 0 | 100 | 99 | | 98 | 0 | 2 | 1 |
| 3 | Matale | 39 | 39 | 20 | 8 | NR | NR | 15 | 5 | 6 | 0 | 4 | 0 | 40 | 0 | 50 | 0 | | | | 2 | 1 |
| 4 | Puttalam | | 29 | 30 | 22 | 20 | 10 | 20 | 7 | 6 | 0 | 5 | 0 | 50 | 0 | 120 | 56 | | | 56 | 3 | 1 |
| 5 | Gampaha | | | 20 | 0 | 10 | 0 | 10 | 0 | 2 | 0 | 3 | 0 | 40 | 0 | 100 | 87 | | 87 | | 2 | 1 |
| 6 | Jaffna | 102 | 102 | 30 | 15 | 20 | 0 | 15 | 15 | 6 | 0 | 5 | 5 | 50 | 0 | 140 | 156 | | 128 | | 3 | 1 |
| 7 | Kalpitiya | | | 20 | 20 | NR | NR | 15 | 15 | NR | NR | NR | NR | NR | NR | NR | NR | NR | NR | NR | 0 | 0 |
| 8 | Polon'wa | TBS | TBS | 100 | 14 | NR | NR | 21 | 0 | NR | NR | 21 | 0 | 50 | 0 | 200 | 75 | 55 | 20 | | 3 | 1 |
| 9 | Badulla | | | 20 | 12 | NR | NR | 20 | 11 | NR | NR | NR | NR | 50 | 0 | 50 | 72 | | 46 | 26 | 1 | 1 |
| | Total | | | 280 | 128 | 70 | 18 | 136 | 73 | 32 | 0 | 45 | 5 | 380 | 0 | 860 | 666 | 121 | 379 | 137 | 17 | 8 |

Tgt - target A -Analysis in progress D- Discarded, no analysis TBS - To be scheduled

Cmpl -Completed C- Analysis completed CWQ - Continuous Water Quality Monitoring

## 4. වාණිජමය ක්‍රියාකාරකම්

### 4.1 මොරගහකන්ද ව්‍යාපෘතිය

#### I. නැවත පදිංචි වූ ජනතාවට පානීය ජල පහසුකම් සැපයීම

මේ අනුව නැවත පදිංචි වූ ජනතාවට පානීය ජල පහසුකම් සැපයීම සඳහා අත්පොම්ප, නල ළිං ස්ථාපනය කර ඇති අතර 2016 වර්ෂය සඳහා ප්‍රගතිය පහත දැක්වේ.

| ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන) |
|---|---|---|
| 1. භූජල විද්‍යාත්මක සමීක්ෂණ | 26 | 0.65 |
| 2. නල ළිං ඉදිකිරීම | 26 | 4.11 |
| 3. අත්පොම්ප සවිකිරීම | 30 | 3.30 |
| 4. යකඩ පෙරහන් කිරීමේ පද්ධති ස්ථාපනය | 11 | 1.10 |
| එකතුව | | 9.16 |

#### II. කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය සැපයීම

මෙම කාලය වන විට වාරිමාර්ග ඇලමාර්ග වල ජලය ලබාදීමේ වැඩකටයුතු සිදුවෙමින් පවතින නිසා කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය ලබාදීමට අධි ධාරිතා නල ළිං ඉදිකරන ලදි.

| ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන) |
|---|---|---|
| 1. භූජල විද්‍යාත්මක සමීක්ෂණ | 20 | 0.60 |
| 2. නල ළිං ඉදිකිරීම | 26 | 3.97 |
| එකතුව | | 4.57 |

### 4.2 යාන් ඔය පර්යේෂණ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය යටතේ නැවත පදිංචි වූ ජනතාවට පානීය ජල පහසුකම් සැපයීම සඳහා අත්පොම්ප, නල ළිං ඉදිකරන ලද අතර 2016 වර්ෂය සඳහා ඉටුකරගත් ප්‍රගතිය පහත දැක්වේ.

| ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන) |
|---|---|---|
| 1. භූජල විද්‍යාත්මක සමීක්ෂණ | 15 | 0.582 |
| 2. නල ළිං ඉදිකිරීම | 15 | 3.470 |
| 3. අත්පොම්ප සවිකිරීම | 14 | 1.588 |
| 4. ජල සාම්පල විශ්ලේෂණය | 15 | 0.032 |
| එකතුව | | 5.672 |

### 4.3 ජල සැපයුම් හා සනීපාරක්ෂාව වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - මුලතිව් හා කිලිනොච්චි දිස්ත්‍රික්ක

මෙම ව්‍යාපෘතිය යටතේ කුඩා පරිමාණයේ ගම්මාන වල ජල සැපයුම් යෝජනා ක්‍රම සඳහා ජලය සැපයීමට අධි ධාරිතා උත්පාදන නල ළිං ඉදිකරන ලද අතර 2016 වර්ෂය සඳහා ඉටුකරගත් ප්‍රගතිය පහත පරිදි වේ.

| ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන) |
|---|---|---|
| 1. භූජල විද්‍යාත්මක සමීක්ෂණ | 19 | 1.292 |
| 2. නල ළිං ඉදිකිරීම | 09 | 2.133 |
| එකතුව | | 3.425 |

### 4.4 තටාක ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය - යාපනය

මෙම උපදේශන සේවාවේ ප්‍රධාන අරමුණ වූයේ යාපනය නගර සීමාවේ පිහිටා තිබූ තටාකයේ ආරක්ෂාකාරී ප්‍රහස්ථ රොන්මඩ ඉවත් කිරීමේ සනකම තීරණය කිරීමය. ඊට අමතරව තටාක ජලයේ ගුණාත්මකභාවය තටාකයේ රොන්මඩ, සහ එකිනෙක තටාක අවට ප්‍රදේශවල භූගත ජලයේ ගුනාත්මකභාවය තක්සේරු කිරීමක් සිදුකිරීමට බලාපොරොත්තු වන ලදි. මේ සඳහා අළුතින්ම ඉදිකරන ලද නිරීක්ෂණ මිහිවිදුම් භාවිතාකරන ලද අතර එම තොරතුරු මූලික දත්ත වශයෙන් ආරක්ෂාකාරී ප්‍රශස්ථ රොන්මඩ ඉවත් කිරීමේ ක්‍රියාපටිපාටිය සඳහා භාවිතා කරන ලදි.

මෙම අධ්‍යයනයේ අවසාන ප්‍රතිපලය වූයේ ආරක්ෂාකාරී ප්‍රශස්ථ රොන්මඩ ඉවත් කිරීමේ ක්‍රියාපටිපාටියට පසුව තටාකවල රඳවාගත හැකි ජල ධාරිතාවය ඉහළ නැංවීම මගින් මෝසම් කාලයේදී ගංවතුර අවස්ථාවන්හිදී ප්‍රදේශයේ සිදුවන ජල ගැලීම් අවම කර ගැනීම වේ.

| ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන) |
|---|---|---|
| 1. භූජල විද්‍යාත්මක සමීක්ෂණ | 34 | 0.982 |
| 2. නල ළිං ඉදිකිරීම | 33 | 4.235 |
| 3. නිරීක්ෂණ ළිං වල උස්මට්ටම් නිර්ණය කිරීම | 26 | 0.520 |
| 4. ජල සාම්පල විශ්ලේෂණය | 26 | 0.054 |
| 5. පැය 24 ජල ධාරිතා පරීක්ෂණ | 10 | 0.855 |
| එකතුව | | 6.646 |

### 4.5 මහවැලි එල් කලාපයේ කෘෂි නල ළිං ඉදිකිරීමේ වැඩසටහන - වැලිඔය

මෙම වැඩසටහන යටතේ මහවැලි එල් කලාපයේ ගොවිපස සහ කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය සැපයීම සඳහා අධිධාරිතා උත්පාදන නල ළිං ඉදිකරන ලදි.

| ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන) |
|---|---|---|
| 1. භූජල විද්‍යාත්මක සමීක්ෂණ | 42 | 1.367 |
| 2. නල ළිං ඉදිකිරීම | 40 | 15.769 |
| 3. පැය 24 ජල ධාරිතා පරීක්ෂණ | 40 | 5.250 |
| 4. ජල සාම්පල විශ්ලේෂණය | 40 | 0.084 |
| එකතුව | | 22.470 |

## 5. ජල සම්පත් මණ්ඩලය විසින් සිදුකල අනෙකුත් ක්‍රියාකාරකම්


### 5.1 ජල සම්පත් මණ්ඩලයේ 50 වන සංවත්සරය හා ලෝක ජල දින සැමරුම

ඉහත කරුණට සමගාමීව ජල සම්පත් මණ්ඩලය විසින් 2016.03.21 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මණ්ත්‍රණ ශාලාවේදී ඉතා සාර්ථක අයුරින් සමාජය දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාවට නංවන ලදී. මෙහිදී, ප්‍රධාන දේශනය, වාරිමාර්ග හා ජල සම්පත් කළමණාකරණ අමාත්‍ය, ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මැතිතුමන් විසින් සිදු කරන ලද අතර විද්වත් දේශන හතරක්ද (4) පවත්වන ලදී.

මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වූයේ, ජල සම්පත් මණ්ඩලයේ වර්තමාන කාර්‍යභාර්‍ය සමාජගත කිරීමයි. මීට අමතරව, භූගත ජලයේ පවතින සීමා සහිත බව හා ස්වභාවික ජල සම්පත් වලට එල්ල වී ඇති බලපෑම පිළිබඳ සමාජය දැනුවත් කිරීමද මෙහි ප්‍රධාන අරමුණක් විය. මේ නිසා, රටෙහි විවිධ පලාත් නියොජනය කරමින්, විශේෂයෙන්ම මොණරාගල, පොළොන්නරුව හා අනුරාධපුරය දිස්ත්‍රික්ක වල පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් මෙම වැඩසටහන සඳහා සහභාගී කරවා ගන්න ලදී.

වැඩසටහනට අදාල ඡායාරූප කිහිපයක් පහතින් දැක්වේ.










### 5.2 උතුරු මැද පළාත සඳහා ජල සම්පත් මණ්ඩලයේ රසායණාගාරයක් ස්ථාපිත කිරීම

උතුරු මැද පළාත සඳහා ජල සම්පත් මණ්ඩලයේ රසායණාගාරයක් ඉදිකිරීම, වාරිමාර්ග හා ජල සම්පත් කළමණාකරන අමාත්‍ය, ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මැතිතුමන් අතින් 2016 මැයි 18 වන දින ආරම්භ කරන ලදී.





### 5.3 ජල සම්පත් මණ්ඩලය සඳහා නව කාර්‍යාල ස්ථාපිත කිරීම

මේ යටතේ, යාපනය නව කාර්‍යාලය විවෘත කිරීම හා ඕමන්ත, පලෙයි හා වව්නියා යන ප්‍රදේශ වල නව කාර්‍යාල ඉදි කිරීම සඳහා ගරු අමාත්‍යතුමන් අතින් මුල්ගල් තබන ලදී.










එසේම රත්මලාන වැඩබිම, පුත්තලම කාර්යාලය හා අනුරාධපුර සංචාරක නිවාසයෙහි අළුත්වැඩියා කටයුතු සිදුකරනු ලබයි.